සීමාසහිත ලංකා නැව් සංස්ථාව

ශ්‍රී ලංකාවේ ජාතික ප්‍රවාහකයා

(1987 අංක 23 දරණ රාජ්‍ය සංස්ථා සහ රජය සතු ව්‍යාපාරික ආයතන රජයේ සමාගම් බවට පත්කිරීමේ පනත යටතේ 1992.06.01 වන දින සිට සමාගමක් බවට පරිවර්තනය කර ඇත)

වාර්ෂික වාර්තාව

2022 / 2023

සී.ස. ලංකා නැව් සංස්ථාව

වාර්ෂික වාර්තාව සහ ගිණුම්

2022/2023

	පිටු අංකය
පටුන	1
දැක්ම හා මෙහෙවර ප්‍රකාශය	2
පිළිගැන්වීමේ ලිපිය	3
අධ්‍යක්ෂ මණ්ඩලය	4 - 6
කළමණාකරණ කණ්ඩායම	7 - 9
සභාපතිවරයාගේ සමාලෝචනය	10 - 13
අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව	14 - 16
මූල්‍ය ඉස්මතු කිරීම්	17
තිරසාරත්ව වාර්තාව	18 - 25
විගණන කමිටුවේ වාර්තාව	26 - 31
තුති ප්‍රණාමය කාර්ය මණ්ඩලයට ස්තූතිය	32
ස්වාධීන විගණකවරුන්ගේ වාර්තාව	33 - 43
විස්තීර්ණ ආදායම් ප්‍රකාශය	44
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය	45
කොටස් ආයෝජන වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය	46
මුදල් ප්‍රවාහ ප්‍රකාශය	47
මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්	48 - 86
පරිපාලන වියදම්	87 - 88

සී/ස ලංකා නැව් සංස්ථාව

වාර්ෂික වාර්තාව සහ ගිණුම්

2022 / 2023

දැක්ම හා මෙහෙවර ප්‍රකාශය

දැක්ම

දේශය වෙනුවෙන් විශ්වාසය තැබිය හැකි වූ ද, ඵලදායි වූ ද ජාතික නෞකා ඇණියක් ස්ථාපනය කිරීම.

මෙහෙවර

ජාතික නාවික ප්‍රවාහකයා ලෙස අනුබල අවැසි ශ්‍රී ලංකාවේ ආනයන හා අපනයන මෙන්ම දේශීය මුහුදුබඩ වෙළඳාම ආශ්‍රිත සේවා මුහුදින් ප්‍රවාහනය කිරීමේ අවශ්‍යතා සැලසීම.

සී/ස ලංකා නැව් සංස්ථාව

වාර්ෂික වාර්තාව සහ ගිණුම්

2022 / 2023

<u>**පිළිගැන්වීමේ ලිපිය**</u>

ගරු වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යතුමා,
වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශය,
අංක 19, චෛත්‍ය පාර,
කොළඹ 01.

අමාත්‍යතුමනි,

රාජ්‍ය සංස්ථා සහ රජය සතු සමාගම් රාජ්‍ය සමාගම් බවට පරිවර්තනය කිරීම සඳහා වූ 1987 අංක 23 දරන පනතේ සහ 2007 අංක 07 දරන සමාගම් පනතේ විධිවිධාන ප්‍රකාරව 2022.04.01 වන දින සිට 2023.03.31 වන දින දක්වා වූ කාල පරිච්ඡේදය තුළ සමාගමේ ක්‍රියාකාරකම් පිළිබඳ සම්පාදිත වාර්ෂික වාර්තාව හා ගිණුම් ප්‍රකාශය මම මෙයින් ඉදිරිපත් කරමි.

මෙයට විශ්වාසී,
සී/ස ලංකා නැව් සංස්ථාව

ඩබ්ලිව්.එස්. වීරමන්
සභාපති

සී/ස ලංකා නැව් සංස්ථාව
අංක 27,
යෝනක ඉස්ලාමීය සංස්කෘතික මධ්‍යස්ථාන ගොඩනැගිල්ල,
ශ්‍රීමත් රාසික් ෆරීඩ් මාවත,
කොළඹ 01.

දිනය : 2023.08.13

සී/ස ලංකා නැව් සංස්ථාව

වාර්ෂික වාර්තාව සහ ගිණුම්

2022 / 2023

<u>අධ්‍යක්ෂ මණ්ඩලය</u>

<u>2022.04.01 සිට 2023.03.31 දක්වා</u>

ඩබ්ලිව්. එස්. වීරමන් මහතා

සභාපති

2019/12/20 සිට අද දින දක්වා

දිමුත් ජාගොඩආරච්චි මහතා

විධායක අධ්‍යක්ෂ
2020.10.08 දින සිට 2022.05.24 දින දක්වා

එම්. ජී. එන්. ප්‍රේමතිලක මහත්මිය
අධ්‍යක්ෂ / භාණ්ඩාගාර නියෝජිත
2022.03.02 දින සිට අද දින දක්වා

ෂෙහාරා ජයවර්ධන මහත්මිය

අධ්‍යක්ෂ
2020.10.07 දින සිට 2022.05.24 දින දක්වා

භාතිය උඩුමලගල මහතා

අධ්‍යක්ෂ
2020.10.08 දින සිට 2022.05.24 දින දක්වා

රංග ගුණවර්ධන මහතා

අධ්‍යක්ෂ
2020.10.07 දින සිට 2022.05.24 දින දක්වා

මෙවන් පීරිස් මහතා

අධ්‍යක්ෂ
2020.10.08 දින සිට 2022.05.26 දින දක්වා

ජී. යූ. කේ. අල්ගෙවත්ත මහතා
අධ්‍යක්ෂ
2022.06.30 දින සිට අද දින දක්වා

යූ. ඒ. මෙන්ඩිස් මහතා
අධ්‍යක්ෂ
2022.06.30 දින සිට 2022.08.12 දින දක්වා

එච්. ඩී. දේවේන්ද්‍ර මහතා
අධ්‍යක්ෂ
2022.08.26 දින සිට අද දින දක්වා

එස්. ඊ. ඩබ්ලිව්. ගුණසේකර මහතා
අධ්‍යක්ෂ
2022.08.26 දින සිට අද දින දක්වා

සමාගමේ ලේකම්

මල්කාන්ති ගුණසේකර මහත්මිය
වරලත් සංස්ථානික ලේකම්වරුන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජික (ACCS)
කොළඹ විශ්ව විද්‍යාලයේ කම්කරු සබඳතා සහ මානව සම්පත් කළමනාකරණය පිළිබඳ
පශ්චාත් උපාධි ඩිප්ලෝමාධාරී
2017.11.14 දින සිට 2022.12.06 දින දක්වා

ටී. එම්. වී.එල්. මුතුගම මහතා
නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස්
දිවුරුම් කොමසාරිස්
නීතිවේදී උපාධිය (කොළඹ)
2022.12.06 දින සිට අද දින දක්වා

අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්
මල්කාන්ති ගුණසේකර මහත්මිය
වරලත් සංස්ථානික ලේකම්වරුන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජික (ACCS)
කොළඹ විශ්ව විද්‍යාලයේ කම්කරු සබඳතා සහ මානව සම්පත් කළමනාකරණය පිළිබඳ

පශ්චාත් උපාධි ඩිප්ලෝමාධාරී

2022.02.18 දින සිට 2022.10.31 දින දක්වා

එස්. ඒ. එස්. කේ. ජයසේකර මහත්මිය
විද්‍යාවේදී, නීතිඥ (ශ්‍රී ලංකා)
ලන්ඩන් බටහිර විශ්ව විද්‍යාලයේ ජාත්‍යන්තර ව්‍යාපාර හා වාණිජ නීතිය පිළිබඳ විද්‍යාපති උපාධිය
2022.10.31 දින සිට අද දින දක්වා

බැංකුකරුවන්
මහජන බැංකුවේ ආයතනික බැංකු අංශය
ලංකා බැංකුව
කොමර්ෂල් බැංකුව පී.එල්.සී.

විගණකවරුන්

විගණකාධිපති, ජාතික විගණක කාර්යාලය අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල.

අධ්‍යක්‍ෂ මණ්ඩල රැස්වීම්

සමාලෝචිත වර්ෂය තුළ දී අධ්‍යක්‍ෂ මණ්ඩල රැස්වීම් 07 ක් (හතක්) පවත්වන ලදී

ලියාපදිංචි කාර්යාලය

සී/ස ලංකා නැව් සංස්ථාව
අංක 27, යෝනක ඉස්ලාමීය සංස්කෘතික මධ්‍යස්ථාන ගොඩනැගිල්ල, (MICH) ගොඩනැගිල්ල,
ශ්‍රීමත් රසික් ෆරීඩ් මාවත,
කොළඹ 01, ශ්‍රී ලංකාව.

දුරකතනය +94 112328772/3
ෆැක්ස් +94 112449486
විද්‍යුත් තැපැල :- cscl@cscl.lk
වෙබ් අඩවිය :- www.cscl.lk

සී/ස ලංකා නැව් සංස්ථාව
වාර්ෂික වාර්තාව සහ ගිණුම්
2022 / 2023

<u>කළමනාකරණ කණ්ඩායම</u>

වැඩ බලන සාමාන්‍යාධිකාරී - 2022.10.21 සිට
පී. එස්. කේ. වටවල මහතා
විද්‍යාවේදී, රාජ්‍ය කළමනාකරණ ((විශේෂ) ගෞරව, USJP
රාජ්‍ය කළමනාකරණ විද්‍යාපති - ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය
ව්‍යාපාර (ගිණුම්කරණ) විද්‍යාපති - කැළණිය විශ්ව විද්‍යාලය
ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී *ආයතනය (LICA)*

නියෝජ්‍ය සමාන්‍යාධිකාරී (වාණිජ) සහ වැඩබලන සාමාන්‍යාධිකාරී
(2021.08.01 දින සිට 2022.10.20 දින දක්වා)
වයි. එස්. වෙත්තසිංහ මහත්මිය
විද්‍යාවේදී (සාමාන්‍ය)
නාවික කටයුතු කළමනාකරණය පිළිබඳ විද්‍යාපති - ඩබ්ලිව්.එම්.යූ. (මැල්මෝ - ස්වීඩන්)
MILT - එක්සත් රාජධානිය

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (නීති හා රක්ෂණ / මානව සම්පත්)
එස්. ඒ. එස්. කේ. ජයසේකර මහත්මිය
විද්‍යාවේදී, නීතිඥ (ශ්‍රී ලංකා)
ලන්ඩන් බටහිර විශ්ව විද්‍යාලයේ ජාත්‍යන්තර ව්‍යාපාර හා වාණිජ නීතිය පිළිබඳ ශාස්ත්‍ර පති

සහකාර සාමාන්‍යාධිකාරී (මූල්‍ය)
ජී.එම්. විකුම් ප්‍රදීප මහතා
වාණිජ විද්‍යාවේදී (විශේෂ) ගෞරව, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය (LICA)
නාවික කටයුතු කළමනාකරණය පිළිබඳ විද්‍යාපති - ඩබ්ලිව්.එම්.යූ. (මැල්මෝ - ස්වීඩන්)

ගොඩබිම් කටයුතු සඳහා නම් කළ නිලධාරී - 2021.10.21 සිට 2022.10.31 දක්වා
කැප්ටන් එච්. එම්. ඒ. යූ. බී. හේරත් මහතා
මාස්ටර් ප්‍රවීණතා සහතිකය (COC Class I – Unlimited)
වරලත් නැව් බ්‍රෝකර්වරුන්ගේ ආයතනයේ සාමාජිකත්වය - MICS – (එක්සත් රාජධානිය) 2007
උසස් සමුද්‍ර විද්‍යා ඩිප්ලෝමා, CINEC Campus ආයතනය
DPA පාඨමාලාව – DNV සමුද්‍ර විද්‍යායතනය, ඉන්දියාව 2021

ගොඩබිම් කටයුතු සඳහා නම් කළ නිලධාරී - 2022.11.08 සිට
කැප්ටන් ජී. කස්තුරිආරච්චි මහතා
I වන පංතියේ නාවික යාත්‍රාපති (එක්සත් රාජධානිය)
නාවික විද්‍යාව පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව (එක්සත් රාජධානිය)

තාක්ෂණික අධිකාරී - 2021.03.01 සිට 2022.06.21 දක්වා
චාරක වික්‍රමනායක මහතා
වරලත් ඉංජිනේරු - (එක්සත් රාජධානිය)
වරලත් නාවික ඉංජිනේරු - (එක්සත් රාජධානිය)
සංස්ථානික ඉංජිනේරු - ශ්‍රී ලංකා
ප්‍රධාන ඉංජිනේරු නිලධාරී වශයෙන් ප්‍රවීණතා සහතිකය (COC Class I – Unlimited)
නාවික ඉංජිනේරු විද්‍යා සහ තාක්ෂණික ප්‍රවීණතා සහතිකය (IMAREST) (එක්සත් රාජධානිය)
එක්සත් රාජධානියේ AFNI නාවික විද්‍යායතනයේ අධි සාමාජික
රාජකීය නාවික වාස්තු විද්‍යාඥයන්ගේ ආයතනයේ අධි සාමාජික - AMRINA
සංස්ථානික ඉංජිනේරු ආයතනයේ (SL MIIESL) සාමාජික

තාක්ෂණික අධිකාරී - 2022.06.20 සිට
ටෝනි පීරිස් මහතා
I වන පංතියේ ප්‍රවීණතා සහතිකය (මෝටර් නෞකා), එක්සත් රාජධානිය
නාවික ඉංජිනේරු නිලධාරි

අභ්‍යන්තර විගණක (2020.12.20 වන දින සේවයෙන් විශ්‍රාම ගියේ ය.)
වයි. පොන්නම්පෙරුම මහතා
LICA, FMAAT,
නාවික කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා (OSLO)

වැඩ බලන අභ්‍යන්තර විගණක - (2023.01.01 වන දින සිට)
ඩබ්ලිව්. ඒ. අයි. ඩී. පෙරේරා මහත්මිය
වාණිජවේදී (විශේෂ) උපාධිය (UOK)
ව්‍යාපාර පරිපාලන (UOK)
CMA සමත් අවසානික
සහතික ලත් ව්‍යාපාර ගණකාධිකාරි (CA Sri Lanka)

සහකාර සාමාන්‍යාධිකාරි (නැව් කුලීයට දීම සහ එජන්සි සේවා)
අයි. දන්තනාරායන මහතා
විද්‍යාවේදී රාජ්‍ය කළමනාකරණ (විශේෂ) ගෞරව
නාවික කටයුතු පිළිබඳ විද්‍යාපති (මැල්මෝ - ස්විඩන්)
MILT - එක්සත් රාජධානිය, LICA

සහකාර සාමාන්‍යාධිකාරි (ලේඛණකරණය)
කේ. එල්. එම්. මධුරාජා මහතා
වාණිජ විද්‍යාවේදී (විශේෂ) ගෞරව උපාධිය
නාවික කළමනාකරණ විද්‍යාපති - ඩබ්ලිව්.එම්.යූ. (මැල්මෝ - ස්වීඩන්)

සහකාර සාමාන්‍යාධිකාරි (නැව්, භාණ්ඩ හා සේවා සම්පාදන - NVOCC)
එන්.පී. කල්පගේ මහතා
ශාස්ත්‍රවේදී (විශේෂ)
නාවික කළමනාකරණ විද්‍යාපති - ඩබ්ලිව්.එම්.යූ. (මැල්මෝ - ස්වීඩන්)

වැඩබලන කළමනාකාරිනි (මානව සම්පත්) (2018.04.09 සිට 2022.12.31 දක්වා)
මල්කාන්ති ගුණසේකර මහත්මිය
වරලත් සංස්ථානික ලේකම්වරුන්ගේ ආයතනයේ ආශ්‍රය සාමාජික (ACCS)
කම්කරු සබඳතා හා මානව සම්පත් කළමණාකරණ පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාධාරී
කොළඹ විශ්ව විද්‍යාලය

පරිපාලන ප්‍රධානි
එච් . ආර්. එල්. පී. පී. ගුණරත්න මහතා
කළමණාකරණය පිළිබඳ ඩිප්ලෝමාධාරි - විවෘත විශ්ව විද්‍යාලය
ව්‍යාපාරික තොරතුරු ඩිප්ලෝමාධාරී

සී/ස ලංකා නැව් සංස්ථාව
වාර්ෂික වාර්තාව සහ ගිණුම්
2022 / 2023

සභාපතිවරයාගේ සමාලෝචනය

2023 මාර්තු මස 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ සීමා සහිත ලංකා නැව් සංස්ථාවේ වාර්ෂික වාර්තාව සහ එකී සමාගමට අයත් විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශ, ලංකා නැව් සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් මවිසින් ඉදිරිපත් කරනු ලැබ සිටිනුයේ ඉමහත් සතුටිනි.

වියළි තොග නැව් ප්‍රවාහන වෙළඳපොළ

බෝල්ටික් ඩ්‍රයි ඉන්ඩෙක්ස් දර්ශකය වසර පුරා නිරන්තරයෙන් උච්චාවචනය වන බව නිරීක්ෂණය කරනු ලැබ තිබේ. 2022 / 2023 මූල්‍ය වර්ෂය තුළ, වියළි තොග ප්‍රවාහන නැව් සඳහා නෞකා කාල කුලී ගාස්තු ඉහළ ගොස් ඇති අතර, ඒ අනුව, අපගේ නාවික යාත්‍රා දෙක අත්කර ගන්නා ලද නැව් කුලී ගාස්තු සැලකිය යුතු ලෙස වර්ධනය වී ඇත.

නාවික යාත්‍රා යෙදවීම

සාමාන්‍යයෙන්, සී/ස ලංකා නැව් සංස්ථාව සතු යාත්‍රා දෙක වන සිලෝන් බ්‍රීස් සහ සිලෝන් ප්‍රින්සස් යන නෞකා ජාත්‍යන්තර කුලී නැව් වෙළඳපොළ තුළ සේවයේ යොදවනු ලබන්නේ, වාණිජ කළමනාකරණ සමාගමක් යටතේ අප්‍රේල් මස සිට සැප්තැම්බර් මස මැද දක්වා වූ නිරිත දිග මෝසම් කාලය අතරතුර ය. මෙම යාත්‍රා, මෝසම් නොවන කාල සීමාව තුළ දකුණු අප්‍රිකාවේ RBCT ගල් අඟුරු පර්යන්තයේ සිට පුත්තලම පිහිටි ලක්විජය බලාගාරය දක්වා ගල් අඟුරු ප්‍රවාහන සේවයෙහි යෙදෙමින් ජාතික විදුලිබල උත්පාදනයට දායක වේ.

එසේ වුවද, සී/ස ලංකා නැව් සංස්ථාව සතු යාත්‍රා දෙකම, මෙම මූල්‍ය වර්ෂය තුළ ජාත්‍යන්තර තරඟකාරී ලංසු කැඳවීමේ ක්‍රියාවලිය හරහා තෝරාගත් විභව නැව් කුලීකරුවෙකු සමඟ වාණිජ කළමනාකරණ ගිවිසුමක් යටතේ ගෝලීය නැව් කුලී වෙළඳපොළෙහි සේවයේ යොදවන ලදී. යාත්‍රාවලින් අපේක්ෂිත නැව් භාණ්ඩ ප්‍රවාහන ආදායමට වඩා ඉහළ ප්‍රතිලාභයක් ලැබීමත්, ඒ වන විට දියත්වෙමින් පැවති ගල් අඟුරු ටෙන්ඩරයේ පවතින අවිනිශ්චිතභාවයත් යන කරුණු හේතුවෙන් මෙම තීරණය ඒ සම්බන්ධයෙන් ගන්නා ලදී.

ඒ අනුව, සිලෝන් බ්‍රීස් නෞකාව, දිනකට ඇ.එ.ජ. ඩොලර් 21,221.37 ක සාමාන්‍ය නැව් කුලී ගාස්තු අනුපාතයකට කුලියට ලබා දී ඇති අතර සිලෝන් ප්‍රින්සස් නෞකාව, දිනකට ඇ.එ.ජ. ඩොලර් 23,266.67 ක සාමාන්‍ය නැව් කුලී ගාස්තු අනුපාතයක් මත කුලියට සපයා දී ඇත.

රාජ්‍ය අංශයේ ආනයන

රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛ අංක 415 යටතේ, රාජ්‍ය අංශයේ භාණ්ඩ ප්‍රවාහනය කිරීමේ බලය සී/ස ලංකා නැව් සංස්ථාව සතු වේ.

ඒ අනුව, සී/ස ලංකා නැව් සංස්ථාව විසින් ඉඩ පහසුකම් මත කුලියට නැව් සැපයීමේ පදනම යටතේ සහ මුහුදු ගමන් මත කුලියට නැව් සැපයීමේ පදනම යටතේ, තෙවන පාර්ශව නැව් යොදවා ගැනීම මගින් බහාලුම් භාණ්ඩ, රථ වාහන, විසිරි තොග භාණ්ඩ සහ බර භාණ්ඩ එසවුම් යනාදී බඩු භාණ්ඩ ලොව පුරා ගමනාන්ත කරා හසුරුවන ලදී.

එමෙන්ම, රජයේ ආයතන සඳහා ජීප් රථ 500 ක් සහ බස් රථ 500ක් ආනයනය කිරීමේ නව ව්‍යාපාරික අවස්ථා මෙම මූල්‍ය වසරේ 3 වැනි කාර්තුව වන විට සී/ස ලංකා නැව් සංස්ථාව හරහා හසුරුවන බවට ද තහවුරු කරනු ලැබ තිබේ.

භාණ්ඩ සැපයුම් සේවා

නැව් බඩු නිෂ්කාශනය සහ ප්‍රවාහනය කර භාර දීමේ ව්‍යාපාරය ඉතා තරඟකාරී වුව ද, සී/ස ලංකා නැව් සංස්ථාව, මෙම අංශය තුළ සැලකිය යුතු ප්‍රගතියක් ලබා ඇත. සී/ස ලංකා නැව් සංස්ථාව, මෙම සේවාවන් රාජ්‍ය අංශයට මෙන්ම පුද්ගලික අංශයේ ගනුදෙනුකාර සේවාදායකයන් සඳහා ද ලබා දෙයි. බහු මාදිලියෙන් යුත් ප්‍රවාහන සංකල්පයේ ආගමනයත් සමඟම, සැපයුම් දාමය කාර්යක්ෂමව කළමනාකරණය කිරීම විෂයයෙහි භාණ්ඩ ප්‍රේෂණය කරන්නන් සහ භාණ්ඩ ප්‍රේෂණලාභීන් අතර තරඟයක් ඇති කර ඇති අතර නැව් බඩු ඇසුරුම් කිරීම, ලේබල් කිරීම, පිරවුම් කිරීම, තදින් බැඳ ඇසිරීම, රේගු නිෂ්කාශනය සහ භාණ්ඩ බෙදා හැර භාරදීම හා ඒවා ධූමකරණය යනාදී විවිධ සැපයුම් සේවා සඳහා සී/ස ලංකා නැව් සංස්ථාව දක්ෂ හා ප්‍රවීණ ලියාපදිංචි සේවා සපයන්නන්ගේ ජාලයක් සමඟ එක්ව කටයුතු කරයි.

මූල්‍ය කාර්ය සාධනය

2021 / 2022 මූල්‍ය වර්ෂයට සාපේක්ෂව, රු. මිලියන 3900.68 ක් වූ මෙහෙයුම් ලාභයක් සහිත 77.24% ක ප්‍රමාණයකින් ඉහළ ගිය සතුටුදායක මට්ටමේ වර්ධනයක් සී/ස ලංකා නැව් සංස්ථාව ලබා ඇත. කෙසේ වෙතත්, 2022 / 2023 වර්ෂයේ දී මූල්‍ය වියදම් (එනම්, මහජන බැංකු ණය පොලී සහ ණය විනිමය අලාභය) රු. මිලියන 4381.84 ක් ලෙස වාර්තා වී ඇති අතර, එය, පෙර මුදල් වර්ෂයට සාපේක්ෂව 36.64% ක් වූ ප්‍රමාණයේ අඩුවීමක් වූයේ ය.

2022 / 23 වසර තුළ, රු. මිලියන 6649.45 ක් වූ මුළු ආදායමක් අත්කර ගැනීමට සී/ස ලංකා නැව් සංස්ථාව සමත් විය. එය, පෙර වසර වූ 2021 / 2022 හා සසඳන විට, ආසන්න වශයෙන් 15.58% ක අඩු වීමකි. මීට අමතරව, 2022 / 2023 වසර තුළ දී ඍජු මෙහෙයුම් වියදම් වශයෙන් රු. මිලියන 3253.91 ක මුදල් ප්‍රමාණයක් වාර්තා වූ අතර, එම ප්‍රමාණය, 2021 / 2022 වසර තුළ රු. මිලියන 5706.57 ක් වූයේ ය. එබැවින්, මෙම වසර තුළ ඍජු මෙහෙයුම් වියදම් ද සංසන්දනාත්මකව 43% ක් පමණ වූ ප්‍රමාණයකින් අඩු වී ඇත.

ලංකා නැව් සංස්ථාවේ නාවික යාත්‍රා මෙහෙයුම් කටයුතුවලින් ලැබූ ආදායම

පසුගිය මූල්‍ය වර්ෂය හා සංසන්දනාත්මකව සලකන කළ, සී/ස ලංකා නැව් සංස්ථාව සතු යාත්‍රා දෙක ජාත්‍යන්තර කුලී නැව් වෙළඳපොළ තුළ සේවයේ යෙදවීම මගින් 2022 / 23 වසර තුළ දී 79.19% ක් වූ දළ ආදායම් වැඩිවීමක් සනිටුහන් කර ගැනීමට සංස්ථාව සමත්ව තිබේ.

තුන්වන පාර්ශව යාත්‍රාවල ගල් අඟුරු මෙහෙයුම්වලින් සහ සැහැල්ලු යාත්‍රා මෙහෙයුම්වලින් ලද ඒජන්සි කොමිස් මුදල් සහ නැව් ඇමතුම් කොමිස් මුදල් හරහා උපයන ආදායම, 2022 / 23 මූල්‍ය වසර තුළ 7.27% කින් අඩුවී ඇත.

සමාගම සතු නෞකා මෙහෙයුම් කටයුතු මගින් ලැබූ ආදායම, මෙම වර්ෂය තුළ ලද එහි මුළු ආදායමෙන් 80.25% ක් වූ ප්‍රමාණයක් ලෙස වාර්තා විය.

නෞකාමය නොවන පොදු ප්‍රවාහන (NVOCC) සේවාවන් තුළින් ලද ආදායම

නෞකාමය නොවන පොදු ප්‍රවාහන (NVOCC) මෙහෙයුම් වලින් උපයාගත් ආදායම, 2022 / 23 මූල්‍ය වර්ෂයේ දී රුපියල් මිලියන 1802.12 ක් වූ ප්‍රමාණයේ සිට රුපියල් මිලියන රු.මි. 878.67 ක් දක්වා අඩුවී ඇත. විශේෂ භාණ්ඩ නැව්ගත කිරීම් මෙහෙයුම් කටයුතු හේතුවෙන්, 2021 / 22 මූල්‍ය වර්ෂය තුළ ආදායම වැඩිවීමක් සිදු වී ඇති අතර, ඒ අනුව, එකී මෙහෙයුම් තුළ, මෙම වසර තුළ ආදායමේ 51% ක සංසන්දනාත්මක අඩුවීමක් පෙන්නුම් කරයි.

ලෝක දේශපාලන වටපිටාවේ නොසන්සුන්තාව, විදේශ විනිමය හිඟය, දැඩි මූල්‍ය ප්‍රතිපත්ති හා ආර්ථික හැකිලීම යනාදිය හේතුවෙන් රජයේ ආයතන සිය සුපුරුදු ආනයනික නැව්ගත කිරීම් ඇණවුම් කර නොමැති අතර බොහෝ ආයතන 2022 / 23 වසර තුළ ඔවුන්ගේ විශේෂ භාණ්ඩ නැව්ගත කිරීම් ස්ථාවරව තහවුරු කර නොමැත. කෙසේ වෙතත්, 2022 / 23 වර්ෂයේ අවසන් මාස 04 ක කාලය තුළ, Ro/Ro යාත්‍රා මගින් දොඹකර නැව්ගත කිරීම් සහ බස් රථ 349ක් ප්‍රවාහනය කර දීමට සී/ස ලංකා නැව් සංස්ථාව සමත් වීම හේතුවෙන් අදාළ විසිරි බඩු තොග (B/B) පරිමාව සැලකිය යුතු ලෙස වැඩි විය.

භාණ්ඩ සැපයුම් සේවාවලින් ලද ආදායම

ලොජිස්ටික්ස් හෙවත් භාණ්ඩ සැපයුම් ආශ්‍රිත මෙහෙයුම්වලින් 2022 / 23 මූල්‍ය වර්ෂයේ දී උපයා ගත් ආදායම රු. මිලියන 70.53 ක් වූ අතර එය, පෙර මූල්‍ය වර්ෂයට සාපේක්ෂව 288% ක වැඩිවීමකි. එම තත්ත්වය, වසරේ 3 වන කාර්තුවේ දී සහ ඉන් ඉදිරි කාලවල දී දියත් කරන ලද දැඩි අලෙවිකරණ ක්‍රියාදාමයන් තුළින් සී/ස ලංකා නැව් සංස්ථාව වෙත හිමි වූ නව ව්‍යාපාරික අවස්ථාවල ප්‍රතිඵලයකි. එම ක්‍රියාමාර්ගය කරණකොට ගෙන, මෙම නව නැව් ප්‍රේෂණ තොග මෙහෙයුම්වල, එනම් - නිල ඇඳුම්, කඩදාසි, සහල්, අමතර කොටස්, ආලේපිත කඩදාසි පුවරු සහ තහඩු, බලශක්ති මැණුම් මීටර හා පුද්ගලික ගමන් මලු යනාදියෙහි ප්‍රවාහන මෙහෙයුම්වල හැසිරවීමේ කටයුතු ඉටු කිරීමට සී/ස ලංකා නැව් සංස්ථාවට හැකි විය.

ව්‍යවහාර මුදලේ අගය පහත වැටීම

එක්සත් ජනපද ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණය වීම පසුගිය වසර කීපය තුළ සමාගමට අහිතකර ලෙස බලපෑවේ ය. එය 2022 / 23 මූල්‍ය වර්ෂයේ දී 12.38% කින් ඉහළ ගොස් ඇත. යාත්‍රා මත පවත්නා ණය ප්‍රමාණයට ගණනය කෙරෙන ඉන් උද්ගත වන විනිමය පාඩුව වන රු. මිලියන 2,811.89 ක මුදල විෂයයෙහි ඍජු අහිතකර බලපෑමක් සංස්ථාව වෙත එල්ල වේ. එමෙන්ම එය, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව වාර්ෂික ගිණුම්වල ද දැක්විය යුතු අනිවාර්ය ප්‍රතිපාදනයකි.

කෙසේ වුවද, අදාළ ණය ප්‍රාග්ධන කොටසට අයත් රු. මිලියන 2092 ක් වූ මුදල් ප්‍රමාණයක් සහ යාත්‍රා දෙක ඉදිකිරීම සඳහා ණයට ගත් ණය මුදලේ පොලී වාරිකවලින් රු. මිලියන 736 ක් වූ මුදල් ප්‍රමාණයක්, 2023.03.31 දින වන විට ගෙවා අවසන් කිරීමට සී/ස ලංකා නැව් සංස්ථාව සමත්ව ඇත.

තවද, අඩු වූ විනිමය අලාභය සහ නියමිත ණය පොලී ගෙවීම හේතුවෙන් 2022 / 23 වර්ෂයේ දී රු. මි. රු. 624.91 ක අලාභයක් සටහන් වූ අතර සී/ස ලංකා නැව් සංස්ථාවට පසුගිය වසරට සාපේක්ෂව ප්‍රවර්තන වර්ෂයේ අලාභය අඩු කර ගැනීමට හැකි වූ අතර එය, බදු පසු අලාභය වූ රු. මි. 4567.79 ක ප්‍රමාණයක් වූයේ ය.

<u>සේවක සේවිකාවන් පිරිස</u>

2023.03.31 දිනට සමාගමේ මුළු (ස්ථිර සේවක සංඛ්‍යාව) සේවක සංඛ්‍යාව 105 ක් වූ අතර, 2022 / 2023 වර්ෂයේ දී වැටුප් හා වේතන සඳහා වූ වියදම රු. මිලියන 142.58 ක් වූයේ ය. 2022 / 2023 වර්ෂයේ දී පරිපාලන වියදම් රු. මිලියන 246.34 ක් ලෙස පැවති අතර, එය, 2021 / 2022 වසර හා සසඳන කළ ආසන්න වශයෙන් 6.66% ක ප්‍රමාණයේ අඩුවීමක් පෙන්නුම් කරයි.

සී/ස ලංකා නැව් සංස්ථාවෙහි මෙහෙයුම් කටයුතු වෘත්තීයමය ආකාරයෙන් සහ නාවික ක්ෂේත්‍රයේ තාක්ෂණික වර්ධනයන්ට අනුකූලව ඉටු කිරීම සඳහා මනා පළපුරුද්දක් හා පුහුණුවක් ලත් සහ සුදුසුකම් සහිත කාර්ය මණ්ඩලයක් සිටීමේ අවශ්‍යතාවය හඳුනා ගෙන ඇත.

එබැවින්, සී/ස ලංකා නැව් සංස්ථාව විසින් කාර්ය මණ්ඩල පුහුණු අරමුණු සඳහා වාර්ෂිකව රු. මිලියන 2.0 ක මුදලක් වෙන් කරන අතර, ඉන් රු. මිලියන 0.21ක මුදලක් කාර්ය මණ්ඩල සාමාජිකයන් 12 දෙනෙකු විවිධ නැව් කටයුතු සහ මූල්‍ය වැඩසටහන් ආශ්‍රිතව පුහුණු කිරීම සඳහා 2022 / 23 වර්ෂයේ දී වියදම් කරනු ලැබ තිබේ.

අවසාන වශයෙන්, සංස්ථා අධ්‍යක්ෂ මණ්ඩලය, අපගේ රේඛීය අමාත්‍යාංශය, අපගේ සියලුම ගනුදෙනුකරුවන්, ව්‍යාපාරික හවුල්කරුවන්, නියෝජිත ඒජන්තවරුන් සහ අනෙකුත් සියලුම පාර්ශ්වකරුවන් සී/ස ලංකා නැව් සංස්ථාව වෙත වසර පුරා ලබා දෙන අඛණ්ඩ අනුබලය සහ සහයෝගිතාව අගය කරමින් ඒ වෙනුවෙන් මගේ තුති ප්‍රණාමය පුද කිරීමට මම මෙය අවස්ථාවක් කර ගන්නා අතර, ඔවුන්ගේ වැඩිමනත් හවුල්කාරිත්වය සහ අනුග්‍රහය ඉදිරි වර්ෂය තුළදීත් අපේක්ෂා කරන්නෙමි.



ඩබ්ලිව්. එස්. වීරමන්
සභාපති

කොළඹ දී,
2023 අගෝස්තු මස 13 වන දින.

සී/ස ලංකා නැව් සංස්ථාව
වාර්ෂික වාර්තාව සහ ගිණුම්
2022 / 2023

සමාගමේ කටයුතු පිළිබඳව
අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව

2023 මාර්තු මස 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ සමාගමේ විගණිත ගිණුම් සහිත වාර්තාව එහි වාර්ෂික මහා සභා රැස්වීමේ දී සභාගත කිරීම පිණිස සී/ස ලංකා නැව් සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙහිලා සතුටින් ඉදිරිපත් කර සිටී.

වාර්ෂීය සමාලෝචනය

ප්‍රවර්තන මූල්‍ය වර්ෂය තුළ සහ මෙම වාර්තාවේ දිනය දක්වා කාලය තුළ සමාගමේ කටයුතු, සමාගම විසින් ඉදිරි කාලය තුළ දී මුහුණ දෙනු ලබන අභියෝගයන් ද ඇතුළුව, සභාපතිවරයාගේ සමාලෝචනය යටතේ විස්තර කෙරේ. විගණනිත මූල්‍ය ප්‍රකාශ සහිත මෙම වාර්තාව තුළින් පිලිබිඹු වන්නේ, සමාගමේ කටයුතුවල තත්වයයි.

ප්‍රධාන ක්‍රියාකාරකම් / ප්‍රමුඛ ව්‍යාපාරික කටයුතු

ශ්‍රී ලංකා ධජය යටතේ ක්‍රියාත්මක ජාතික නාවික ප්‍රවාහකයා වන්නේ, සී/ස ලංකා නැව් සංස්ථාවයි. සමාගමේ ප්‍රධාන කටයුතු ලෙස ගැනෙන්නේ, නැව් බඩු මුහුදු මගින් ප්‍රවාහනය කිරීම, ඒවා ඒ ඒ අදාළ ස්ථාන දක්වා ගෙන ගොස් බෙදාහැර භාරදීම, ප්‍රවාහනය සඳහා නැව් බඩු රැස්කර ගැනීම, ශ්‍රී ලාංකික තානාපති කාර්ය මණ්ඩලයන්හි ගෘහස්ථ හා පෞද්ගලික බඩු බාහිරාදිය එක් එක් රටවල් කරා ගෙනයාම, නියෝජිත ආයතනයක් ලෙස රේගුව කටයුතු කිරීම, නාවික නියෝජිත ඒජන්ත සේවා කටයුතු, නැව් හිමිකරුවන්, කළමනාකරුවන්, මෙහෙයුම්කරුවන් හා නැව් කුලියට දෙන තැනැත්තන් සමග කටයුතු කිරීම යනාදියයි.

සී/ස ලංකා නැව් සංස්ථාව බහාලුම්ගත ද්‍රව්‍ය, විසිරි තොග, ගල් අඟුරු තොග, රථ වාහන, ව්‍යාපෘති සඳහා වූ නැව් බඩු සහ අධි බරැති භාණ්ඩ වැනි සියලු ආකාරයේ නැව් භාණ්ඩ ප්‍රවාහනය කිරීමෙහි නිරත වේ.

ඉහත දැක්වූ කරුණුවලට අමතරව, මුහුදු යාත්‍රිකයන් හට නෞකාවක ස්ථානගතව සිට කෙරෙන පුහුණු කටයුතු සලසා දෙමින්, සී/ස ලංකා නැව් සංස්ථාව ජාතික සාගර තරණ පුහුණු ක්‍රියාදාමය කෙරෙහි ස්වකීය දායකත්වය ලබා දේ.

මූල්‍ය ප්‍රකාශ

2007 අංක 07 දරන සමාගම් පනතේ 151 වන වගන්තියේ නියමයන් කෙරෙහි අනුකූලතාව දක්වමින්, මෙම වාර්ෂික වාර්තාව පිළියෙළ කරනු ලැබ ඇත.

ස්වාධීන විගණකවරුන්ගේ වාර්තාව

සී/ස ලංකා නැව් සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශ පිළිබඳ විගණකවරුන්ගේ වාර්තාව, මෙම වාර්තාවෙහි ඇතුළත් වේ.

ආශ්‍රිත පාර්ශව ගනුදෙනු

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවල (LKAS 24) දක්වා ඇති නිර්ණායකවලට අනුකූලව, ආශ්‍රිත පාර්ශව හඳුනා ගැනේ. අංක 35 වන සටහන හැරුනු විට, වාර්ෂික වාර්තාවේ අනාවරණය කර ඇති පරිදි ආශ්‍රිත පාර්ශව සම්බන්ධයෙන් සමාලෝචනයට ලක්වන කාලසීමාව තුළ වඩාත් හිතකර හෝ අනුග්‍රහිත වූ සම්බන්ධිත පාර්ශව කිසිවකු සමඟ කිසිදු ආකාරයේ ගනුදෙනුවක් සිදු වී නොමැත.

ගිණුම් ප්‍රතිපත්ති හා පැහැදිලි කිරීමේ සටහන්

සමාලෝචනයට අදාළ මූල්‍ය වර්ෂය තුළ දී සමාගම විසින් අනුගමනය කරන ලද ගිණුම් ප්‍රතිපත්තිවල වෙනස්කම් කිසිවක් නොවී ය. මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කිරීමේ දී භාවිතා කරන ලද ගිණුම් ප්‍රතිපත්ති සහ පැහැදිලි කිරීමේ සටහන් ඒවායෙහි අදාළ පරිදි ඇතුළත් කර ඇත.

මූල්‍ය ප්‍රතිඵල / ලාභ සහ විසර්ජන

සී/ස ලංකා නැව් සංස්ථාවේ **මූල්‍ය ප්‍රතිඵල / ලාභ සහ විසර්ජන** මෙම වාර්තාවෙහි විස්තීර්ණ ආදායම් ප්‍රකාශයෙහි දක්වා ඇත

දේපළ, පිරියත හා උපකරණ

සමාලෝචනයට හසුවන වර්ෂය තුළ දී, සමාගම රු. මිලියන 243 ක මුදල් ප්‍රමාණයක් දේපළ, පිරියත හා උපකරණ යන විෂයන්හි ආයෝජනය කොට ඇත.

අදාළ වර්ෂය තුළ දී දේපළ, පිරියත හා උපකරණ යන විෂයන්හි සිදු කළ ආයෝජන සංචලනය, මූල්‍ය ප්‍රකාශවලට කෙරෙන සටහන් අංක 10 මගින් දක්වා ඇත.

ආයෝජන

මූල්‍ය ප්‍රකාශ සඳහා වූ සටහන් අංක 13, 14, 15 සහ 16 මගින් 2023 මාර්තු මස 31 වන දිනට සමාගම සතු දිගු කාලීන ආයෝජන පිළිබඳ විස්තර කර දැක්වේ.

ලාභාංශ

2023 මාර්තු මස 31 වන දිනෙන් අවසන් මූල්‍ය වර්ෂය සඳහා ලාභාංශ ගෙවීමක් අධ්‍යක්ෂ මණ්ඩලය නිර්දේශ නොකරයි.

ප්‍රකාශිත ප්‍රාග්ධනය

2007 අංක 07 දරන සමාගම් පනතේ නියමයන් ප්‍රකාරව, 2023 මාර්තු මස 31 වන දිනට සමාගමේ ප්‍රකාශිත ප්‍රාග්ධනය රු. 50,000,000.00 ක් වේ. මූල්‍ය ප්‍රකාශ සඳහා වූ සටහන් අංක 23 හි ඊට අදාළ විස්තර දැක්වේ.

අසම්භාව්‍ය බැරකම්

අසම්භාව්‍ය බැරකම් පිළිබඳ විස්තර, මූල්‍ය ප්‍රකාශ සඳහා වූ සටහන් අංක 34 හි හෙළිදරව් කර ඇත.

ශේෂ පත්‍රයෙන් පසු සිදුවීම්

මූල්‍ය ප්‍රකාශවලට කෙරෙන සටහන් අංක 36 හි සඳහන් කර ඇති කරුණු හැරුනු විට, ශේෂ පත්‍ර දිනයෙන් පසු මූල්‍ය ප්‍රකාශනවල ගැළපීම් අවශ්‍ය වන හෝ හෙළිදරව් කිරීම් අවශ්‍ය වන ප්‍රමාණාත්මක සිදුවීම් කිසිවක් නොවී ය.

<u>මණ්ඩලීය අනු කමිටු</u>

<u>විගණන කමිටුව</u>

අධ්‍යක්ෂවරයාගේ නම :
එම්. ජී. එන්. ප්‍රේමතිලක මහත්මිය (සභාපතිනි)
ජී. යූ. කේ. අල්ගෙවත්තගේ මහතා
එමල් ගුණසේකර මහතා

ප්‍රධාන අභ්‍යන්තර විගණක, වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශය
එන්. ඒ. එච්. කේ. විජේරත්න මහත්මිය

<u>අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමිකය</u>

2023 මාර්තු මස 31 වන දිනට අවසන් මූල්‍ය වර්ෂය තුළ, රු. 488,500/- ක මුදලක් (2021 / 2022 - රු. 596,050/-) අධ්‍යක්ෂවරුන්ගේ ගාස්තු ලෙස ගෙවා ඇත.

<u>ව්‍යාපාරයේ අඛණ්ඩ පැවැත්ම</u>

අධ්‍යක්ෂවරුන් විසින් සමාගමේ ව්‍යාපාර සැලසුම් සමාලෝචනය කරනු ලැබ ඇති අතර, පූර්වේක්ෂ්‍ය අනාගතය සඳහා සමාගමේ අඛණ්ඩ ව්‍යාපාරික පැවැත්ම විෂයයෙහි සමාගම සතුව ප්‍රමාණවත් සම්පත් ඇති බවට ඔවුහු සෑහීමට පත් වන්නාහ. එහෙයින්, සීමාසහිත ලංකා නැව් සංස්ථාව සඳහා මූල්‍ය ප්‍රකාශය පිළියෙළ කරනු ලබනුයේ, ඒ පදනම මත පිහිටායි.

<u>ව්‍යවස්ථාපිත ගෙවීම්</u>

අධ්‍යක්ෂවරුන් ඔවුන්ගේ උපරිම දැනුම සහ විශ්වාසය අනුව, රජය වෙත සහ සමාගමට අයත් සේවක සේවිකාවන් වෙත කළ යුතු සියලු ව්‍යවස්ථාපිත මූල්‍ය බැඳීම් නිසි පරිදි ගෙවා ඇති බවට හෝ ඒ සඳහා මූල්‍ය ප්‍රකාශවල ප්‍රමාණවත් ලෙස ප්‍රතිපාදන සපයා ඇති බවට සෑහීමට පත්වේ.
අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඩබ්ලිව්. එස්. වීරමන්
සභාපති

ජී. යූ. කේ. ඇල්ගෙවත්තගේ
අධ්‍යක්ෂ

ටී. එම්. වී. එල්. මුතුගම
සමාගම් ලේකම්
කොළඹ දී, 2023 අගෝස්තු මස 13 වන දින.

2013 /14 සිට 2022 /23 දක්වා වූ වර්ෂ සඳහා සී/ස ලංකා නැව් ස◌ංස්ථාවේ සුවිශේෂී මූල්‍ය සිදුවීම් රු. මිලියන

කාර්යකරණය	2013/14	2014/15	2015/16	2016/17	2017/18	2018/19	2019/20	2020/21	2021/22	2022/23
මුළු ආදායම	527	623	617	2,541	2,499	3,053	3,849	3,095	7,877	6,649
සෘජු මෙහෙයුම් වියදම්	(237)	(135)	(261)	(1,601)	(1,665)	(2,076)	(2,637)	(2,043)	(5,707)	(3,254)
දළ ලාභය	290	488	356	940	834	977	1,212	1,052	2,170	3,395
වෙනත් ආදායම්	196	69	66	183	257	237	118	230	472	835
පරිපාලන වියදම්	(163)	(190)	(185)	(210)	(220)	(221)	(217)	(216)	(264)	(246)
වත්කම් දුබලත්වයට පත්වීම	(29)	(139)	(51)	(42)	(60)	(133)	(268)	(162)	(177)	(84)
මෙහෙයුම්වලින් ලාභය	294	228	186	871	811	860	845	904	2,201	3,900
පොලී වියදම් - යාත්‍රා ණය	-	-	(41)	(652)	(767)	(930)	(942)	(757)	(728)	(1,570)
ආදායම් බද්දට හා විනිමය අලාභයට පෙර ලාභය / (අලාභය)	294	228	145	219	44	(70)	(97)	147	1,473	2,330
විනිමය අලාභය	-	-	(37)	(502)	(294)	(1,488)	(1,010)	(684)	(6,081)	(2,811)
ආශ්‍රිතයන්ගේ ලාභ කොටස	15	12	16	13	17	35	22	10	40	47
ආදායම් බද්දට පෙර ලාභය / (අලාභය)	309	240	124	(270)	(233)	(1,523)	(1,085)	(527)	(4,568)	(434)
වර්ෂය සඳහා ආදායම් බද්ද	(59)	(115)	(10)	(7)	(12)	-	-	-	-	(191)
ආදායම් බද්දට පසු ලාභය / (අලාභය)	250	125	114	(277)	(245)	(1,523)	(1,085)	(527)	(4,568)	(625)
වර්ෂය සඳහා විලම්බිත බදු ගැළපුම	-	-	(40)	40	69	420	(69)	(286)	(1,197)	(1,232)
ආදායම් බද්ද සහ විලම්බිත බදු ගැළපුමෙන් පසු ලාභය / (අලාභය)	250	125	74	(237)	(176)	(1,103)	(1,154)	(813)	(5,765)	(1,857)

ප්‍රධාන දර්ශක	2013/14	2014/15	2015/16	2016/17	2017/18	2018/19	2019/20	2020/21	2021/22	2022/23
දළ ලාභ ආන්තිකය	55%	78%	58%	37%	33%	32%	31%	34%	28%	51%
මූලික හා තනුකගත ඉපැයුම්, එක් කොටසක් අනුව	50	25	15	(47)	(49)	(305)	(217)	(105)	(914)	(125)
ප්‍රවර්තන අනුපාතය	2.04	2.08	1.07	0.91	1.05	1.23	1.27	1.15	0.90	0.81
මුළු සාමාන්‍ය කොටස් ගණන	1,209	1,329	1,393	1,145	1,029	(56)	(1,275)	(2,042)	(7,914)	(9,210)
මුළු වත්කම්	2,132	7,090	11,034	13,629	13,792	13,672	13,730	12,093	12,471	13,137

සී/ස ලංකා නැව් සංස්ථාව
වාර්ෂික වාර්තාව සහ ගිණුම්
2022 / 2023

තිරසාරත්වය පිළිබඳ වාර්තාව

කොළඹ 01 හි පිහිටි සී/ස ලංකා නැව් සංස්ථාව විසින් වසර තුනක් තිස්සේ අඛණ්ඩව පළ කරමින් ආ තිරසාරත්වය පිළිබඳ ස්වකීය වාර්තාව සිව්වන වරටත් 2022/23 වර්ෂය සඳහා ද එළිදක්වා ඇත. ''ඉදිරි අනාගතය සඳහා තිරසාරත්වය පවත්වා ගැනීමේ අවශ්‍යතාව'' යන මැයෙන් නම් කරන ලද මෙම වාර්තාව තුළින්, කල් පවත්නා ලෙස තිරසර අයුරින් ව්‍යාපාරයක් මෙහෙයවනු ලැබීමේ කාර්යයෙහිලා ලංකා නැව් සංස්ථාවේ කැපවීම සනිටුහන් කර දක්වා ඇත.

ජාත්‍යන්තර සාමුද්‍රීය සංවිධාන (IMO) ලේකම් කාර්යාලයේ අංක C 122/3(a)/1 දරන පත්‍රිකාව මගින්, තිරසාර සංවර්ධනය සඳහා වූ 2030 න්‍යාය පත්රය (IMO තිරසාර සංවර්ධන ඉලක්ක සම්බන්ධයෙන් වූ උපායමාර්ගය) ක්‍රියාත්මක කිරීමේ දී, සාමාජික රටවලට තවදුරටත් සහාය වනු පිණිස උද්ගතව එන ගැටලු හඳුනා ගැනීමට, විශ්ලේෂණය කිරීමට සහ ඒවා ආමන්ත්‍රණය කිරීමට කටයුතු කරයි.

සුරක්ෂිත, නිරුපද්‍රිත, පිරිසිදු සහ කාර්යක්ෂම මුහුදු ප්‍රවාහනය සඳහා ගෝලීය සම්මතයන් හා ප්‍රමිතීන් විෂයයෙහි වගකිව යුතු එක්සත් ජාතීන්ගේ විශේෂිත ආයතනයක් ලෙස, ජාත්‍යන්තර සාමුද්‍රීය සංවිධානය (IMO), ස්වකීය 2030 න්‍යාය පත්‍රය සාක්ෂාත් කර ගැනීම උදෙසා තම සාමාජික රටවලට අනුබල සැලසීමෙහිලා වැදගත් කාර්ය භාරයක් ඉටු කරයි.

ජාත්‍යන්තර සාමුද්‍රීය සංවිධානය (IMO), ස්වකීය 2030 න්‍යාය පත්රය වෙනුවෙන් සක්‍රියව කටයුතු කරන අතර තිරසාර සංවර්ධනය ක්‍රියාවට නැංවිය හැකි ජාත්‍යන්තර නාවික කටයුතු සඳහා වන ව්‍යවස්ථාමය කාර්ය රාමුවක් සැපයීම සහ නිශ්චිත ධාරිතා වර්ධනය ගොඩනැගීමේ ක්‍රියාකාරකම්හි නිරත වීම යන විධිද්වය ඔස්සේ අදාළ තිරසර සංවර්ධන ඉලක්ක ක්‍රියාත්මක කර සපුරා ගනු පිණිස දායකත්වය සලසා දේ.

ජාත්‍යන්තර සාමුද්‍රීය සංවිධානය (IMO), සමස්තයක් ලෙස, 2030 න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කිරීම උදෙසා සහාය දෙන අතර, ජාත්‍යන්තර සාමුද්‍රීය සංවිධානය සිය තිරසර සංවර්ධන ඉලක්ක ආශ්‍රිත උපාය මාර්ගයට අදාළ කාර්ය භාරය තුළ වැඩි බලපෑමක් සහිත ක්ෂේත්‍ර ලෙස, තිරසර සංවර්ධන ඉලක්ක අංක 14 (ජලය තුළ ජීවිතය), සංවර්ධන ඉලක්ක අංක 13 (දේශගුණික විපර්යාස), සංවර්ධන ඉලක්ක අංක 9 (කර්මාන්තය, නවෝත්පාදනය සහ යටිතල පහසුකම්), සංවර්ධන ඉලක්ක අංක 5 (ස්ත්‍රී පුරුෂ සමාජ සමානාත්මතාව) සහ විස්තීර්ණ සංවර්ධන ඉලක්ක අංක 17 (හවුල්කාරිත්ව සහ සම්පත් බලමුලු ගැන්වීම) යන අංශ හඳුනා ගෙන ඇත.

ශ්‍රී ලංකාව 2019 පාස්කු ප්‍රහාරයට ද, කොවිඩ් - 19 වසංගතයට ද මුහුණ දී, වර්තමානය වන විට විදේශ ණය සහ දැඩි ආර්ථික අර්බුදයකට ද ලක්ව උද්ගතව ඇති පසුබෑම් මධ්‍යයේ වුව ද, රටේ 2030 න්‍යාය පත්රය ආශ්‍රිත වගකීම් ඉටු කිරීම සඳහා වන ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග, ජාතික සහ උප ජාතික මට්ටමින් ක්‍රියාත්මක කිරීම අඛණ්ඩව සිදු විය. මෙම කාර්යයන් අතරින්, තිරසාර සංවර්ධන කවුන්සිලය පිහිටුවීම, තිරසර සංවර්ධන ඉලක්කවලට අදාළ දර්ශකවල දත්ත 2017 වසරේ දී පැවති 46 වන මට්ටමේ සිට 2021 වසර වන විට 104 වන මට්ටම දක්වා ඉහළ නංවා ගත හැකි වීම සහ තිරසර සංවර්ධන ඉලක්ක සඳහා නව්‍ය මූල්‍යකරණය ඒකරාශී කර ගැනීමට පියවර ගැනීම යන කටයුතු මෙහි දී කැපී පෙනේ.

ඉහත දැක්වෙන අවශ්‍යතා සාක්ෂාත් කර ගැනීම සඳහා ආසියානු කලාපයේ රාජ්‍ය අංශයේ නැව් කටයුතු තරගකරුවෙකු ලෙස ජාත්‍යන්තර සාමුද්‍රීය සංවිධානයේ තිරසර සංවර්ධන ඉලක්ක, සවිමත් ලෙස තාක්ෂණිකව හා ආයතනික පසුබිමකින් යුතුව සපුරාලීම උදෙසා, සී/ස ලංකා නැව් සංස්ථාව දැනටමත් අවශ්‍ය සැලසුම් සකස් කරමින් පසු වේ.

තිරසාර සංවර්ධන ඉලක්ක පිළිබඳ එක්සත් ජාතීන්ගේ 2030 න්‍යාය පත්‍රය සහ 2017.10.03 වන දින පාර්ලිමේන්තුවේ දී සම්මත කරන ලද 2017 අංක 19 දරන ශ්‍රී ලංකා තිරසාර සංවර්ධන ඉලක්ක පිළිබඳ පනත අනුව, මෙම වාර්තාව මඟින් සමාලෝචිත වර්ෂය තුළ සමාගමේ තිරසාර කාර්ය සාධනය පිළිබඳ දළ විශ්ලේෂණයක්, සමාගමේ ප්‍රධාන අංශ තුනක්, එනම්, ආර්ථික, පාරිසරික සහ සමාජීය කාර්ය සාධනය යන ක්ෂේත්‍ර අලළා ලබා දෙයි.

<u>පාරිසරික තිරසාරභාවය</u>

සී/ස ලංකා නාවික සංස්ථාව සතු සිලෝන් බ්‍රීස් සහ සිලෝන් ප්‍රින්සස් නම් වූ නෞකා දෙක ජාත්‍යන්තර සාමුද්‍රීය සංවිධානයේ අනුග්‍රහය යටතේ නාවික පරිපාලන ආයතන විසින් ගෝලීය වශයෙන් අනුමත කරනු ලැබ ඇති අදාළ සියලු විමෝචන නීතිරීති හා රෙගුලාසිවලට අනුව තනා, ක්‍රියාවට නංවා, සැලසුම් කරනු ලැබ ඇත. නෞකා මගින් සිදු වන දූෂණය වළැක්වීමේ ජාත්‍යන්තර සාමුද්‍රීය සංවිධානය ආශ්‍රිත ජාත්‍යන්තර සම්මුතියේ (MARPOL) VI වන ඇමුණුම ප්‍රකාරව, ජාත්‍යන්තර නාවික ගමන්බිමන් වල දී නාවික යාත්‍රාවලින් සිදු වන විමෝචනය පාලනය කරයි. එකී රෙගුලාසි මගින් හරිතාගාර වායු (GHC) විමෝචන, බලශක්ති කාර්යක්ෂමතාව සහ වායු දූෂණය යනාදී අංශ ආවරණය වේ. විශේෂිත නාවික යාත්‍රා වර්ග සඳහා වූ බලශක්ති කාර්යක්ෂම පිරිසැලසුම් දර්ශකවල (EEDI) අදියර 3 ට අදාළ නියමතාවන් කඩිනමින් ක්‍රියාත්මක කිරීමට අදාළ MARPOL සම්මුතියේ ඇමුණුම VI සඳහා වූ සංශෝධන, වෙසෙසින්ම EEDI දර්ශක සහ නෞකා බලශක්ති කාර්යක්ෂමතා කළමනාකරණ සැලැස්ම (SEEMP) පිළිබඳව අවධාරණය කෙරෙමින්, වත්මන් බලශක්ති ක්‍රියා රාමුව වැඩි දියුණු කිරීමේ කටයුතු සාගර පරිසර ආරක්ෂණ කමිටුවේ (MEPC) 324 (75) වන යෝජනා සම්මතයට අනුව 2022 අප්‍රියෙල් මස සිට බලාත්මක වී තිබේ.

ජාත්‍යන්තර සාමුද්‍රීය සංවිධානයට අනුව එකී ප්‍රතිපත්ති කාර්ය රාමුවේ ප්‍රධාන පරමාර්ථ පහත දක්වා ඇත.

1. ජාත්‍යන්තර නාවික ගමනාගමන කටයුතු නිසා වසරක් පාසා ඇතිවන හරිතාගාර වායු විමෝචනය, 2008 වසරේ හරිතාගාර වායු මට්ටමට වඩා 2050 වසර වන විට යටත් පිරිසෙයින් 50% ක ප්‍රමාණයකින්වත් අඩු කිරීම සහ නැව් වලින් නිකුත්වන හරිතාගාර වායු විමෝචනය මෙම ශතවර්ෂය තුළ දී හැකිතරම් ඉක්මනින් තුරන් කර දැමීම.
2. මෙකී මූලික හරිතාගාර වායු පිළිබඳ ක්‍රමෝපාය තුළින්, ජාත්‍යන්තර නාවික ගමනාගමනයේ ප්‍රතිඵලයක් වශයෙන් ඇතිවන කාබන් ඝනත්වය (ප්‍රවාහන කටයුතු මගින් විමෝචනය වන කාබන්ඩයොක්සයිඩ් (CO_2) අඩු කිරීම සඳහා) යටත් පිරිසෙයින් 2030 වසර වන විට 40% ක ප්‍රමාණයකින්වත් අඩුකිරීමේ අවශ්‍යතාව මතු කර දක්වන අතර, 2050 වසර වන විට, එය, 70% ක ප්‍රමාණයකින්වත් පහත හෙළීමට සැලසුම් කොට ඇත. මෙම සංසිද්ධිය 2008 වර්ෂය පදනම් කර ගනිමින් සංසන්දනාත්මකව පහත දැක්වේ.



හරිතාගාර වායු අවම කිරීම සඳහා ජාත්‍යන්තර **සාමුද්‍රීය** සංවිධානයේ ක්‍රමෝපාය

2023 ජනවාරි මස 01 වන දින සිට, සියලුම නැව් තම තමන්ගේ නාවික යාත්‍රා විසින් සාක්ශාත් කරගත් බලශක්ති කාර්යක්‍ෂමතා දර්ශක පිළිබඳ ගණනය කිරීම් සිදුකොට වාර්ෂික කාබන් මෙහෙයුම් තීව්‍රතා දර්ශකය (CH) සහ කාබන් තීව්‍රතා දර්ශක (CII) අනුපාතය වාර්තා කිරීම සඳහා දත්ත එකතු කිරීම ආරම්භ කළ යුතු ය. සියලූ නාවික යාත්‍රා මෙන්ම විශාල වෙනස්කම්වලට භාජනය වූ නෞකා ද බලශක්ති කාර්යක්‍ෂමතාව පවත්නා දර්ශක වලින් (EEXI) ආවරණය වේ.

එක් එක් නාවික යාත්‍රාව සම්බන්ධයෙන් මෙන්ම සැලකිය යුතු වෙනස්කම් වලට භාජනය වූ ඒ ඒ නාවික යාත්‍රා සම්බන්ධයෙන් ඒවා විසින් සාක්ෂාත් කරගත් EEXI දර්ශක ගණනය කරනු ලැබේ. (MARPOL ඇමුණුම VI හි රෙගුලාසි අංක 23 අනුව)

සී/ස ලංකා නැව් සංස්ථාවේ තාක්ෂණික දෙපාර්තමේන්තුව ජාත්‍යන්තර සාමුද්‍රීය සංවිධානයේ ඉහත දැක්වූ හරිතාගාර වායු අවම කිරීමේ එකී ක්‍රමෝපාය පිළිබඳව වටහා ගෙන සිටින අතර ශ්‍රී ලංකා රජයට අයත් තොග වශයෙන් භාණ්ඩ ප්‍රවාහනය කෙරෙන පැනාමැක්ස් (panamax) කාණ්ඩයේ නෞකාද්වය අරබයා ද, අදාළ අනුකූලතාව සහිත සියලු පූර්වෝපායයන් යොදා ඇත. මෙම නෞකාවල ප්‍රධාන එන්ජිම නිෂ්පාදනය කරනු ලැබ ඇත්තේ මෑන් එනර්ජි සොලූෂන් (Man Energy Solution) නමැති ආයතනය විසිනි. එක් එක් යාත්‍රාව EEXI අගය හා සම්බන්ධ රෙගුලාසිවලට යටත් වන අතර ඒවායේ අදාළ අගය වෙන වෙනම ගණනය කළ යුතු වේ. MAN PRIMARY SERVICE සේවා ආයතනය, සී/ස ලංකා නැව් සංස්ථාව සමග සම්බන්ධීකරණය වීම හරහා ඊට අදාළ ප්‍රතිඵල මගින්, EEXI දර්ශක ගණනය කිරීම්වලට අදාළ ප්‍රමිතීන් සපුරා ගනු පිණිස ප්‍රශස්ත අයුරින් බලශක්තිය සීමා කිරීම් සලසයි.

ප්‍රධාන ප්‍රතිලාභ

- AT 2000/AT 3000 වර්ගයේ දුරස්ථ පාලක ක්‍රම පද්ධති පහසුවෙන් ස්ථාපනය කිරීමට හැකි වීම.
- සාන්ද්‍රිත / අධිගාමික අධිගාමීය බලශක්ති පාලනය නෞකා මෙහෙයුම් වේදිකාවේ සිට සෘජුවම කළ හැකි වීම.
- අධිගාමී අන්තර්ගහණය කිරීම.
- මනා කාර්ය සාධනය සඳහා ප්‍රශස්තකරණය (සංයෝජන වක්‍ර සමාලෝචනය, ප්‍රශස්තකරණය හා ක්‍රියාත්මකකරණය).
- ප්‍රචාලන වින්‍යාසය මත අවම හායනයක් සහිත OPL පද්ධති මට්ටම නිසා ස්ථාවර හා කාර්යක්‍ෂම ප්‍රචාලනීය පාලනය සහ ඉන්ධන පරිභෝජනය හැකි තරම් අවම වශයෙන් සිදු වීම.

ඉහත සඳහන් කරුණුවලට අමතර වශයෙන්, අපගේ නෞකා සතු එන්ජින් හරහා (ප්‍රධාන ප්‍රචාලනය සඳහා අතුරු ප්‍රචාලන සඳහා) ඉතා අඩු මට්ටමක ගෙන්දගම් සහිත ඉන්ධන (VLSFO) ප්‍රමාණයක් පරිභෝජනය වන අතර, එම තත්වය, ජාත්‍යන්තර සාමුද්‍රීය සංවිධානයේ අවම ගෙන්දගම් සංයුතිය පිළිබඳ රෙගුලාසිවලට අනුව 2020 ජනවාරි මස සිට ක්‍රියාවට නැංවේ.

නෞකා බලශක්ති කාර්යක්ෂමතා කළමනාකරණ සැලැස්ම (SEEMP) පිළිබඳ III වන කොටසෙහි ඉලක්කය වන්නේ, ව්‍යාපාරවලට අවශ්‍ය කාබන් තීව්‍රතා දර්ශකය (CII) සාක්ෂාත් කර ගැනීම සඳහා සහාය වීමයි. මෙම වාර්ෂික ශ්‍රේණිගත කිරීම හා සම්බන්ධ නැව් ආශ්‍රිතව විශේෂිත වශයෙන් අවශ්‍ය වන්නා වූ ලේඛනයක් වන නෞකා බලශක්ති කාර්යක්ෂමතා කළමනාකරණ සැලැස්ම (SEEMP) පිළිබඳ III වන කොටස, කාබන් තීව්‍රතා දර්ශකය වැඩි දියුණු කිරීමේ උපාය මාර්ගය ගෙන හැර දක්වන අතර, එමගින් ඉදිරි වසර තුන තුළ නෞකාවේ මෙහෙයුම් බලශක්ති කාර්යක්ෂමතාවය පෙන්වා දෙනු ඇත.

නෞකා බලශක්ති කාර්යක්ෂමතා කළමනාකරණ සැලැස්ම (SEEMP) පිළිබඳ III වන කොටස යනු, වෙනස්වන කාර්යකරණය සහ අවශ්‍ය මිතික පිළිබිඹු කිරීම සඳහා නිතර සංශෝධනය වන සහ යාවත්කාලීන කෙරෙන ගතික ලේඛනයකි. 2023 ජනවාරි මස 1 වන දින වන විට එය වලංගු කෙරෙන අතර, එය, ඒ හා සම්බන්ධ අනුකූලතා තහවුරු කිරීම (CoC) සමඟ අදාළ යාත්‍රාවේ පිහිටුවා ගබඩා කර තිබිය යුතු ය.



Year	Reduction from 2019 ref. (mid-point of C-rating band)
2023	5 %
2024	7 %
2025	9 %
2026	11 %
2027-2030	To be decided

IMO : ජාත්‍යන්තර සාමුද්‍රීය සංවිධාන කාබන් තීව්‍රතා මෙහෙයුම් ප්‍රමාණනයන්

කාබන් තීව්‍රතා දර්ශකය ගණනය කර 2024 වර්ෂයේ සිට දත්ත එකතු කිරීමේ පද්ධතිය (DCS) සත්‍යාපකය වෙත වාර්තා කළ යුතු අතර, යම් නිවැරදි කිරීමේ සාධක සහ මුහුදු ගමන් වෙනස් කිරීම් ඇතුළුව පෙර වසර සඳහා සම්පූර්ණ DCS දත්ත සමඟින්. දත්ත එකතු කිරීමේ පද්ධතිය, අදාළ අනුකූලතා ප්‍රකාශය (SoC), වසර පහක් සඳහා නෞකාවේ තබා ගත යුතු ය. සාක්ෂාත් කර ගත් කාබන් තීව්‍රතා දර්ශකය සහ පාරිසරික ශ්‍රේණිගත කිරීම (A සිට E දක්වා) එකී සත්‍යාපකය මගින් සටහන් කර තබා ගනු ඇත. අදාළ අනුකූලතා ප්‍රකාශය ලබා දීමට පෙර, නෞකා බලශක්ති කාර්යක්ෂමතා කළමනාකරණ සැලැස්ම (SEEMP) පිළිබඳ III වන කොටස නිවැරදි කිරීමේ ක්‍රියාකාරී සැලැස්මක් සමඟ යාවත්කාලීන කළ යුතු අතර අඛණ්ඩව D ශ්‍රේණිගත කිරීම් තුනක් හෝ එක් E ශ්‍රේණිගත කිරීමක් තිබේ නම්, අදාළ තහවුරු කිරීම සිදු කළ යුතු ය. අවශ්‍ය මට්ටමේ කාබන් තීව්‍රතා දර්ශකය සපුරා නොතිබීමට හේතුව සම්බන්ධයෙන් කෙරෙන විශ්ලේෂණය, නිවැරදි කිරීමේ ක්‍රියාකාරී සැලැස්මේ කොටසක් විය යුතු අතර, එයට නව ක්‍රියාත්මක කිරීමේ උපාය මාර්ගයක් ද ඇතුළත් විය යුතු ය.

අපගේ යාත්‍රාවල කාබන් තීව්‍රතා දර්ශකයට අනුව, එම්.වී. සිලෝන් බ්‍රීස් සහ එම්.වී. සිලෝන් ප්‍රින්සස් යන නෞකා 'C' කාණ්ඩයට අයත් වේ. එබැවින්, අපගේ යාත්‍රා ඉදිරි වසර 3 සඳහා කාබන් තීව්‍රතා දර්ශක අගයන්ට අනුකූල වන නමුත් යාත්‍රාවල ඉන්ධන පරිභෝජන කාර්යක්ෂමතාව වර්ධනය කළ යුතු වන්නේ ය.

<u>සමාජ තිරසාර භාවය</u>

අපගේ වර්තමාන එදිනෙදා ජීවිතය ගැන සිතා බලන කළ, ඇත්ත වශයෙන්ම අප අපගේ බොහෝ උවමනාවන් එනම්, භාණ්ඩ හා සේවා විෂයයෙහි සයුරු තරණයේ නිරත නාවික පිරිස් මත රැඳී සිටින්නෙමු.ගෝලීය නැව් ඇණිය තුළ දස ලක්ෂයකට වැඩි නැවියන් සංඛ්‍යාවක් නාවික සේවයේ නිරතව සිටින අතර අත්‍යවශ්‍ය භාණ්ඩ මෙන්ම සුඛෝපභෝගී භාණ්ඩ බිලියන සංඛ්‍යාත වශයෙන් ඔවුහු මහ ජනතාව වෙත සපයා ලඟා කර දෙති. නාවික කර්මාන්තය ලොවට නැතිවම බැරි එකක් වන නමුත්, නැවියන් නොමැති තැන නාවික කර්මාන්තයක් ද නොමැත. එබැවින්, ශ්‍රී ලංකාවේ විශ්ව විද්‍යාලවලින් එක් වරකට ආධුනික කැඩෙට් නිලධාරීන් 52 ක් බැගින් තෝරා ගෙන සමාගම සතු නැව්වල පුහුණු කිරීම් කටයුතුවල යොදවා තිබේ. සාමාන්‍යයෙන්, එකී පුහුණුව ලද නැවියන් 21 දෙනෙකු (නාවික නිලධාරින් හා නැව් සේවක පිරිස්) එක්සත් ජනපද ඩොලර්වලින් උපයන ආදායම් මගින් ශ්‍රී ලංකාවේ ආර්ථික තිරසාරත්වය මෙන්ම තම තමන්ගේ පවුල්වල සමාජමය තිර පැවැත්ම ද ලඟාකර ගැනීමට සමත්ව ඇත.

ජාත්‍යන්තර සාමුද්‍රීය සංවිධානය, නාවික කටයුතු ක්ෂේත්‍රයේ කාන්තාවන් ද සිටිය යුතුය යන ස්වකීය වැඩසටහන හරහා, පිරිමින් හා සමඟ උරෙනුර සිටිමින් කාන්තාවන්ට ද නාවික කටයුතු ක්ෂේත්‍රය තුළ පුහුණුව ලබාදෙන අයුරින් තම සාමාජික රටවල් ඒවායේ අදාළ නාවික ආයතන ද සම්බන්ධ කර ගනිමින් ක්‍රියා කොට නාවික කර්මාන්තයට අවශ්‍ය වන ඉහළ මට්ටමේ දක්ෂතාව ඔවුනට ද අත්කර ගැනීමට ඉඩ ප්‍රස්ථා සලසා දීම දිරි ගන්වයි. සංවර්ධනය වෙමින් පවතින රටවල නාවික කටයුතු ක්ෂේත්‍රය තුළ උසස් මට්ටමේ තාක්ෂණික පුහුණුව කාන්තාවන්ට ද ලබා ගැනීමේ ප්‍රවේශ පහසුකම් සැලසීම මගින් ජාත්‍යන්තර සාමුද්‍රීය සංවිධානය සිය ස්ත්‍රී පුරුෂ සමාජ සමානත්මතාව සහ ඒ හා සබැඳි සහාධ්‍යායත්වය හරහා කාන්තාවන් සවිබල ගැන්වීම සඳහා සහාය සලසයි. නාවික පරිපාලනය, වරාය හා නාවික පුහුණු ආයතන යන අංශ තුළ රැකියා සංවර්ධන අවස්ථා සඳහා කාන්තාවන් තෝරාගනු ලබන පරිසරයක් ඔවුන් සඳහා හඳුනා ගනිමින් නිර්මාණය කිරීම මෙහි අපේක්ෂාවයි. සී/ස ලංකා නැව් සංස්ථාව, දිවයිනේ පිහිටි ප්‍රධාන නාවික පාසැල් සමග සමීප සහයෝගීතාවයෙන් යුක්තව කටයුතු කරමින් ජාත්‍යන්තර සාමුද්‍රීය සංවිධානයේ ඉහත සඳහන් ඉදිරි සැලසුම් ගෝලීය මට්ටමින් ක්‍රියාත්මක කිරීම දිරිමත් කිරීම හා ඊට අනුබල සලසා දීම සිදු කරයි. ස්ත්‍රී පුරුෂ සමානාත්මතා සමාජභාවය අපගේ ආයතනයේ පමණක් නොව අපගේ නාවික යාත්‍රාවන්හි දී පවා අනුගමනය කිරීම සඳහා වග බලා ගැනුනු අතර, එහිලා, 2021 වසරේ දී කාන්තාවන් දෙදෙනෙකු මුහුදු තරණයේ යෙදෙන යාත්‍රික නාවිකාවියන් ලෙස පුහුණු කරන ලදී. ඔවුහු මාස 6 ක පුහුණු කාලයක් තුළ නෞකාවක සිට ලබා ගන්නා පුහුණුව සාර්ථක ලෙස අත් කර ගෙන තිබේ.

සේවක අර්ථසාධක / සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් (EPF / ETF) ගෙවීම ඇතුළුව නාවික පිරිස් සඳහා වේතන ගෙවීම හා රක්ෂණාවරණ සඳහා දායකවීම්, නැව් සේවයේ යෙදී සිටිය දී අවශ්‍ය කෙරෙන වෛද්‍ය හා සෙසු සෞඛ්‍ය පහසුකම් සැපයීම සහ ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ (ILO) රෙගුලාසිවලට අනුකූලව කටයුතු කිරීම යනාදී කාර්යයන් හා කටයුතු සම්බන්ධයෙන් ගත් කළ, සී/ස ලංකා නැව් සංස්ථාව. එහිලා, නාවික කර්මාන්තයේ සියලු සම්මතයන් හා ප්‍රමිතීන් අතිශය ප්‍රශස්ථ අයුරින් අනුගමනය කරනු ලැබ තිබේ.

සුරක්ෂිතතාව මූලික මිනිස් අයිතිවාසිකමක් සේ අප නිරීක්ෂණය කරන අතර වැඩ කිරීමේ දී ඇතිවන අහිතකර තත්ත්වයන් සේවකයින්ගේ ඵලදායීතාව කෙරෙහි පමණක් නොව ඔවුන්ගේ කාර්යක්ෂමතාව කෙරෙහි ද හානිදායක වේ. තවද, එය ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන් සම්බන්ධයෙන් ද, පුළුල්ව ගත් කළ, මුළු මහත් ප්‍රජාවට ද ඉන් අහිතකර බලපෑම් එල්ල වේ. ආරක්ෂාව සම්බන්ධයෙන් අපගේ ප්‍රමුඛතාවන්ගෙන් එකක් නම්, අපගේ සේවක පිරිසට ලබා දිය යුතු ආරක්ෂාවයි. එබැවින්, අපගේ නාවික යාත්‍රාද්වය තුළ ආරක්ෂාව සැපයීම වෙනුවෙන් ජාත්‍යන්තර නාවික කළමනාකරණ පද්ධතිය සාර්ථක ලෙස අප විසින් ක්‍රියාවේ යොදවනු ලැබ තිබේ.

නැවියන්ගේ වෙහෙසකර සේවා දිවියට සහනයක් වනු පිණිස සන්නිවේදනය ප්‍රධාන වශයෙන් අවශ්‍ය වන අංගයක් ලෙස වටහා ගෙන ඇති හෙයින්, සියලු නැවියන් සඳහා අන්තර්ජාල වයි ෆෛ (wi-fi) පහසුකම් සපයා දෙනු ලැබ තිබේ.

<u>ආර්ථික තිරසාරභාවය</u>



මූලාශ්‍ර : IHS, OECD, UN

නාවික වෙළහෙළඳාම් කටයුතු අඛණ්ඩව ප්‍රසාරණය වනු ඇත. (ගෝලීය දළ දේශීය නිෂ්පාදිතය හා ජනගහනය හා එක්ව)

ලොව පුරා සිදු කෙරෙන වෙළඳ කටයුතු තුළින් කුලී ආදායම වශයෙන් දිනකට ඇමරිකානු ඩොලර් 20,000 ක් පමණ අපගේ නාවික යාත්‍රා දෙක උපයයි. මෙකී මෙහෙයුම් කටයුතු ගල් අඟුරු ප්‍රවාහනය කිරීමේ කටයුතු වලින් පසු කාල සීමාව තුළ (එනම්, සෑම වර්ෂයකම සැප්තැම්බර් මස සිට මාර්තු මස අවසානය දක්වා) නොකඩවා සිදු කරනු ලැබේ.

2022 / 2023 වර්ෂයේ දී එක් එක් නෞකාවක දෛනික මෙහෙයුම් පිරිවැය (DOC), එ. ජ. ඩොලර් 4,500.00 ක මට්ටමක පවත්වා ගන්නා ලදී. 2023 / 2024 වර්ෂයේ දී ඇස්තමේන්තුගත මෙහෙයුම් පිරිවැය එ. ජ. ඩොලර් 5,000 ක් වන බව ගණනය කර ඇත.

නැවියන් විසින් උපයනු ලබන විදේශ විනිමය ආදායම කෙරෙහි සී/ස ලංකා නැව් සංස්ථාව වැඩි අවධානයක් යොමු කරන ලදී. එබැවින්, පුහුණුව ලැබූ කැඩෙට් නිලධාරීන්ගෙන් ඇතැම් පිරිසක් සී/ස ලංකා නැව් සංස්ථාවට බඳවා ගන්නා ලද අතර සෙසු අය, ඉහළ නිලලත් නිලධාරීන් (Ranked Officers) වශයෙන් බඳවා ගැනීම සඳහා වෙනත් නැව් සමාගම් වෙත යොමු කරන ලදී. ඔවුන් සියලු දෙනා සක්‍රිය සයුරු තරණ නාවික සේවයේ නිරතව සිටින අතර, ඔවුහු වාර්ෂිකව රටට අති මහත් විදේශ විනිමය ප්‍රමාණයක් ද අත් කර දෙති. ඔවුන් විසින් තම පවුල්වල සාමාජිකයන්ගේ සාමාජීය හා ආර්ථික තත්ත්වයන් නගාලීම සඳහා සපයනු ලබන සහාගිත්ව දායකත්වය, සී/ස ලංකා නැව් සංස්ථාව විසින් ක්‍රියාවට නංවා ඇති ''පුහුණුව හා වෙළඳාම'' යන සංකල්පය හරහා මෙරට ආර්ථිකයේ සෞභාග්‍යය උදාකරලීමේ ප්‍රයත්නය වෙනුවෙන් අත්වූ සුවිශාල ප්‍රතිලාභයකි.

සී/ස ලංකා නැව් සංස්ථාවේ ව්‍යාපාර සංවර්ධන අංශය විසින්, විදේශීය නෞකා සඳහා, සමුද්‍රික කම්කරු සම්මුතිය (MLC) සහ අනුකූලතා සහතිකය (DoC) අනුව, ශ්‍රී ලාංකික නැවියන් බඳවා ගනු ලැබේ.

අද වන විට, සී/ස ලංකා නැව් සංස්ථාව, සිපෙට්කෝ ආයතනය සමග සම්බන්ධ වෙමින් Supramax Tanker යාත්‍රාවක් මිලදී ගැනීමේ කාර්ය ක්‍රියාත්මක කිරීම හරහා ආදායම් මට්ටම ඉහළ නංවා ගැනීමට ප්‍රයත්න දරන අතර, පතල් කැනීමේ කාර්යාංශය භාර අමාත්‍යාංශය වෙත විශේෂඥ දැනුම සපයමින් එම යාත්‍රාව මගින් ඛණිජ වැලි අපනයනය කිරීමට අපේක්ෂා කරයි. නෞකා බලශක්ති කාර්යක්ෂමතා කළමනාකරණ සැලැස්ම (SEEMP) පිළිබඳ III වන කොටස හා අනුකූලතාව දක්වමින්, යාත්‍රාවල ඉන්ධන පරිභෝජනය අඩු කිරීම මගින් සිලෝන් බ්‍රීස් සහ සිලෝන් ප්‍රින්සස් නෞකාවල ඉන්ධන දහනය අඩු කළ හැකි අතර එය, විශාල ආර්ථික වාසියක් සලසා දෙනු ලබන කටයුත්තක් වන්නේ ය.

විගණන කමිටු වාර්තාව

විගණන කමිටුවේ සංයුතිය

සී/ස ලංකා නැව් සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එහි විගණන කමිටුව පත්කරනු ලබන අතර එය සෘජුවම අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කරයි. මූල්‍ය වර්ෂය තුළ, එම විගණන කමිටුව පහත දැක්වෙන ස්වාධීන හා විධායක නොවන අධ්‍යක්ෂකවරුන් තිදෙනෙකුගෙන් සමන්විත විය :

එම්. ජී. එන්. ප්‍රේමතිලක මහත්මිය - සභාපති
ජී. යූ. කේ. අල්ගෙවත්ත මහතා - සාමාජික
එමල් ගුණසේකර මහතා - සාමාජික

විගණන කමිටුවේ කාර්ය භාරය

සමාගමේ මූල්‍ය කටයුතු සම්බන්ධයෙන් සියලු කරුණු සෝදිසි කර විභාග කිරීමේ බලය විගණන කමිටුව වෙත පැවරී ඇති අතර අධ්‍යක්ෂ මණ්ඩලයට ස්වකීය රාජකාරි ඉටු කිරීමෙහිලා කාර්යක්ෂම අයුරින් සහාය ලබා දේ. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් (SLFRS / LKAS) ප්‍රකාරව මූල්‍ය වාර්තා පිළියෙළ කිරීම, ඉදිරිපත් කිරීම සහ ප්‍රමාණවත් ලෙස හෙළිදරව් කිරීම් සිදුකර ඇත්දැයි යන කරුණු පමණක් නොව, මූල්‍ය වාර්තාකරණය පිළිබඳව නියමතා 2007 අංක 07 දරන සමාගම් පනත සහ මූල්‍ය වාර්තාකරණය පිළිබඳ සෙසු රෙගුලාසිවලට හා නියමතාවන්ට අනුව සපුරා ඇත්දැයි යන්න විගණන කමිටුව පරීක්ෂා කරයි.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමට පෙර විගණන කමිටුව විසින් වාර්ෂික මූල්‍ය ප්‍රකාශ සමාලෝචනයට භාජනය කර නිර්දේශ කරන ලදී.

සංස්ථාවේ කටයුතු පිළිබඳ තත්ත්වය සහ ඊට අදාළ කාල සීමාව තුළ අත්කර ගත් ප්‍රතිඵල තුළින් එය නිවැරදිව පිළිබිඹු වන්නේ ද යන්න පිළිබඳව සාධාරණ තහවුරුවක් ලබා ගනු පිණිස විගණන කමිටුව විසින් සමාගමේ අභ්‍යන්තර පාලන ක්‍රියාපරිපාටිවල ප්‍රමාණවත් බව පිළිබඳව ද විධිමත්ව හා අඛණ්ඩව ක්‍රියාත්මක වීම පිළිබඳව ද සමාලෝචනය කරන ලදී. අවශ්‍ය විටෙක දී, ස්වාධීන විගණන සිදු කරන ලදී. සංස්ථාව තුළ අභ්‍යන්තර පාලන වාතාවරණය තවදුරටත් ශක්තිමත් කිරීමේ අදහස ඇතිව, අභ්‍යන්තර විගණන වාර්තා සමාලෝචනය කොට කළමනාකාරිත්වය සමග සාකච්ඡා කරනු ලැබේ. තවද, විගණන කමිටුව විසින් සමාගමේ ප්‍රධාන ව්‍යාපාරික හා පාලන අවදානම් පිළිබඳව ද තක්සේරුවක් සිදු කරන ලදී.

<u>රැස්වීම්</u>

2022 / 2023 වර්ෂය තුළ දී, විගණන කමිටු රැස්වීම් 04 ක් පවත්වන ලදී. විගණන කමිටු රැස්වීම් සඳහා අධ්‍යක්ෂවරුන්ගේ / සාමාජිකයින්ගේ පැමිණීම පහත දක්වා ඇත.

එම්. ජී. එන්. ප්‍රේමතිලක මහත්මිය (4/4)
ජී. යූ. කේ. අල්ගෙවත්ත මහතා (1/4)
එමල් ගුණසේකර මහතා (2/4)
එන්. ඒ. එච්. කේ. විජේරත්න මහත්මිය - ආරාධනය පරිදි (4/4)

අධ්‍යක්ෂවරුන්ට රැස්වීමකට පැමිණීමට අපහසු නම්, ඊට සමාව භජනය කර සිටීමටත්, න්‍යාය පත්‍රයේ අඩංගු කරුණු පිළිබඳව පූර්වගාමීව කමිටුවේ සභාපතිවරයා සමඟ සාකච්ඡා කිරීමටත් අවස්ථාවක් ඔවුනට ඇත.

ජාතික විගණන කාර්යාලයේ නියෝජිතයෙකු, රේඛීය අමාත්‍යාංශයේ ප්‍රධාන ගණකාධිකාරි, සාමාන්‍යාධිකාරි, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි, සහකාර සාමාන්‍යාධිකාරි හා අංශ ප්‍රධානීන්ද විගණන කමිටුවේ ආරාධනය පරිදි රැස්වීම්වලට සහභාගී වූහ. අභ්‍යන්තර විගණක, කමිටුවේ කැඳවුම්කරු වශයෙන් කටයුතු කරයි.

සමාලෝචනය කිරීම් :

අදාළ වර්ෂය සම්බන්ධයෙන් විගණන කමිටුව විසින් පහත දැක්වෙන කරුණු සමාලෝචනයට භසු කරන ලදී.

1. **වාර්ෂික වාර්තා : 2020 /21 සහ 2021 /22 :**

   නිර්දේශය :

   නියමිත කාල සීමාව තුළ වාර්ෂික වාර්තා ඉදිරිපත් කරන ලෙස විගණන කමිටුව නිර්දේශ කළේ ය. වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීමේ ක්‍රියාවලිය අවසන් වන්නේ එය අදාළ අමාත්‍යාංශයට නොව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමෙන් පසුව බැවින්, වාර්ෂික වාර්තා සම්බන්ධයෙන් නිකුත් කර ඇති නව උපදෙස් පිළිබඳව අවධානයෙන් සිටින ලෙස කමිටුවට උපදෙස් දී තිබේ.

   2021 /22 වාර්ෂික වාර්තා ක්‍රියාවලිය අප්‍රේල් මාසයේ දී අවසන් කළ යුතු බවට කමිටුව නිර්දේශ කළේ ය.

2. **ලංකා ගල් අඟුරු සමාගමෙන් (LCC) අයකර ගැනීම් :**

   නිර්දේශය :

   ලංකා කෝල් කම්පනි (LCC) වෙතින් ලැබිය යුතු ප්‍රවර්තන සහ කල් ඉකුත් වූ හිඟ මුදල් අයකර ගැනීමේ ක්‍රියාවලිය පිළිබඳ පසු විපරමක් සිදු කළ යුතු බවට කමිටුව නිර්දේශ කළේ ය. ලංකා ගල් අඟුරු සමාගම වෙනුවෙන් ගෙවීම් සැලැස්මක් සකස් කිරීමට ද, ණය අයකර ගැනීමේ ප්‍රගතිය සහ ඉතිරි ශේෂවල ආයු විශ්ලේෂණය ඇතුළත් වාර්තාවක් සකස් කිරීමට ද කමිටුව නිර්දේශ කළේය. අදාළ ගෙවීම් සැලැස්ම, රේඛීය අමාත්‍යාංශ හරහා ලංකා ගල් අඟුරු සමාගම වෙත යැවීමට ද විගණන කමිටුව උපදෙස් දුන්නේ ය.

   හිඟ හිට ඇති ශේෂයන් පිළිබඳ සාරාංශ වාර්තාව අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට සටහනක් ලෙස ලබා දෙන ලෙස කමිටුව නිර්දේශ කළේ ය.

   මේ පිළිබඳව ලේකම්වරයා සමඟ සාකච්ඡා කිරීමට මණ්ඩලය එකඟ වූ අතර, අදාළ පාර්ශව සහභාගීකරවා ගෙන රැස්වීම සංවිධානය කිරීම සඳහා (ආයු විශ්ලේෂණය සහ රැස්වීමට සම්බන්ධ වන පාර්ශවයන් සමඟ) මීට අදාළ කරුණු ලේකම්වරයා වෙත යැවීමට ද, ඒ සඳහා වන ඉල්ලීම, මණ්ඩල රැස්වීමේ තීරණය සඳහා මණ්ඩලය වෙත යොමු කිරීමට ද විගණන කමිටුව තීරණය කළේ ය.

3. තාක්ෂණික අංශය සඳහා පරිගණකමය නාවික කළමනාකරණ පැකේජයක් ලබා දීම :

නිර්දේශය :

අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම සහ විගණන කමිටුව වෙත ප්‍රගති වාර්තාවක් ඉදිරිපත් කළ යුතු බවට කමිටුව නිර්දේශ කළේ ය. අපගේ අවශ්‍යතා කවරේදැයි සේවා සපයන්නාට පැහැදිලි කිරීම සඳහා කමිටුවක් පත් කරන ලෙස කමිටුවට උපදෙස් දෙන ලදී.

4. කාර්යක්‍ෂමතා කඩඉම් පරීක්‍ෂණය :

නිර්දේශය :

වෙළඳ නැව් ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ප්‍රතිචාරය ප්‍රමාද වන්නේ නම්, කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය පැවැත්වීම සඳහා ජාතික කම්කරු අධ්‍යයන ආයතනය (NILS) වැනි වෙනත් ආයතනයකින් සහාය ලබාගෙන මෙම ක්‍රියාවලිය වේගවත් කරන ලෙස කමිටුව නිර්දේශ කළේ ය.

5. වත්කම් ලේඛනයේ ඇතුළත් වත්කම් නොවන විෂයාංග :

නිර්දේශය :

අදාළ කමිටු වාර්තාව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යොමු කරන ලෙස විගණන කමිටුව වෙත උපදෙස් දෙනු ලැබිණි.

6. භාණ්ඩ සමීක්‍ෂණ මණ්ඩලය - 2021 /22, 2022 /23 :

නිර්දේශය :

- කොළඹ වරායට නැව් සේන්දු වන අවස්ථාවේ දී අදාළ නැවෙහි සිට වත්කම් සත්‍යාපනය සිදු කරන ලෙස කමිටුවට නිර්දේශ කරනු ලැබිණි.
- නෞකාවේ ඇති වත්කම්වල භෞතික පැවැත්ම සහතික කිරීම සඳහා සුදුසු යාන්ත්‍රණයක් පවත්වාගෙන යන ලෙස නෞකාවල නැව්පතිවරුන් දෙදෙනාගෙන් ඉල්ලීමක් කළ අතර, භාණ්ඩ සමීක්ෂණ වාර්තාවට අමුණා තැබීමට හැකිවන පරිදි සෑම වසරකම අප්‍රේල් 30 වන දින හෝ ඊට පෙර අදාළ නැව්පතිවරුන් සහතික කළ වාර්තාවක් ඉදිරිපත් කරන ලෙසට ද ඉල්ලා සිටින ලදි.

7. විගණන විමසුම්වලට පෙර රැස්වීම :

නිර්දේශය :

රජයේ විගණකවරුන් සමඟ රැස්වීමක් සංවිධානය කිරීම සඳහා වන පූර්ව ඉල්ලීම් විධිමත් ලෙස සිදු කළ යුතු බවට නිර්දේශ කරන ලද අතර, විගණකවරුන් වෙත යැවෙන විධිමත් ලිපිය සාමාන්‍යාධිකාරි හෝ සහකාර සාමාන්‍යාධිකාරි (මූල්‍ය) විසින් අත්සන් කර තිබීම වඩාත් සුදුසු බව කියැවිණි.

8. විගණන විමසුම් :

නිර්දේශය :

විගණන විමසුම්වලට පිළිතුරු ලබාදීමට වැඩි කාලයක් ගත කිරීමට සිදු වන්නේ නම්, එම ප්‍රමාදය සම්බන්ධයෙන් රජයේ විගණනය වෙත ඒ බව දන්වා ලිපියක් යොමු කළ යුතු බව කමිටුව ප්‍රකාශ කළේ ය.

9. කුලී නැව් පාර්ශව විසින් කරන ලද ගෙවීම් ඌන / අධි ගෙවීම්:

නිර්දේශය :

අනාගතයේ දී කුලී නැව් හා සම්බන්ධ ඌන ගෙවීම් අවම කිරීම සඳහා, ගෝලීය මුදල් හුවමාරු ක්‍රියාවලියට අදාළ බැංකු ගාස්තු හෝ මුදල් මාරු කර යැවීමේ වෙනත් ගාස්තු කිසිවක් අඩු නොකර, කුලියට නැව් ගැනීමට අදාළ මුදල සම්පූර්ණයෙන්ම අදාළ ගෙවීම් පාර්ශවය වෙත (කුලී නැව් සැපයුම්කරුට) ලැබෙන පරිදි අවශ්‍ය වන්නා වූ වගන්ති සහිතව කුලී නැව් පාර්ශව ගිවිසුම් පිළියෙළ කරන ලෙස කමිටුව විසින් නිර්දේශ කරන ලදි.

10. මූල්‍ය අංශයට ගිණුම් පැකේජයක් ලබා දීම :

නිර්දේශය :

ගිණුම්කරණ පැකේජය, ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටියට යටත්ව මූල්‍ය අංශය සඳහා නිර්දේශ කෙරේ. ප්‍රදානය කරන ලද ටෙන්ඩර් තීරණය, මණ්ඩල සටහනක් ලෙස මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලෙස ද නිර්දේශ කරන ලදී.

11. වත්කම් තක්සේරුව :

ඉඩම, ගොඩනැගිල්ල සහ වාහන පමණක් නැවත තක්සේරු කරන බවට තීරණයක් ගෙන ඇති බව සහකාර සාමාන්‍යාධිකාරි (මූල්‍ය) ප්‍රකාශ කළේ ය.

නිර්දේශය :

සමාගමේ එකී තීරණය සම්බන්ධයෙන් මණ්ඩල පත්‍රිකාවක් මණ්ඩලය වෙත යැවිය යුතු බව කමිටුව නිර්දේශ කළේ ය.

12. කාර්ය මණ්ඩල සාමාජික සාමාජිකාවන්ගේ සේවාන්ත ප්‍රතිලාභ හිමිකම් :

නිර්දේශය :

නැව් කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ සේවාන්ත ප්‍රතිලාභ හිමිකම් පිළිබඳ ගැටලුව වැඩ බලන සාමාන්‍යාධිකාරිවරයා වෙත යැවිය යුතු බව කමිටුව යෝජනා කර ඇති අතර, මෙම කාරණයට සම්බන්ධ විය යුත්තේ කුමන අංශය ද යන්න වැඩබලන සාමාන්‍යාධිකාරිවරයා විසින් තීරණය කරනු ලබනවා ඇත.

13. එක් එක් තනතුර පිළිබඳ අත්පොත :

නිර්දේශය :

එක් එක් අංශ ප්‍රධානීන් මෙම වගකීම භාර ගත යුතු අතර තීරණය කළ කාල සීමාව තුළ එය සිදු කළ යුතු බව කමිටුව නිර්දේශ කළේ ය.

14. ස්ථාවර වත්කම් ලේඛනය පවත්වාගෙන යාම :

නිර්දේශය :

වත්කම් ලේඛනය පවත්වාගෙන යාම සඳහා පද්ධති නඩත්තුව සහිත වත්කම් ගැනුම් වාර්තා ප්‍රමාණවත් වන අතර අතින් නඩත්තු කරන වත්කම් ලේඛනයක් අවශ්‍ය නොවන බව නිර්දේශ කරන ලදී.

එසේම, මිලදී ගත් වත්කම්වල මාසික තොරතුරු මුද්‍රණය කර වෙනම ගොනුවක් පවත්වාගෙන යන ලෙස පාලන අංශයට උපදෙස් දුන් අතර වත්කම් දත්ත මූලය ආරක්ෂා කර ගැනීම සඳහා අවශ්‍ය නම්, උපස්ථ පද්ධතියක් පවත්වාගෙන යන ලෙස ද උපදෙස් දෙන ලදී.

15. **අභ්‍යන්තර මූල්‍ය පද්ධතියේ (IFS පද්ධතියේ) පවතින නමුත් භෞතිකව කාර්යාල පරිශ්‍රයේ නොමැති වත්කම් :**

නිර්දේශය *:*

මෙම කාරණයේ ප්‍රගතිය විගණන කළමනාකරණ කමිටුව (AMC) වෙත වාර්තා කළ යුතු බව කමිටුව යෝජනා කළේ ය. මෙම වෙනස්කම් සඳහා හේතුකාරක වී ඇති කරුණු, වාර්තාවේ නිසි ලෙස සාධාරණීකරණය කළ යුතු ය. එමෙන්ම ඉදිරියේ දී අපහරණය කිරීමට නියමිත ද්‍රව්‍ය නිසි පරිදි පද්ධතියෙන් ඉවත් කළ යුතු බවට ද කමිටුව නිර්දේශ කරන ලදී.

16. **හඳුනා නොගත් ලදුපත් සහ ගෙවීම් :**

නිර්දේශය :

මහජන බැංකුවේ ගිණුම් අංක : 40210903 හි පවත්නා හඳුනා නොගත් රු. 12,000 ක් වූ ලදුපත, වෙනත් ආදායමක් ලෙස සැලකිය යුතුයැයි කමිටුවව් විසින් නිර්දේශ කරන ලදී.

17. **අක්‍රියව පවත්නා බැංකු ගිණුම් :**

නිර්දේශය :

මේ පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත දන්වා යැවීමටත්, එම අක්‍රියව පවත්නා ගිණුම් වසා දමන ලෙසත් කමිටුව විසින් උපදෙස් දෙන ලද්දේ ය.

18. **වාර්ෂික අයවැය :**

නිර්දේශය :

අපගේ ඇස්තමේන්තුගත සහ තථ්‍ය මූල්‍ය සංඛ්‍යා අතර ඇති විචල්‍යතාව අනාගතයේ දී 5%ක විචල්‍යතාවක් තුළ සමතුලිත විය යුතු බව සභාපතිනිය ප්‍රකාශ කළාය.

19. **බඳවා ගැනීමේ පරිපාටිවල (SOR)ප්‍රගතිය :**

රේඛීය අමාත්‍යාංශයේ උපදෙස් පරිදි, අනුමත සේවක සංඛ්‍යාව සඳහා ව්‍යුහාත්මක වෙනස්කම් සහ ආයතනික ව්‍යුහය සඳහා වන යෝජනාව සකස් කිරීම සඳහා මෙන්ම බඳවා ගැනීමේ පරිපාටි සංශෝධනය කිරීම සඳහා ද සී/ස ලංකා නැව් සංස්ථාව කටයුතු කරමින් සිටී.

20. **සුළු මුදල් අත්තිකාරම් :**

නිර්දේශය :

සුළු මුදල් නිරවුල් කර පියවා දැමීම් ලැයිස්තුවේ සහ යාවත්කාලීන කළ අත්තිකාරම් ලැයිස්තුවේ ප්‍රගතිය ඉදිරි විගණන කමිටු රැස්වීම්වලට ඉදිරිපත් කළ යුතු බවට විගණන කමිටුව නිර්දේශ කළේ ය.

වාප්පු ලිපිකරුවන් ලෙස සේවය කිරීමට කැමති අනෙකුත් කාර්ය මණ්ඩල පිරිස් ද පුහුණු කර එම කාර්ය මණ්ඩල සේවක පිරිස් හිඟයට පිළියම් ලෙස යොදා ගත යුතු බවට ද කමිටුව නිර්දේශ කළේ ය.

සුළු මුදල් පියවීම සම්බන්ධයෙන් කාර්යක්ෂම ක්‍රමයක් යෝජනා කිරීම සඳහා සහකාර සාමාන්‍යාධිකාරි (නෞකා / නැව් බඩු සැපයුම් /නෞකාමය නොවන පොදු ප්‍රවාහන සේවා) [Liner/logistic/NVOCC] වෙත කමිටුව පැවරූ අතර, එය ඔහු විසින් විගණන කළමනාකරණ කමිටුව (AMC) වෙත වාර්තා කළ යුතුව තිබේ.

21. වෙනත් කරුණු :

නිර්දේශය :

නැව් කුලියට දීම / ගැනීම සම්බන්ධ විශේෂාංග සටහනක් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යොමු කරන ලෙස කමිටුව නිර්දේශ කළේ ය. ඊට අදාළ ගිවිසුම්වල සඳහන් කොන්දේසි ද අධ්‍යක්ෂවරුන්ගේ අවධානය පිණිස ඒ සමඟ ඉදිරිපත් කළ යුතු බවට ද ඉල්ලා සිටින ලදී.

නිමාව :

විගණන කමිටුවේ රැස්වීම් සටහන්වල වාර්තාව සහ අනෙකුත් වාර්තා, අධ්‍යක්‍ෂ මණ්ඩලයේ අවධානය සහ සුදුසු කටයුතු පිණිස ඉදිරිපත් කෙරේ. තවද, රැස්වීම් සටහන්වල වාර්තාවන්හි පිටපත් අමාත්‍යංශයේ ලේකම්වරයා වෙත ද ඉදිරිපත් කරනු ලැබේ.

කමිටුව වෙනුවෙන්,



එම්. ජී. එන්. ප්‍රේමතිලක මහත්මිය
විගණන කමිටුවේ සභාපතිනි

සී/ස ලංකා නැව් සංස්ථාව
වාර්ෂික වාර්තාව සහ ගිණුම්
2022 / 2023

තුති ප්‍රණාමය

ගරු වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යතුමා විසින් සී/ස ලංකා නැව් සංස්ථාව වෙත නොකඩවා පළකරන ලද එතුමාගේ පූර්ණ සහයෝගය, අනුබලය සහ උපදේශකත්වය වෙනුවෙන්
අපගේ ප්‍රණාමය එතුමාට හිමි වේ.

සංස්ථාවේ අභිමතාර්ථයන් මුදුන්පත් කරගැනීමෙහිලා වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශයේ නිලධාරී මහත්ම මහත්මීන් විසින් දෙන ලද සහයෝගය වෙනුවෙන් සංස්ථාව ඔවුන් වෙත ද ස්වකීය ස්තූතිය පුද කරයි.

එමෙන්ම ශ්‍රී ලංකා වරාය අධිකාරිය, ශ්‍රී ලංකා රේගුව සහ විදේශ නියෝජිත ඒජන්තවරුන් විසින් සංස්ථාව වෙත සැමවිටම පළ කරන ලද සහයෝගය සහ සුහදත්වය වෙනුවෙන් ද සංස්ථාව තම කෘතවේදීතාව ඔවුන් වෙත පළ කර සිටියි.

සංස්ථාව වෙතින් සේවා සලසා ගත් ගනුදෙනුකරුවන්ට ඒ වෙනුවෙන් ද,
ඔවුන්ගෙන් ලද මහඟු සහයෝගය වෙනුවෙන් ද
සංස්ථාව සිය ස්තූති පූර්වක ප්‍රණාමය මෙහිලා පුද කර සිටී.

<u>කාර්ය මණ්ඩලයට ස්තූතිය</u>

සංස්ථාවේ කළමනාකාරිත්වය හා සේවක මහත්ම මහත්මීන් අතර පොදු සුහදශීලීතාව සහ සහයෝගිශීලීතාව සපිරි, නිරන්තරව වැඩෙන මනා සම්බන්ධතාවක් සමාලෝචිත වර්ෂය තුළ දී පැවතුණි.
කළමනාකාරිත්වය සමඟ කටයුතු කිරීමේ දී, වෘත්තීය සංගම් ඉතා වගකීමෙන් හා ප්‍රතිචාරාත්මකව කටයුතු කළ බව කිවමනා ය.

අවසාන වශයෙන්, යාත්‍රාගතව සිට මෙන්ම ගොඩබිම සිට සේවා මෙහෙයුම්වල නියැලි
එතෙර මෙතෙර සියලු සේවක මහත්ම මහත්මීන් විසින්,
විශේෂයෙන්ම, නාවික ක්ෂේත්‍රය මුහුණ දෙමින් සිටින දුෂ්කරතා අබියස,
ආයතනය වෙනුවෙන් සිය සේවා ඉටු කරමින් හෘදයාංගමව දක්වන ලද
ඔවුන්ගේ සේවා පක්ෂපාතී බව හා කැපවීම, සංස්ථා කළමනාකරණය දැඩි අගැයුමකින් යුතුව මෙහිලා සනිටුහන් කර තබයි.

මගේ අංකය எனது இல. My No.	PAS/B/CSCL/01/2023/87	ඔබේ අංකය உமது இல. Your No.		දිනය திகதி Date	2023 දෙසැම්බර් 20 දින

සභාපති,

සී/ස ලංකා නැව් සංස්ථාව.

සී/ස ලංකා නැව් සංස්ථාවේ 2023 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

සී/ස ලංකා නැව් සංස්ථාවේ 2023 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වලින් සමන්විත 2023 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) 2023 මාර්තු 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ අලාභය රු.1,857,129,766ක් වූ අතර සමුච්චිත පාඩුව රු.10,855,139,608 ක් විය. තවද, 2023 මාර්තු 31 දිනට සමාගමේ ශුද්ධ වත්කම් වල අගය රු.9,210,094,328 ක සෘණ අගයක් විය. වර්ෂය සඳහා වූ අලාභය පෙර වර්ෂයට සාපේක්ෂිතව සියයට 67.79 කින් අඩු වී ඇති අතර සමාගමේ ශුද්ධ වත්කම්වල සෘණ ශේෂය පෙර වර්ෂයට සාපේක්ෂිතව සියයට 16.37 කින් ඉහළ ගොස් ඇත. සමාගම නෞකා දෙකක් මිලදී ගැනිම සඳහා 2014 වර්ෂයේදී ඇ.ඩො.මිලියන 70 ක

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව   இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.   No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34   +94 11 2 88 72 23   ag@auditorgeneral.gov.lk   www.naosl.gov.lk

කාලින ණයක් (Term Loan) සහ එම ණය පොලිය ගෙවීමට පොලී ප්‍රාග්ධනිත ණයක් ලෙස ඇ.ඩො.මිලියන 5.44 ක් මහජන බැංකුවෙන් ලබා ගෙන තිබූ අතර, 2023 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය තුළ ගෙවා තිබූ කාලින ණය, පොලී ප්‍රාග්ධනිත ණය සහ ඊට අදාළ පොලිය රු.2,828,293,385 ක් සමාගම විසින් මහජන බැංකුවට ගෙවීමට සිදුවීම මත 2023 මාර්තු 31 දිනට එක්සත් ජනපද ඩොලර් ණය ශේෂය ශ්‍රී ලංකා රුපියල් අගයට පරිවර්තනය කිරීමේදී රු. 2,811,891,329 ක් වූ විනිමය අලාභයක් සිදුව තිබීම සමාගමේ සමස්ථ අලාභයට හේතු වී තිබුණි. ඒ අනුව සමාගමේ අඛණ්ඩ පැවැත්ම සම්බන්ධව පවතින අවිනිශ්චිතතාව පිළිබඳව පැහැදිලි ඇඟවීමක් ඇති බව නිරීක්ෂණය විය. මෙම තත්ත්වය මග හරවා ගැනිම සඳහා 2021 ජූලි 30 වැනි දින පැවති විශේෂ මහා සභා රැස්වීමේ දී (EGM) සමාගම ක්‍රියාමාර්ග යෝජනා කර තිබුණද, එම විනිමය අලාභය අවම කිරිමේ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරිමට සමාගම අපොහොසත් වී තිබුණු අතර 2023 මාර්තු 24 දින පැවති විශේෂ මහා සභා රැස්වීමේදී ඒ සඳහා නව ව්‍යාපාරික ව්‍යාපෘති 06 ක් තවදුරටත් යෝජනා කර තිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 19 හි 57 (a) i (LKAS 19) ඡේදයට අනුව ආයතනය විසින් එහි පාරිතෝෂික පිළිබඳ ගිණුම්කරණ ප්‍රමිතයට අදාළව කටයුතු කරන විට එය ප්‍රක්ෂේපනය කරන ලද ඒකක ණය ක්‍රමයට අනුව (Actuarial Technique, the projected unit credit method) ගණනය කර ගිණුම්ගත කළ යුතු වුවද සමාගම විසින් රු.29,348,420 ක පාරිතෝෂික ගණනය කිරිම හා ගිණුම්ගත කිරීම අදාළ ගිණුම්කරණ ප්‍රමිතයට අනුව සිදු කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 37 (LKAS 37) හි ප්‍රතිපාදන වෙන්කිරිමේ අවිනිශ්චිත වගකිම් පිළිබඳ 14 වන ඡේදයට අනුව ආයතනයට වර්තමාන වගකිමක් ඇති අතිත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස සම්පත් පිටතට ගලායාමේ වගකිම ඇති විටක සහ එම ප්‍රමාණය පිළිබඳව විශ්වාසනිය ඇස්තමේන්තුවක් කළ හැකි විටක ඒ වෙනුවෙන් අවසන් මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන වෙන් කිරිම හා හෙළිදරව් කිරිම් කළ යුතු වුවද, සමාගමට එරෙහිව එහි සේවයේ නියුතුව සිටි සේවකයින් 10 දෙනෙකු පවරා තිබුණු නඩුවලට අදාළව 2022/2023 වර්ෂයේ අවසන් මූල්‍ය ප්‍රකාශන තුළ හෙළිදරව් කිරිමක් සිදු කර නොතිබුණි.

(ඈ) 2021/2022 වර්ෂයට අදාළ කුලියට ගත් නැව් මගින් ගල් අඟුරු ප්‍රවාහනය සඳහා දරන ලද වියදම (Charter Hire Expenses Coal Vessel) වන රු.5,572,187 ක් 2022/2023 ගිණුම් වර්ෂයේදී හඳුනාගෙන ඇති බව විගණනයේ දී අනාවරණය වූ අතර ඒ හේතුවෙන් 2021/2022 වර්ෂයේ අලාභය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා ඇති අතර LKAS 08 ගිණුම්කරණ ප්‍රමිතය 42 (ආ) අනුව හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශයේ ආරම්භක රඳවාගත් ඉපයීම්වලට අතීතයට බලපාන ලෙස පෙර වර්ෂයේ ගැලපීම් ලෙස ගැලපිය යුතු වුවත් එය 2022/2023 වර්ෂයේ ඍජු වියදම් යටතට ගලපා ඇති අතර ඒ හේතුවෙන් 2022/2023 වර්ෂයේ අලාභය එම ප්‍රමාණයෙන් වැඩියෙන් පෙන්නුම් කර තිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 සමාගමේ 2022/2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන සමාගමේ 2022/2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

සමාගමේ 2022/2023 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර

අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිත කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව්කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දූර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2007 අංක 7 දරන සමාගම් පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, 2007 අංක 7 දරන සමාගම් පනතේ 163 (2) වගන්තියේ සහ 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සමාගම පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ දක්වා ඇති නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවිය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සමාගම සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් ඍජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර, යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

	නීතිරීති / විධානයට යොමුව	**නිරීක්ෂණ**
(අ)	2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක. 01/2020 හි 11.1 ඡේදය	2023 මාර්තු 31 දිනට අදාළ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තාව විගණකාධිපති වෙත යොමු කිරීම ඉදිරි මුදල් වර්ෂයේ ජුනි 30 වන දිනට පෙර සිදුකළ යුතු වුවත්, සමාගම විසින් අබලි භාණ්ඩ 133ක් ඉවත් කිරීමට හා ඊට අදාළ අත්‍යාවශ්‍ය කාර්යයන් විගණනය දින වන විටත් සම්පූර්ණ කර නොතිබුණි.
(ආ)	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 03/2015 හා 2015 ජූලි 14 දිනැති චක්‍රලේඛය	අත්තිකාරම් නිකුත් කිරීමේදී කිසියම් විශේෂිත කාර්යයක් සඳහා මාණ්ඩලික තත්ත්වයේ නිලධාරීන්ට පමණක් එක් අවස්ථාවකදී රු.100,000ක උපරිමයක් දක්වා අත්තිකාරමක් ලබා දීමට ගණන්දීමේ නිලධාරියෙකුට හැකි වුවද, චක්‍රලේඛ උපදෙස්වලට අනුකූල නොවන ලෙස උපරිමය රු.500,000 දක්වා අත්තිකාරම් ලබාදී තිබුණි.
(ඇ)	2018 අංක 19 ජාතික විගණන පනතේ 16.2 වගන්තිය සහ 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ මෙහෙයුම් අත්පොතේ 6.6 වගන්තිය	ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ඇතුළත සමාගම විසින් මූල්‍ය ප්‍රකාශන සමඟ කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවද, සමාගමේ මූල්‍ය ප්‍රකාශන විගණනය වෙත ඉදිරිපත් කර තිබුණේ මාස දෙකකට වැඩි ප්‍රමාදයකින් යුතුව 2023 අගෝස්තු 16 දිනදීය.

(ඈ)	2021 නොවැම්බර් 16 දිනැති අංක. 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ මෙහෙයුම් අත්පොත 3.2 වගන්තිය	විධිමත් අනුමැතියකින් තොරව සමාගම විසින් සමාලෝචිත වර්ෂයේදී සංග්‍රහ දීමනාව, ප්‍රවාහන දීමනාව සහ පැමිණීමේ දිරි දීමනා වෙනුවෙන් එකතුව රු. 15,209,673 ක් ගෙවා තිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර සමාගමේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

(අ) 2016 ජනවාරි 21 දිනැති අංක. අමප/16/0035/737/003 දරන අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව සහ 2005 මැයි 06 දිනැති අංක. 415 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ විධිවිධානවලට අනුව, සියලුම රාජ්‍ය ආයතන භාණ්ඩ ආනයනය කළ යුත්තේ සී/ස ලංකා නැව් සංස්ථාව හරහා වන අතර එහිදී සමාගම, රාජ්‍ය ආයතනවලට ප්‍රමුඛත්වය ලබා දිය යුතුවේ. 2019 අප්‍රේල් 01 සිට 2023 මාර්තු 31 දක්වා වර්ෂ 4 තුළ රාජ්‍ය අංශයේ භාණ්ඩ ආනයනය කිරීමේ ආයතන ගණන සහ අවස්ථා ගණන පරීක්ෂා කිරීමේදී, සී/ස ලංකා නැව් සංස්ථාව හරහා භාණ්ඩ ආනයනය කිරීමේ ආයතන ගණන සහ අවස්ථා ගණන සාපේක්ෂව අඩුවෙමින් පවතින බව නිරීක්ෂණය විය. විස්තර පහත පරිදි වේ.

වර්ෂය	2019/20	2020/21	2021/22	2022/23
ආයතන ගණන	28	22	23	27
ආනයන වාර ගණන	2,357	1,925	1,300	821

(ආ) 2021 නොවැම්බර් 16 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ 01/2021 හි මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.3 ඡේදය ප්‍රකාරව උපාය මාර්ගික සැලැසුම් සකස් කළ යුතු වුවද, එපරිදි කටයුතු කර නොතිබුණි. 2018/2019 සිට 2022/2023 න් අවසන් පස් අවුරුදු සංයුක්ත සැලැස්ම ව්‍යාපාරික පරිසරයේ වෙනස් වීම්වලට අනුකූලව යාවත්කාලීන කිරීමට අධ්‍යක්ෂක මණ්ඩලය කටයුතු කර නොතිබුණි.

(ඇ) 2018/2019 - 2022/2023 සංයුක්ත සැලසුමේ 4.2 ඡේදයෙහි යෝජිත නව ව්‍යාපාරික සැලැසුම් 07 ක් දක්වා තිබුණි. ඒවායින් ක්‍රියාකාරකම් 05 ක් 2018/2019 සිට 2022/2023 වර්ෂ 05 ක් තුළ ළඟාවීමට සැලසුම් කර තිබුණු නමුත් එම ක්‍රියාකාරකම් වෙත ළඟාවී නොතිබුණු අතර නව ව්‍යාපාරික අවස්ථා හඳුනා ගැනීමටද කටයුතු කර නොතිබුණි.

(ඇ) සමාගම විසින් ආදායම් ප්‍රභවයන් සම්බන්ධයෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලසුම තුළ අර්ථාන්විත ලෙස ඉලක්ක හා කාර්යසාධන දර්ශක පිහිටුවීම සිදුකර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂයේ ඉලක්ක පිහිටුවීමේදී පසුගිය වර්ෂයේ සැලසුම් කළ ඉලක්ක හා සත්‍ය තත්ත්වය පිලිබඳව සැලකිලිමත් නොවී සමාගමේ කාර්යසාධන ඉලක්ක පිහිටුවීමේදී පහසුවෙන් ලගාකර ගත හැකි ඉලක්ක පිහිටුවා ඒ මත කාර්යසාධනය මැන දැක්වීමක් සිදු කර තිබුණි. මීට අමතරව සමාගම විසින් ආදායම් ප්‍රභව හදුනා ගැනීමේදී වර්ෂය තුළ ජනනය නොවන ආදායම් ප්‍රභවයන්ද ක්‍රියාකාරී සැලැස්ම තුළ අන්තර්ගත කර තිබුණි. විස්තර පහත පරිදි වේ.

ආදායම් ප්‍රභවය	ක්‍රියාකාරී සැලැස්ම අනුව		සත්‍ය කාර්යසාධනය		ආදායම් ප්‍රතිශතය
	ආදායම	වියදම	ආදායම	වියදම	(%)
ගල් අගුරු ප්‍රවාහනය	3,128	2,675	-	-	
වරලත් කුලී ආදායම	2,293	816	5,337	1,893	133%
Address Commission on Freight	72	-	-	-	
Address Commission on Lightering	472	-	314	-	-33%
ගල් අඟුරු සපයන නැව් සඳහා නියෝජිත සේවා සැපයීම	41		15		-63%
කන්ටේනර් තුළ බහාළුම් ප්‍රවාහනය	564	496	760	611	35%
රේගුවෙන් භාණ්ඩ නිෂ්කාශණය හා බෙදා හැරීම	20	12	67	47	235%

(ඉ) අංක 415 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ විධිවිධානවලට අනුව සී/ස ලංකා නැව් සංස්ථාව විසින් අත්හැරීමේ නිවේදනයක් නිකුත් කළයුතු වන්නේ රජයට වඩාත් වාසිදායක ලෙස ආනයන භාණ්ඩ ප්‍රවාහනය කිරීමට සමාගම අපොහොසත් වන අවස්ථාවකදී පමණි. සමාගමට දැරීමට සිදුවන නැව් කුලිය, සැපයුම්කරු එකඟවන ලද නැව් කුලියට වඩා වැඩිවන අවස්ථාවලදී ඒ බව අත්හැරීමේ නිවේදනයක් මගින් ආනයනකරුට දැන්විය යුතු වුවත්, නැව්ගත කිරීමෙන් අනතුරුව අත්හැරීම් නිවේදන ඉල්ලා සිටීම, හදිසි මිලදී ගැනීම

හේතුවෙන්, CIF මිල ගණන් මත ප්‍රසම්පාදනය පිරිනමා තිබීම හා වෙනත් හේතු මත සමාගම විසින් 2019/20 වර්ෂය තුළ 319 ක් ද 2020/21 වර්ෂයේදී 298 ක් ද , 2021/22 වර්ෂයේදී 185 ක් ද 2022/23 වර්ෂයේදී 118 ක් ද වශයෙන් චක්‍රලේඛයේ නියමයන්ට බැහැරව අත්හැරීම් නිවේදන නිකුත් කර තිබුණි.

(ඊ) පූර්ණ රාජ්‍ය හිමිකාරිත්වය ඇති සමාගමක් ලෙස රාජ්‍ය අංශයේ ආනයන භාණ්ඩ ප්‍රවාහනය තුළින් සමාගමේ ලාභදායිත්වය වර්ධනය කරගැනීම මෙන්ම, විදේශීය නැව් සමාගම් මගින් සිදු කෙරෙන රාජ්‍ය ආනයන තරඟකාරී නැව් ගාස්තු ක්‍රමයක් මත සමාගම වෙත නතුකර ගැනීමේ වගකීම සමාගම වෙත පැවරී තිබුණද සමාගමේ ප්‍රවාහන ගාස්තුව, ආනයනයට සම්බන්ධ සැපයුම්කරුවන්ගේ නැව් ගාස්තුවලට වඩා වැඩිවීම හේතුවෙන් 2019/2020 සිට 2022/23 වර්ෂය දක්වා වර්ෂ 4 තුළ පිළිවෙලින් මෙම අත්හැරීමේ නිවේදන 174 ක් , 163 ක්, 150 ක් සහ 67 ක් නිකුත් කර තිබුණි.

(උ) විදේශ කටයුතු අමාත්‍යාංශයට අදාළ රාජ්‍ය තාන්ත්‍රික නිලධාරීන්ගේ ආනයන සහ අපනයන ගමන් මළු බඩු බාහිරාදිය හැසිරවීම, ඇසුරුම් කිරීම, ප්‍රවාහනය හා නිෂ්කාෂණය සී/ස ලංකා නැව් සංස්ථාව විසින් සිදු කරනු ලබන අතර සේවාව සපයන ආයතනය වන සී/ස ලංකා නැව් සංස්ථාව විසින් අදාළ මිල ගණන් පිළිබඳ තීරණය ගත යුතු වුවද, එය විදේශ කටයුතු අමාත්‍යාංශයේ අධ්‍යක්ෂක ජනරාල්ගේ FA/OAM&D/HD/CSC/GEN හා 2023 ජනවාරි 25 දින දරන ලිපිය අනුව මිල ගණන් තීරණය කරනු ලබන බව හෙළිදරව් විය.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර සමාගමේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

(අ) 2020 නොවැම්බර් 10 සී/ස ලංකා නැව් සංස්ථාව සහ TERO MARINE ASIA PACIFIC PTE LTD සමඟ වසර 6 ක කාල සීමාවක් සඳහා සමාගමේ නෞකාවන් වෙනුවෙන් පරිගණක පාදක නැව් කළමනාකරණ පද්ධතියක් ක්‍රියාත්මක කිරීමට USD 102,800 කට ගිවිසුම් ගත වී තිබුණි. පළමු වර්ෂය තුළ අදියර 03 කින් මෙම පද්ධතිය ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබූ අතර එහි අත්තිකාරම් මුදල් වෙනුවෙන් රු.2,903,208 ක් (USD 15,400) සහ පද්ධති සැලසුම් පිළිගැනීම වෙනුවෙන් රු.1,563,087 ක් (USD 7,700) ක් ලෙස රු.4,466,295 ක් වැයකර නෞකා 02 සඳහා පද්ධතිය ස්ථාපිත කර වසර 3 ක කාලයක් ගත වී තිබුණද, මෙම පරිගණක පද්ධතිය ක්‍රියාත්මක නොකර පැවති අතර සමාගමේ ඉදිරි මෙහෙයුම් කටයුතු සඳහා යොදා ගන්නේද නැද්ද පිළිබඳව කළමනාකරණය විසින් සමාලෝචනයක් සිදු කර ප්‍රයෝජනයට ගැනීමට කටයුතු නොකිරීම හේතුවෙන් අදාල වියදම නිශ්කාර්ය වියදමක් බවට පත්ව තිබුණි.

(ආ) පුත්තලම ලක්විජය බලාගාරයට ගල් අඟුරු ප්‍රවාහනය කරන නැව්වලට විවිධ සේවා සැපයීම සඳහා ලංසු කැඳවා තෝරාගත් බෝට්ටු සේවා 02ක් වෙනුවෙන් තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාව අනුව ජාත්‍යන්තර වර්ගීකරණ සංගම් සම්මේලනයේ සාමාජික සංගමයකින් ලබාගත් වලංගු මුහුදු ගමන් සඳහා යෝග්‍යතා සහතිකය (Seaworthiness Certificate) හෝ වර්ගීකරණ සංගම් සහතිකය ඉදිරිපත් නොකිරීම, තාක්ෂණික ඇගයීමේදී සැලකිය යුතු ලෙස ප්‍රතිචාර නොදැක්වීම යන කරුණු හේතුවෙන් කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම නිර්දේශ කර නොතිබුණි. එසේම, ගොඩබිම බලයලත් නිලධාරී (Designated Person Ashore- DPA) විසින් බෝට්ටු පිළිබඳව සිදුකරන ලද භෞතික පරීක්ෂාවේදී මෙම ලංසුකරුවන් දෙදෙනා ලංසු කැඳවීමේ සඳහන් නිර්ණායකයන් සපුරා නොමැති බව තහවුරු වූ අතර 2014/15 වර්ෂයේ සිට මේ දක්වා මෙම බෝට්ටු සැපයුම්කරුවන් දෙදෙනා පමණක් ලංසු ඉදිරිපත් කරන තත්ත්වයක් පවතින බවත් මෙම සැපයුම්කරුවන් සම්බන්ධයෙන් පවතින සේවා විශ්වාසය මත පමණක් පදනම්ව සේවා අවශ්‍යතාවය සලකා ඉල්ලුම්කරුවන් දෙදෙනා ඉදිරිපත් කළ මිල ගණන්වලට 2022 සැප්තැම්බර් 21 දින මෙම ප්‍රසම්පාදනය පිරිනමා තිබුණි. 2023/24 වර්ෂයේද මෙම සේවාව සඳහා මෙම සැපයුම්කරුවන් දෙදෙනා වෙතම ප්‍රසම්පාදනය පිරිනමා තිබූ අතර බෝට්ටුවලට අදාළ ලංසු කැඳවීමේ නිර්ණායකයන් සපුරා නොමැති වීම හේතුවෙන් එහි ගමන් කරන නිලධාරීන්ගේ ආරක්ෂාව පිළිබඳව ගැටළුවක් පවතින බවත්, එම අඩුපාඩු හේතුවෙන් යම් අනතුරකදී රක්ෂණ ප්‍රතිලාභ ලබාගැනීමේ අවදානමක් පවතින බවත් නිරීක්ෂණය විය.

2.3 වෙනත් කරුණු

(අ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයට අනුව 2023 මාර්තු 31 දින වන විට සී/ස ලංකා නැව් සංස්ථාවට අයවිය යුතු වෙළඳ ණයගැති වටිනාකම රු. 2,070,761,878කි. එයින් රු. 1,034,044,153 ක ප්‍රමාණයක් වසර 4 කට වඩා වැඩි කාලයක් අය කර ගැනීමට නොහැකි ශේෂ වන අතර රු.257,530,960 ක් වසර 1 සිට 4 දක්වා අයකර ගැනීමට නොහැකි ශේෂ වන අතර 2022/2023 වර්ෂය තුළ ඇති වූ වෙළඳ ණයගැති වටිනාකම රු.779,186,765 ක් විය. ඉහත වෙළඳ ණයගැතියන් අතර දේශිය රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතන වලින් සමාගමට අයවිය යුතු මුදල් රු.1,525,359,729 ක් වන අතර එයින් ද රු.618,045,453 ක් වසර 03කට වඩා වැඩි පැරණි ණයගැතියන් වන බවත්, වසර 03 කට වඩා පැරණි විදේශිය හා අනෙකුත් වෙළඳ ණයගැතියන්ගෙන් 2023 මාර්තු 31 දිනට අයවිය යුතු ශේෂය රු.163,752,420 ක් බවත් අනාවරණය විය.

(ආ) Mv Ceylon Breeze නෞකාව අනතුරට පත්වීම සම්බන්ධයෙන් පහත කරුණු අනාවරණය විය.

i. Mv Ceylon Breeze නෞකාව 2020 වර්ෂයේදි චීනයේ පියැංගින් වරායේදී ධීවර යාත්‍රාවක (Fishing Vessel) ගැටීම හේතුවෙන් සමාගමට සිදු වූ සම්පූර්ණ අලාභය ආසන්න වශයෙන් රු. 16,999,188 ක් වී තිබුණි. මෙම නෞකාව රක්ෂණ ආවරණයට අදාළ ගිවිසුම අනුව

දැක්වෙන අඩුකිරිම් (Deductible) අගය USD100,000 ක් වීම හේතුවෙන් ඉහත අලාභය එම අගයට අඩුවීම නිසා සමාගම විසින් දරාගත යුතුවිය. තවද, එම නෞකාව නැවත වරක් 2021 ජූනි මස 06 දින සිංගප්පූරුවේ දී ලියෝපෝල්ඩ් නෞකාව සමග ගැටීම හේතුවෙන් සිදු වූ අනතුරට අදාළ අලාභය මෙම වාර්තාවේ දිනය වන විටත් ගණනය කර නොතිබුණි.

ii. නෞකා හානිවීම පිළිබඳව පරීක්ෂණයක් සිදු කර ඊට අදාළ වගකිව යුතු පාර්ශවයන් හඳුනා ගැනිමට කටයුතු කර නොමැති බවත් 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන මුදල් චක්‍රලේඛයේ 2.3 ඡේදය ප්‍රකාරව හානි සම්බන්ධයෙන් සම්පූර්ණ විස්තර රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවට වාර්තා කළයුතු වුවත් එපරිදි කටයුතු කර නොතිබුණු බවත් අනාවරණය විය.

(ඈ) සී/ස ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගම සහ සී/ස ලංකා නැව් සංස්ථාව අතර 2021 සැප්තැම්බර් 21 දින ඇතිකර ගත් ගල් අඟුරු ප්‍රවාහන ගිවිසුමේ 19 ඡේදයට අනුව සමාගම වෙත ගෙවිය යුතු ප්‍රමාදය / රඳවා තබා ගැනීම පිළිබඳ සියලුම හිමිකම්, පැටවීම හෝ මුදාහැරීම අවසන් වූ පසු, දින තිහක් (30) ඇතුළත ගෙවිය යුතු වූවද සමාගමට රු.3,728,788 ක වටිනාකම් සහිත ඉන්වොයිසි 2ක මුදල් 2023 අගෝස්තු 14 දින වන විටත් අයකර ගැනිමට නොහැකිව තිබුණි.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති.

සීමාසහිත ලංකා නැව් සංස්ථාව
මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විස්තීරණ ආදායම් ප්‍රකාශය

	සටහන්	2023 රු.	2022 රු.
ආදායම්	**4**	6,649,456,322	7,876,816,356
සෘජු මෙහෙයුම් වියදම්		(3,253,912,278)	(5,706,572,098)
දළ ලාභය		**3,395,544,044**	**2,170,244,258**
වෙනත් ආදායම්	**5**	835,579,200	471,548,197
පරිපාලන වියදම්	**40**	(246,344,628)	(263,944,537)
වත්කම් දුබල වීමට පෙර මෙහෙයුම්වලින් ලාභ		3,984,778,616	2,377,847,918
වත්කම් දුබල වීම		(84,096,715)	(177,070,299)
මෙහෙයුම්වලින් ලාභය	**6**	3,900,681,901	2,200,777,619
මූල්‍ය වියදම්	**7**	(4,381,840,810)	(6,808,841,215)
ආශ්‍රිත සමාගම්වල (බදු අඩු කළ) ලාභයේ කොටස	**14.2**	47,553,798	40,277,522
බද්දට පෙර (ලාභය / අලාභය)		**(433,605,111)**	**(4,567,786,074)**
ආදායම් බදු ආදායම් / (වියදම්)	**8**	(191,305,299)	-
වර්ෂය සඳහා ආදායම් බද්දෙන් පසු ලාභය / (අලාභය)		**(624,910,410)**	**(4,567,786,074)**
වර්ෂය සඳහා විලම්බිත බදු ගැළපුම්	**17**	(1,232,219,356)	(1,197,593,218)
ආදායම් බද්දෙන් හා විලම්බිත බදු ගැළපුමෙන් පසු වර්ෂය සඳහා ලාභය (අලාභය)		**(1,857,129,766)**	**(5,765,379,292)**
එක් කොටසක් අනුව මූලික හා තනුක කළ ඉපැයීම්	**9**	**(125)**	**(914)**
වර්ෂය සඳහා ලාභය / (අලාභය)		(1,857,129,766)	(5,765,379,292)
වෙනත් විස්තීර්ණ ආදායම්			
විකිණීම සඳහා වූ මූල්‍ය වත්කම්වල සාධාරණ අගය වෙනස්වීම මත ලාභය / (අලාභය)	**16.1**	(7,989,951)	36,062,107
ජීවගණක උපකල්පන වෙනස්කම්වලින් ඇති වූ ලාභය / (අලාභය)	**29.1**	2,179,262	7,581,992
ඉඩම් නියාදනය		(3,065,444)	-
ඉඩම් ප්‍රත්‍යාගණනය		241,863,000	-
ආශ්‍රිත සමාගම්වල වෙනත් විස්තීරණ ආදායමේ කොටස - (බදු අඩු කළ)	**14.2**	89,946,369	5,402,037
වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම්		**(1,534,196,530)**	**(5,716,333,156)**

අංක 48 සිට 86 දක්වා වූ පිටුවල සඳහන් ගිණුම් ප්‍රතිපත්ති හා සටහන්, මූල්‍ය ප්‍රකාශයන්හි අවශ්‍යම කොටසක් නියෝජනය කරයි.
.

සීමාසහිත ලංකා නැව් සංස්ථාව
මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන්	2023 රු.	2022 රු.
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	**10**	9,290,839,316	8,868,252,162
කෙරෙමින් පවත්නා ප්‍රාග්ධන වැඩ - ඉඩම්	**10.1**	315,610	-
කෙරෙමින් පවත්නා ප්‍රාග්ධන වැඩ - නෞකාවල වියළි තටාකාංගන වැඩ	**11**	-	119,621,698
අස්පෘෂ්‍ය වත්කම්	**12**	-	-
පාලිත සමාගම්වල ආයෝජන	**13**	-	-
ආශ්‍රිත සමාගම්වල ආයෝජන	**14**	569,950,345	432,803,300
විකිණීමට ඇති මූල්‍ය වත්කම්	**16**	47,693,210	55,683,161
විලම්බිත බදු වත්කම්	**17**	-	-
මුළු ජංගම නොවන වත්කම්		**9,908,798,481**	**9,476,360,322**
ජංගම වත්කම්			
තොග		470,903,927	310,846,104
වෙළඳ හා වෙනත් ලැබීම් නියමිත	**18**	951,582,262	1,472,984,001
ව්‍යවස්ථාපිත ලැබීම් නියමිත	**19**	8,486,749	8,481,465
කල්පිරීම් මත තැබූ ආයෝජන	**20**	464,999,999	447,289,305
කෙටි කාලීන ආයෝජන	**21**	26,268,205	25,533,587
මුදල් හා මුදල් සාම්‍යයන්	**22**	1,305,653,577	729,586,947
මුළු ජංගම වත්කම්		**3,227,894,718**	**2,994,721,409**
මුළු වත්කම්		**13,136,693,199**	**12,471,081,730**
කොටස් සහ බැරකම්			
කොටස්			
ප්‍රකාශිත ප්‍රාග්ධනය	**23**	50,000,000	50,000,000
කොටස් ප්‍රාග්ධනය සඳහා දායකත්වය	**24**	543,939,497	543,939,497
ප්‍රාග්ධන සංචිත	**25**	767,029,766	767,029,766
ප්‍රත්‍යාගණන සංචිත	**26**	241,863,000	3,065,444
විකිණීම සඳහා පවත්නා මූල්‍ය වත්කම් සංචිතය		42,213,018	50,202,969
රඳවාගත් ඉපැයුම්		(10,855,139,608)	(9,328,463,864)
මුළු කොටස්		**(9,210,094,328)**	**(7,914,226,189)**
ජංගම නොවන බැරකම්			
දිගු කාලීන ණයට ගැනීම්	**28**	16,111,945,799	16,032,891,614
විශ්‍රාම ප්‍රතිලාභ බැදියා - පාරිතෝෂික	**29**	29,348,420	35,244,807
විලම්බිත බදු බැඳියා	**17**	2,237,360,024	1,005,140,668
මුළු ජංගම නොවන බැරකම්		**18,378,654,242**	**17,073,277,089**
ජංගම බැරකම්			
වෙළඳ හා අනෙකුත් ගෙවීම් නියමිත	**30**	1,792,767,053	1,555,707,720
කෙටිකාලීන ණයට ගැනීම්	**31**	1,862,180,167	1,657,034,724
ව්‍යවස්ථාපිත ගෙවීම් නියමිත	**32**	266,576,020	70,699,752
උපචිත වියදම්	**33**	46,610,045	28,588,636
මුළු ජංගම බැරකම්		**3,968,133,284**	**3,312,030,830**
මුළු කොටස් හා බැරකම්		**13,136,693,199**	**12,471,081,730**

අංක 48 සිට 86 දක්වා වූ පිටුවල සඳහන් ගිණුම් ප්‍රතිපත්ති හා සටහන්, මූල්‍ය ප්‍රකාශයන්හි අවශ්‍යම කොටසක් නියෝජනය කරයි.
2007 අංක 07 දරන සමාගම් පනතේ නියමයන්ට අනුකූලව මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කෙරේ.

වැඩ බලන සාමාන්‍යාධිකාරි

සහකාර සාමාන්‍යාධිකාරි - මූල්‍ය

මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කිරීමේ හා ඉදිරිපත් කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය දරයි.
අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අනුමත කර අත්සන් තබන ලදී.

අධ්‍යක්ෂ

අධ්‍යක්ෂ

සීමාසහිත ලංකා නැව් සංස්ථාව

2023 මාර්තු මස 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

කොටස් හිමිකම් වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය

	ප්‍රකාශිත ප්‍රාග්ධනය	කොටස් ප්‍රාග්ධනය සඳහා දායකත්වය	ප්‍රාග්ධන සංචිතය	ප්‍රත්‍යාගණන සංචිතය	විකිණීමට ඇති මූල්‍ය වත්කම් සංචිතය	රඳවාගත් ඉපැයීම්	එකතුව
	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.
2021 අප්‍රේල් 01 දිනට ශේෂය	50,000,000	543,939,497	767,029,766	3,065,444	14,140,862	(3,419,789,063)	(2,041,613,494)
ඉකුත් වර්ෂයේ ගැළපුම්						(156,279,539)	(156,279,539)
වර්ෂය සඳහා ලාභය	-	-	-	-	-	(5,765,379,292)	(5,765,379,292)
වෙනත් විස්තීරණ ආදායම්	-	-	-	-	36,062,107	12,984,029	49,046,136
2022 මාර්තු 31 දිනට ශේෂය	**50,000,000**	**543,939,497**	**767,029,766**	**3,065,444**	**50,202,969**	**(9,328,463,864)**	**(7,914,226,190)**
ඉකුත් වර්ෂයේ ගැළපුම්						238,328,391	238,328,391
වර්ෂය සඳහා අලාභය	-	-	-	-	-	(1,857,129,766)	(1,857,129,766)
ඉඩම් නියාදනය				(3,065,444)			(3,065,444)
ඉඩම් ප්‍රත්‍යාගණනය				241,863,000			241,863,000
වෙනත් වීස්තීරණ ආදායම්	-	-	-	.	(7,989,951)	92,125,631	84,135,680
2023 මාර්තු 31 දිනට ශේෂය	**50,000,000**	**543,939,497**	**767,029,766**	**241,863,000**	**42,213,018**	**(10,855,139,608)**	**(9,210,094,328)**

අංක 48 සිට 86 දක්වා වූ පිටුවල සඳහන් ගිණුම් ප්‍රතිපත්ති හා සටහන්, මූල්‍ය ප්‍රකාශයන්හි අවශ්‍යාම කොටසක් නියෝජනය කරයි.

සීමාසහිත ලංකා නැව් සංස්ථාව
මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

		2023	2022
		රු.	රු.
මෙහෙයුම් කටයුතුවලින් මුදල් ප්‍රවාහ			
බද්දට පෙර ලාභය / අලාභය		(433,605,111)	(4,567,786,074)
ගැළපුම් කිරීම් :			
ක්ෂයවීම්		438,441,316	420,194,198
ස්ථාවර වත්කම් නියාදනය කිරිමේ දී ලාභය /අලාභය		-	-
පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන		5,892,015	4,990,179
ලාභාංශ ආදායම්		(142,606)	-
ආශ්‍රිත සමාගම්වල (බදු අඩු කළ) ලාභයේ කොටස		(47,553,798)	(40,277,522)
වෙළඳ ණය ගැතියන් දුබලවීම වෙනුවෙන් ප්‍රතිපාදන		84,096,715	177,070,299
ආදායම් බදු සඳහා ප්‍රතිපාදන		(191,305,299)	
විනිමය අලාභ /(ලැබීම්)		1,580,013,648	5,626,477,113
ඉකුත් වර්ෂයේ ගැළපුම් කිරීම්		(43,328,774)	(156,279,539)
බොල් ණය කපා හැරීම්		-	(15,013,046)
රක්ෂණ ලැබීම් නියමිත සඳහා ප්‍රතිපාදන		-	(81,790,947)
පොලී ආදායම්		(172,649,328)	(45,379,467)
පොලී වියදම්		1,569,949,481	727,535,758
කාරක ප්‍රාග්ධනයේ වෙනස්වීම්වලට පෙර මෙහෙයුම් ලාභය		**2,789,808,261**	**2,049,740,953**
තොග (වැඩි වීම) / අඩු වීම		(160,057,823)	(50,188,062)
වෙළඳ හා වෙනත් ලැබීම් නියමිත (වැඩි වීම) / අඩු වීම		521,401,740	(489,526,366)
වෙළඳ හා වෙනත් ගෙවීම් නියමිත වැඩි වීම / (අඩු වීම)		237,059,333	723,729,212
ව්‍යවස්ථාපිත ගෙවීම් නියමිත (වැඩි වීම) / අඩු වීම		(5,284)	2,124,686
ව්‍යවස්ථාපිත ගෙවීම් නියමිත වැඩි වීම / (අඩු වීම)		195,876,268	(1,870,408)
උපචිත වියදම් වැඩි වීම / (අඩු වීම)		18,021,410	(620,131)
මෙහෙයුම් කටයුතුවලින් උත්පාදිත මුදල්		**3,602,103,905**	**2,233,389,884**
ගෙවූ පාරිතෝෂික		(9,609,140)	(2,569,705)
ගෙවූ පොලී		(736,111,518)	(689,860,773)
ගෙවූ බදු		-	-
මෙහෙයුම් කටයුතුවලින් ලද ශුද්ධ මුදල		**2,856,383,247**	**1,540,959,405**
ආයෝජන කටයුතුවලින් මුදල් ප්‍රවාහ			
ස්ථාවර වත්කම් මිලදී ගැනීම		(23,799,142)	(44,312,659)
නාවික යාත්‍රා සඳහා ගෙවීම් / වියළි තටාකාංගන පිරිවැය		(319,252,224)	(119,621,698)
කෙරෙමින් පවත්නා ප්‍රාග්ධන වැඩ - ඉඩම්		(315,610)	-
ස්ථාවර වත්කම් නියාදනය කිරිමෙන් ලත් මුදල්		-	-
කල් පිරිමට තැබූ මූල්‍ය වත්කම්වලින් (ආයෝජනවලින්) ලද ශුද්ධ මුදල		(17,710,694)	(326,673,409)
කෙටි කාලීන ආයෝජනවල ශුද්ධ ආයෝජන		(734,618)	(693,978)
ලද පොලිය		173,074,704	44,764,963
ලද ලාභාංශ		495,728	353,122
ආයෝජන කටයුතුවල යෙද වූ ශුද්ධ මුදල්		**(188,241,856)**	**(446,183,657)**
මූල්‍යකරණ කටයුතුවලින් ලද මුදල් ප්‍රවාහය			-
නාවික යාත්‍රා ණය නැවත ගෙවීම		(2,092,074,761)	(1,213,855,701)
මූල්‍යකරණ කටයුතුවලින් ශුද්ධ මුදල්		**(2,092,074,761)**	**(1,213,855,701)**
මුදල් හා මුදල් සාම්‍යයන්හි ශුද්ධ වැඩිවීම		**576,066,630**	**(119,079,953)**
වර්ෂය ආරම්භයේ දී මුදල් හා මුදල් සාම්‍යයන්		**729,586,947**	**848,666,900**
වර්ෂය අවසානයේ දී මුදල් හා මුදල් සාම්‍යයන්	සටහන් 22	**1,305,653,577**	**729,586,947**

2023 මාර්තු මස 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ මූල්‍ය ප්‍රකාශවලට පැහැදිලි කිරීමේ සටහන්.

1. සාමාන්‍යය තොරතුරු

1.1 අස්ථිතිය සහ නීතිමය ආකෘතිය

1971 අංක 11 දරන ලංකා නැව් සංස්ථා පනත යටතේ පිහිටුවන ලද ලංකා නැව් සංස්ථාව, 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ 1992 ජූනි මස 01 වන දින සිට ලියාපදිංචි අංක (PBS/CGB)121 යටතේ සංස්ථාගත කරන ලදී.

සීමාසහිත ලංකා නැව් සංස්ථාව, 2007 අංක 07 දරන නව සමාගම් පනත ප්‍රකාරව, 2008 මාර්තු මස 10 වන දින සිට අංක PB227 දරන ලියාපදිංචි කිරීම යටතේ නැවත ලියාපදිංචි වූ අතර, සමාගමේ ලියාපදිංචි කාර්යාලය සහ එහි ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය, අංක 27, ශ්‍රීමත් රාසික් ෆරීඩ් මාවත, කොළඹ 01 යන ලිපිනයෙහි පිහිටි යෝනක ඉස්ලාමීය සංස්කෘතික නිකේතන ගොඩනැගිල්ලෙහි ස්ථානගත වී ඇත.

1.2 ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම් කටයුතුවල ස්වභාවය

වර්ෂය තුළ, සමාගමේ ප්‍රධාන ක්‍රියාකාරකම් වූයේ, නැව්ගත කිරීමේ කටයුතු හා නෞකාවල හිමිකාරිත්වය දැරීම, නාවික යාත්‍රා කුලියට දීම සහ යාත්‍රාමය නොවන පොදු ප්‍රවාහන මෙහෙයුම් කටයුතු ඉටු කිරීම සහ භාණ්ඩ සම්පාදනය ආශ්‍රිත කාර්යයන් හා සම්බන්ධ කළමනාකරණ සේවා සැපයීමෙහි නියැලීමයි.

සමාලෝචිත මූල්‍ය වර්ෂය තුළ, සමාගමේ ප්‍රධාන ක්‍රියාකාරකම්වල ස්වභාවයෙහි සැලකිය යුතු වෙනස්කම් කිසිවක් සිදු නොවී ය.

1.3 සේවා නියුක්තිකයන් සංඛ්‍යාව

2023 මාර්තු මස 31 වන දිනට සමාගමේ මුළු සේවක සංඛ්‍යාව 106 දෙනෙකුගෙන් සමන්විත වූයේ ය. (2022 මාර්තු මස 31 වන දිනට - 117)

1.4 ගිණුම් වාර්තා කිරීමේ දිනය

සමාගමේ මූල්‍ය වාර්තාකරණ කාල පරිච්ඡේදය, මාර්තු මස 31 වන දිනෙන් අවසන් වන අතර ආශ්‍රිත සමාගම්වල මූල්‍ය වාර්තාකරණ කාල පරිච්ඡේදය අවසන් වන්නේ, දෙසැම්බර් මස 31 වන දිනයෙනි. සමාගමේ ගිණුම් වාර්තාකරණ කාල පරිච්ඡේදය සහ ආශ්‍රිත සමාගම්වල ගිණුම් වාර්තාකරණ කාල පරිච්ඡේදය අතර සිදු වන යම් සැලකිය යුතු ගනුදෙනු සහ සිදුවීම් වෙතොත්, සමාගම විසින් ඒවා ස්වකීය ගිණුම් තුළ ගළපා ගනු ලබයි.

1.5 මූල්‍ය ප්‍රකාශ අනුමත කිරීම

මෙම මූල්‍ය ප්‍රකාශ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරනු ලැබ, 2023 ජූලි මස 18 වන දින ඒවා නිකුත් කිරීම සඳහා අවසර දෙන ලදී.

2. පිළියෙළ කිරීමේ පදනම

2.1 අනුකූලතා ප්‍රකාශය

විස්තීරණ ආදායම් ප්‍රකාශය, මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, කොටස් ස්කන්ධය වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ මූල්‍ය ප්‍රකාශවලට කෙරෙන සටහන් ඇතුළත් සමාගමේ මූල්‍ය ප්‍රකාශය, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් පනවනු ලැබ ඇති ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට (ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති - SLFRS සහ ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිති - LKAS) අනුකූලව පිළියෙළ කර, 2007 අංක 7 දරන සමාගම් පනතේ නියමයන් ප්‍රකාරව.ඉදිරිපත් කර ඇත.

2.2 ගණනය කිරීමේ පදනම

සමාගමේ මූල්‍ය ප්‍රකාශ, සාධාරණ අගය අනුව මනිනු ලැබ විකිණීම සඳහා පවත්නා මූල්‍ය වත්කම් ලෙස නම් කර ඇති ලැයිස්තුගත ආයෝජනය කිරීම් සහ ඉඩම් ප්‍රත්‍යාගණනය කිරීම් විෂයයෙහි හැර, ඓතිහාසික පිරිවැය සම්මුතිය යටතේ පිළියෙළ කර ඇත. මූල්‍ය ප්‍රකාශවලට බලපාන උද්ධමනීය සාධක සඳහා ගැළපීම් සිදු කර නොමැත.

2.3 සංසන්දනාත්මක සංඛ්‍යා

මූල්‍ය ප්‍රකාශ මගින් පූර්ව කාල පරිච්ඡේදය සම්බන්ධයෙන් සංසන්දනාත්මක තොරතුරු සපයයි. මූල්‍ය ප්‍රකාශ තුළ යම් ගිනුම්කරණ ප්‍රතිපත්තියක ප්‍රත්‍යාවේක්ෂ යොදා ගැනීමක්, ප්‍රත්‍යාවේක්ෂ පුනප්‍රකාශයක් හෝ අයිතමවල ප්‍රතිවර්ගීකරණයක් ඇති විට, සමාගම අදාළ ඉකුත් කාල පරිච්ඡේදය ආරම්භයේ දී එහි මූල්‍ය තත්ත්වය පිළිබඳ අතිරේක ප්‍රකාශයක් ඉදිරිපත් කරයි.

2.4 කෘත්‍යාත්මක ඉදිරිපත් කිරීමේ මුදල් ඒකකය

සමාගමේ මූල්‍ය ප්‍රකාශවල ඇතුළත් විෂයාංග අයිතම මනිනු ලබන්නේ, සමාගම ක්‍රියාත්මක වන ප්‍රාථමික ආර්ථික පරිසරයේ මුදල් (කෘත්‍යාත්මක ව්‍යවහාර මුදල්) උපයෝගි කර ගනිමින් ඒවායේ ආසන්නතම රුපියල් අගයට වටරවුම් වන ආකාරයට ය.

මෙම මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කරනු ලබන්නේ, සමාගමේ කෘත්‍යාත්මක සහ ඉදිරිපත් කිරීමේ මුදල් වර්ගය වන ශ්‍රී ලංකා රුපියල් (රු.) වලිනි.

2.5 ඇස්තමේන්තු සහ තීන්දු භාවිතා කිරීම

ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරන ප්‍රමිතිවලට සහ ලංකා ගිණුම් ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේ දී, කළමණාකාරිත්වය විසින් ගිණුම්කරණ ප්‍රතිපත්ති කෙරෙහි සහ වාර්තා කරනු ලැබ ඇති වත්කම්, බැරකම්, ආදායම් හා වියදම් විෂයයෙහි බලපාන තීන්දු තීරණ, ඇස්තමේන්තු සහ උපකල්පන යොදා ගැනීම අවශ්‍ය වේ. අදාළ තථ්‍ය ප්‍රතිඵලය, මෙම ඇස්තමේන්තුවලට වඩා වෙනස් විය හැකි ය.

ඇස්තමේන්තු සහ වැදගත් උපකල්පන අඛණ්ඩ පදනමක් මත සමාලෝචනය කෙරේ. අදාළ ඇස්තමේන්තු ප්‍රතිශෝධනය කරන කාල පරිච්ඡේදය තුළ දී සහ ඒවා බලපෑමට ලක්වන ඕනෑම අනාගත කාල පරිච්ඡේදයක දී ගිනුම්කරණ ඇස්තමේන්තු තුළ ඊට අදාළ සංශෝධන හඳුනා ගැනේ.

2.6 වැදගත් බව සහ සමාහාරය

සමාන විෂයාංග අයිතමවලට අයත් එක් එක් වැදගත් පන්ති, මූල්‍ය ප්‍රකාශවල වෙන වෙනම ඉදිරිපත් කර ඇත. අසමාන ස්වභාවයේ විෂයාංග අයිතම හෝ කර්තව්‍යයන්, ඒවා වැදගත් ලෙස නොගැනෙන්නේ නම්, වෙන් වෙන් වශයෙන් ඉදිරිපත් කර ඇත.

2.7 ව්‍යාපාරිකව පවත්වා ගත හැකි බව (අඛණ්ඩ පැවැත්ම)

මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කර ඇත්තේ, සමාගම ව්‍යාපාරික වශයෙන් ඉදිරියට යනු ඇතැයි යන පදනම මත පිහිටා ය. 2023 මාර්තු මස 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සමාගම රුපියල් මිලියන 1,857.12 ක ශුද්ධ අලාභයක් (2022 මාර්තු මස 31 වන දිනට රුපියල් මිලියන 5,765.37) ලබා ඇත. ශේෂ පත්‍ර දිනය වන විට, සමාගමේ ශුද්ධ වත්කම් වටිනාකම, සමාගමේ ප්‍රකාශිත ප්‍රාග්ධනය (රුපියල් මිලියන 50) ඉක්මවා ගොස් ඇති අතර, ඒ අනුව, සමාගමේ ප්‍රාග්ධන තත්ත්වයෙහි බරපතල අලාභයක් පවතී. වාර්තා කිරීමේ දිනට සමාගමේ ශුද්ධ වත්කම් තුළ රුපියල් 9,210,094,328 ක් වූ ඍණ අගයක් (2021/2022 - රු. 7,914,226,190 ඍණ අගයක්). නිරූපණය වන අතර, ඉහත මූල්‍ය ප්‍රතිඵලය කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපෑ හේතු පහත දැක්වෙන පරිදි වන්නේ ය ;

- නාවික යාත්‍රා ණය සඳහා ඉහළ පොලී ප්‍රමාණයක් ගෙවීම.
- විස්තීරණ ආදායම් ප්‍රකාශය තුළ අයගත කරනු ලබන යාත්‍රා දෙක විෂයයෙහි සිදු කරනු ලබන්නා වූ ක්ෂයවීම්.
- එක්සත් ජනපද ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණය වීමේ හේතුව මත සිදුවූ සුවිශේෂී විනිමය පාඩුව විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ සඳහන් වීම.
- 2016/17 සිට 2022/23 දක්වා බද්දෙන් පසු ශුද්ධ අලාභයක් සිදුවීම. කෙසේ වෙතත්, ඉහත සඳහන් කර ඇති සාධක අනුව, ලංකා නැව් සංස්ථාවට ව්‍යාපාරික වශයෙන් අඛණ්ඩව ඉදිරියට යාමට ඇති හැකියාව සම්බන්ධයෙන් සැලකිය යුතු අවිනිශ්චිතතාවයක් ඇති කරන්නේ වුව ද, පහත දැක්වෙන සමනය කිරීමේ සාධක මත පදනම්ව, අඛණ්ඩ ව්‍යාපාරයක් ලෙස නොකඩවා ඉදිරියට යාමට සංස්ථාවට ඇති හැකියාව සලකා බලන කළ, තම ව්‍යාපාර කාර්යයන් ඇවර කිරීමට හෝ තම වෙළඳ කටයුතු නතර කිරීමට හෝ සංස්ථාව අදහස් නොකරයි.
- ලංකා නැව් සංස්ථාව යනු පූර්ණ වශයෙන්ම රජය සතු ව්‍යාපාරික ආයතනයක් වන අතර භාණ්ඩාගාර ඇපකරයක් සහිතව 2034 වර්ෂයේ ජූනි මස 03 වන දින දක්වා පවතින ඇමරිකානු ඩොලර් 71,910,464.32 ක් වූ ප්‍රමාණයේ නැව් ණය මුදල් ප්‍රදානයක් ද ලැබ සිය ව්‍යාපාරික කටයුතු පවත්වා ගෙන යයි.
- සමාගම විසින් බැංකුවට ගෙවනු ලැබිය යුතු ණය ප්‍රාග්ධනය සහ පොලී ගෙවීම් පැහැර හැර නොමැති අතර අදාළ සම්පූර්ණ පොලී ප්‍රමාණය සහ ප්‍රාග්ධන වාරිකය, ඒවා ගෙවීමට නියමිත වන දිනය වන විට බැංකුව වෙත නොකඩවා ලබා දීමට කටයුතු කර ඇත.
- පැරණි යාත්‍රා සේවයෙන් ඉවත් කිරීම සහ නව යාත්‍රා ඉදිකිරීම් අඩුවීම යන කරුණු, සැපයුමේ සහ ඉල්ලුමේ පවත්නා අසමතුලිතතාවය සාමාන්‍යකරණය කරනු ඇති අතර එහි ප්‍රතිඵලයක් ලෙස, 2022/2023 වර්ෂයේ සිට නැව් කටයුතු වෙළඳපොළෙහි ධනාත්මක හැරවුමක් සංස්ථාව විෂයයෙහි සිදුව ඇත.
- ලංකා නැව් සංස්ථාව විසින් යාත්‍රා පිළිබඳව කොන්දේසි සහිත වාර්තා ලබාගෙන ඇති අතර එහි සඳහන් වන්නේ, "අදාළ යාත්‍රා සාමාන්‍ය වශයෙන් හොඳ තත්වයෙන් සහ මනාව නඩත්තු කරන ලද මට්ටමකින් පැවති අතර ඒවායේ සියලුම උපකරණ කාර්යක්ෂම සහ හොඳින් ක්‍රියා කළ හැකි තත්ත්වයේ තිබිණි. එම යාත්‍රා, සුප්‍රසිද්ධ සහ විශ්වාසදායක නමක් දිනාගත් යුරෝපීය නිෂ්පාදන සහිත එන්ජින්වලින් මෙන්ම අනෙකුත් යන්ත්‍ර සූත්‍රවලින් ද මනාව සමන්විත කර පැවතුණි. ඒවායේ සියලු උපකරණ ද, හොඳ ක්‍රියාකාරී තත්වයක තිබුණි. එම නෞකා විෂයයෙහි උපකල්පනය කරනු ලබන තාක්ෂණික ආයු කාලය වන වසර 19 ක් වූ කාල පරිච්ඡේදය වෙත මෙම යාත්‍රාවලට ළඟා විය හැකි බව නිගමනය කළ හැකි විය." යනුවෙනි. මෙමගින් සනිටුහන් වනුයේ, සංස්ථාව විසින් තාක්ෂණමය කාර්යක්ෂමතාවයෙන් යුත් උසස් ප්‍රමිතියක් සහිතව ස්වකීය යාත්‍රා වෘත්තීයමය ලෙස සහ කාර්යක්ෂමතාවයෙන් යුක්තව කළමනාකරණය කරනු ලැබ ඇති බව ය. තවද, මෙම නෞකාවලට තම අපේක්ෂිත ආයු කාලය සැපිරීමෙහිලා ඇති හැකියාව ද ඉන් ගෙන හැර දක්වයි.
- ලංකා නැව් සංස්ථාව සතු සිලෝන් බ්‍රීස් හා සිලෝන් ප්‍රින්සස් නමැති නෞකා දෙක සම්බන්ධයෙන් ජාත්‍යන්තර නැව් කුලී සැපයුම්කරු ලෙස කටයුතු කිරීමේ කාර්යය සඳහා වසර දෙකක කාලයක් වෙනුවෙන් ලංකා නැව් සංස්ථාව සහ M/S Wallem Shipping Singapore Pte Ltd (Commercial) නම් වූ සමාගම අතර වාණිජ කළමනාකරණ ගිවිසුමකට එළඹ තිබේ. එබැවින්, මෙමගින් ජනනය වන මුදල් ඉපැයුම් ප්‍රවාහය, අදාළ ණය වාරික, ඒවා ගෙවීමට නියමිත වන අවස්ථාවේ දීම, නිසි ලෙස ගෙවා සේවා කරනු පිණිස ඉඩ ප්‍රස්ථාව සලසා දෙනු ඇත.
- මෙහෙයුම් සහ පරිපාලන වියදම් අඛණ්ඩ පදනමක් මත පාලනය කිරීම මගින් යම් ධනාත්මක බලපෑමක් ලංකා නැව් සංස්ථාව වෙත ලඟා කර දී තිබේ.

3. සැලකිය යුතු ගිනුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශය

මෙම මූල්‍ය ප්‍රකාශ, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරනු ලැබ ඇති ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරන - SLFRS ප්‍රමිතීන්ට සහ ශ්‍රී ලංකා ගිණුම් - LKAS ප්‍රමිතීන්ට අනුකූලව පිළියෙළ කර ඇත. මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කිරීමෙහිලා යොදා ගනු ලැබ ඇති ප්‍රධාන ගිණුම්කරණ ප්‍රතිපත්ති පහත ගෙන හැර දක්වා ඇත. මෙම ප්‍රතිපත්ති, අන්කවර හෝ ආකාරයකින් සඳහන් කර ඇත් නම් මිස, ඉදිරිපත් කර ඇති සියලුම වර්ෂ සඳහා සුසංගත වන ලෙස අදාළ කර ගෙන ඇත.

3.1 විදේශ ව්‍යවහාර මුදල් ගනුදෙනු / පරිවර්තන

විදේශ ව්‍යවහාර මුදල් හා සම්බන්ධ ගනුදෙනු ශ්‍රී ලංකා රුපියලට පරිවර්තන කරනු ලබන්නේ, අදාළ ගනුදෙනු දිනයේ දී පවත්නා විදේශ විනිමය අනුපාතිකය අනුව ය. මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ දිනට විදේශ මුදල්වලින් සඳහන් වන මුදල්මය වත්කම් සහ බැරකම්, එම දිනයට පවත්නා අදාළ විදේශ විනිමය අනුපාත ප්‍රමාණනය අනුව ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කෙරේ. එම පරිවර්තනය මත පැන නගින විදේශ විනිමය වෙනස්කම්, ලාභ හෝ අලාභය තුළ හඳුනා ගැනේ.

ඓතිහාසික පිරිවැය අනුව සඳහන් කරනු ලබන විදේශ ව්‍යවහාර මුදල් වර්ගවල මුදල්මය නොවන වත්කම් සහ බැරකම්, අදාළ ගනුදෙනුව සිදු වන දිනට පවත්නා විදේශ විනිමය අනුපාත ප්‍රමාණනය අනුව ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කෙරේ.

3.2 ලාභ හෝ අලාභ සහ අනෙකුත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

ලාභ හෝ අලාභ සහ අනෙකුත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශය ඉදිරිපත් කිරීමේ කාර්යය සඳහා වියදම් ආශ්‍රිත කෘත්‍යාත්මක ක්‍රමය අනුගමනය කරනු ලැබේ. මක්නිසාදයත්, එය සමාගමේ කාර්ය සාධනයේ මූලිකාංග සාධාරණ ලෙස නියෝජනය කරන බැවිනි.

3.2.1 ආදායම

සමාගම විසින් උපයා ගනු ලබන ආදායමට මුහුදු යාත්‍රා ගමන් ආදායම, ස්වසන්තක යාත්‍රාවලින් නැව් භාණ්ඩ ප්‍රවාහනය කිරීමේ ආදායම, තමන්ගේම යාත්‍රා කුලියට සපයා දීම මගින් ලැබෙන කුලී නැව් ආදායම, ගල් අඟුරු යාත්‍රාවලින් ලැබෙන නැව් කුලී ආදායම, භාණ්ඩ නිෂ්කාශනය සහ ඒවා බෙදාහැරීම මගින් ලැබෙන ආදායම සහ නියෝජිතායතන හා ඇමතුම් කොමිස් මුදල් ආදායම ඇතුළත් වේ.

භාණ්ඩ හෝ සේවා ගනුදෙනුකරුවන් සමඟ එළඹෙන ගිවිසුම්වලින් ලැබෙන ආදායම හඳුනා ගනු ලබන්නේ, එකී භාණ්ඩවල හෝ සේවාවල පාලනයේ හුවමාරු කිරීම වෙනුවෙන් හිමිකම් කිසිවක් ලැබීමට සමාගම අපේක්ෂා කරන යම් ප්‍රතිෂ්ටාවක් පිළිබිඹු කෙරෙන අගයක් මත ඒවායේ පාලනය ගනුදෙනුකරු වෙත පවරා දෙනු ලබන අවස්ථාවේදී ය.

ආදායම් කොන්ත්‍රාත්තු සඳහා වන ගනුදෙනු විෂයයෙහි මිල තීරණය කිරීමේ දී, ඒ ආශ්‍රිත විචල්‍ය ප්‍රතිෂ්ටාවන්හි බලපෑම් ද, සැලකිය යුතු මූල්‍යකරණ අංගවල පැවැත්ම ද, මුදල් නොවන සලකා බැලීම් මෙන්ම ගනුදෙනුකරු විෂයයෙහි කෙරෙන සලකා බැලීම් ද (ඒවා ඇත්නම්) සම්බන්ධයෙන් වන කරුණු කෙරෙහි සමාගම සිය අවධානය යොමු කරයි.

ආයතන විසින් තම ගනුදෙනුකරුවන් සමඟ ගිවිසුම්වලට එළඹීම සඳහා ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ - SLFRS 15 ප්‍රමිතියෙහි දක්වා ඇති ආදර්ශ ආකෘතියේ එක් එක් පියවර යොදා ගැනීමේ දී, ඒ සම්බන්ධයෙන් අදාළ සියලු කරුණු සහ අවස්ථානුගත තත්වයන් සැලකිල්ලට ගනිමින් ස්වකීය නිශ්චයමතිය ක්‍රියාවට නැංවිය යුතු බවට එමගින් නියම කර ඇත. කොන්ත්‍රාත්තුවක් ලබා ගැනීමේ වර්ධක පිරිවැය සහ කොන්ත්‍රාත්තුවක් ඉටු කිරීමට සෘජුවම අදාළ වන වියදම් හා සම්බන්ධ ගිණුම්කරණ කාර්යය ද එම ප්‍රමිතියෙහි නිශ්චිතව සඳහන් වේ.

ආදායම හඳුනා ගනු ලැබීමට පෙර පහත සඳහන් නිශ්චිත හඳුනා ගැනීමේ නිර්ණායක ද සපුරාලිය යුතු ය ;

(අ) මුහුදු යාත්‍රා ගමන් ආදායම

භාණ්ඩ හැසිරවීමෙන් සහ ප්‍රවාහන සේවා ඉටු කිරීමෙන් උද්ගත වන ආදායම හඳුනා ගනු ලබන්නේ, අදාළ සේවා සම්පූර්ණ කිරීම මත පදනම්ව, අදාළ සේවා සපයනු ලබන කාල පරිච්ඡේදය තුළ සපයනු ලබන සැබෑ සේවාවන් හා සම්බන්ධ තක්සේරු කිරීම මත පිහිටා පොරොන්දු වූ භාණ්ඩ හෝ සේවා නියමිත ගනුදෙනුකරු වෙත පවරා දෙනු ලැබීම මගින් යම් කාර්ය සාධන වගකීමක් අදාළ ආයතනය විසින් සපුරා සලසා දෙනු ලබන විට ය.

(ආ) නැව් කුලියට දීමේ ආදායම

ස්ථානීය කුලී නැව් සේවා වැඩපිළිවෙල

සමාගමේ ස්ථානීය කුලී නැව් සේවා වැඩපිළිවෙල සාමාන්‍යයෙන් කෙටි කාල සීමාවක් සහිත නැව් භාණ්ඩ ප්‍රවාහන සේවය සඳහා වූ තනි යාත්‍රා ගමනක් අරබයා වන අතර, නැව් ඉන්ධන සහ වරාය / ඇල මාර්ග ගාස්තු මෙන්ම සාමාන්‍ය යාත්‍රා මෙහෙයුම් පිරිවැය ද ඇතුළුව අදාළ මුහුදු ගමනේ දී දරන සියලුම වියදම් සඳහා සමාගම වගකිව යුතු ය. ඒ අනුව, ස්ථානීය කුලී නැව් සේවා වැඩපිළිවෙළ යටතේ, එම කාර්යයට අදාළ ප්‍රධාන මෙහෙයුම් තීරණ සහ කුලී නැව් සේවා කාල සීමාව තුළ යාත්‍රාවක භාවිතය හා සම්බන්ධ ආර්ථික ප්‍රතිලාභ සමාගම සමග බද්ධව පවතී.

සමාගම විසින් ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරන - SLFRS 15 ප්‍රමිතියට අනුකූලව, ආදායම් හඳුනා ගැනීමේ මාර්ගෝපදේශය යොදා ගනු ලබයි. පැවරීමට නියමිත භාණ්ඩ හෝ සේවා සම්බන්ධයෙන් එක් එක් පාර්ශවයේ අයිතිවාසිකම් හඳුනා ගැනීමට ආයතනයට හැකි අතර පැවරීමට නියමිත භාණ්ඩ හෝ සේවා සඳහා වූ ගෙවීම් හා සම්බන්ධ නියමයන් හඳුනා ගැනීමට ද ආයතනයට හැකි ය.

ස්වකීය ප්‍රවාහන සේවා සපයා දීම වෙනුවෙන් හිලව් ලෙස හිමිකම් කිසිවක් ලැබීමට සමාගම අපේක්ෂා කරන ප්‍රතිෂ්ටාව, නැව් භාණ්ඩ පැටවීමේ සිට ඒවා ගොඩ බෑම දක්වා වන පදනම මත (එනම්, වරායේ දී භාණ්ඩ පටවන අවස්ථාවේ සිට මුහුදු යාත්‍රා ගමන අවසන් කර භාණ්ඩ ගොඩබාන අවස්ථාව දක්වා) එකී යම් මුහුදු යාත්‍රා ගමනක කාල සීමාව මුළුල්ලේ පැන නගින ආදායමක් ලෙස හඳුනා ගැනේ.

කාල පදනම මත කුලී නැව් සේවා වැඩපිළිවෙල

සමාගමේ කාල පදනම මත කුලී නැව් සේවා වැඩපිළිවෙල, නිශ්චිත කාල සීමාවක් සඳහා වන අතර කුලී නැව් කාල සීමාව තුළ යාත්‍රාව සේවයෙහි යොදා ගැනීම හා සම්බන්ධ ප්‍රධාන තීරණ ගැනීම රඳා පවතිනුයේ අදාළ නෞකාව කුලියට සපයා ගැනීම මතය. කුලී නැව් සේවා වැඩපිළිවෙල හා බැඳි කටයුතුවල දී, යාත්‍රාවේ කාර්ය මණ්ඩලය සේවයේ නියුක්ත කරවීම, නැව නඩත්තු කිරීම සහ රක්ෂණය කිරීම සම්බන්ධයෙන් සමාගම වගකිව යුතු අතර, පොදුවේ නෞකා ඉන්ධන සහ වරාය / ඇල මාර්ග වියදම් ඇතුළත් මුහුදු ගමනේ නිශ්චිත වියහියදම් සඳහා නෞකාව කුලියට සපයා ගන්නා සාමාන්‍යයෙන් වගකිව යුතු ය.

යාත්‍රාව මුහුදු ගමන්වල යොදා ගනිමින් භාවිතා කරන්නේ කෙසේ ද සහ කෙදිනක ද යන්න තීරණය කිරීම පිණිස වූ ප්‍රමාණවත් බල අවසරයක් වරලත්කරු සතු වන අතර, නෞකාව කුලියට සැපයෙන නියමිත කුලී කාල වකවානුව තුළ දී නැවේ භාවිතය හා සම්බන්ධ පාලනය නෞකාව කුලියට සපයා ගන්නා වෙත පැවරෙන හෙයින්, නෞකාව මුහුදු ගමනේ යොදවා දරන වියදම් සඳහා ද නෞකාව කුලියට සපයා ගන්නා වගකිව යුතු ය. එමෙන්ම, එසේ යාත්‍රාව භාවිතා කිරීමෙන් උපයන ආර්ථික ප්‍රතිලාභය ද තමා සතුව තබා ගනී. ඒ අනුව, කාල පදනම මත සැපයෙන කුලී නැව් සේවා මගින් සමාගම උපදවන ආදායම, අදාළ කුලී නැව් කාල සීමාවට අනුපාතිකව සරල මාර්ග පදනමක් මත හඳුනා ගැනේ.

(ඈ) භාණ්ඩ සම්පාදන / නිෂ්කාශන සහ ඉදිරිපත් කිරීමේ ආදායම

සම්පූර්ණ සම්පාදන විසඳුම් සංකල්පය වූ කලී, අදාළ නම් කරන ලද ස්ථානය වෙත භාණ්ඩ බෙදා හැරීම තෙක් දිවෙන අවස්ථාව දක්වා වන අදාළ කාර්යභාරය අවසන් කිරීමේ දිනය ලෙස සැලකේ. මෙහි දී, ආදායම හඳුනා ගැනෙනුයේ, අදාළ සේවා සම්පූර්ණ කිරීම මත පදනම්ව, අදාල සේවා සපයනු ලබන කාල පරිච්ඡේදය තුළ සපයනු ලබන සැබෑ සේවාවන් හා සම්බන්ධ තක්සේරු කිරීම මත පිහිටා පොරොන්දු වූ භාණ්ඩ නියමිත ගනුදෙනුකරු වෙත පවරා දෙනු ලැබීම මගින් යම් කාර්ය සාධන වගකීමක් ආයතනය විසින් සපුරා සලසා දෙනු ලබන විට ය.

(ඈ) නියෝජිතායතන සහ ඇමතුම් කොමිස්

අදාළ සේවා සපයන කාල සීමාව තුළ ලැබෙන නියෝජිතායතන ගාස්තු, එකී සේවාවන් සම්පූර්ණ කිරීම මත පදනම්ව, ආදායම ලෙස හඳුනා ගැනේ.

(ඉ) පොලිය

විකිණීම සඳහා පවත්නා දෑ ලෙස වර්ගීකරණය කර ඇති ක්‍රමක්ෂ වියදම් සහ පොලී සහිත මූල්‍ය වත්කම් අලළා මනින ලද සියලුම මූල්‍ය සාධන පත් විෂයයෙහි සඵල පොලී අනුපාත ක්‍රමය භාවිතා කරමින් පොලී ආදායම හෝ වියදම වාර්තා කරනු ලැබේ. මෙම පොලී අනුපාතය එසේ යොදා ගැනෙනුයේ, එය, අදාළ මූල්‍ය සාධන පත්වල, උචිත පරිදි, අපේක්ෂිත ජීව කාලය තුළ දී හෝ ඊට අඩු කෙටි කාලයක් තුළ දී ඇස්තමේන්තුගත අනාගත මුදල් ගෙවීම් හෝ ලැබීම්, අදාළ මූල්‍ය වත්කම්වල හෝ වගකීම්වල ශුද්ධ අගය ගෙන යන ප්‍රමාණයට අනුව නිවැරදිවම වට්ටම් කර දෙන අනුපාතයක් වන බැවිනි. ලාභ හෝ අලාභ ප්‍රකාශයෙහි මූල්‍ය ආදායමට අදාළ පොලී ආදායම ඇතුළත් කෙරේ.

(ඊ) ලාභ සහ අලාභ

දේපළ, පිරියත සහ උපකරණ මෙන්ම ආයෝජන ඇතුළු අනෙකුත් ජංගම නොවන වත්කම් නියාදනය කිරීමෙන් උද්ගත වන ආදායම් ස්වභාවයේ ශුද්ධ ලාභ සහ අලාභ, එසේ බැහැර කිරීමෙන් ලැබෙන ආදායම ද, එම වත්කමේ ධාරක වටිනාකමේ ප්‍රමාණය ද සහ අදාළ විකුණුම් වියදම් ද අඩු කිරීමෙන් පසු අදාළ පරිදි ලාභය හෝ අලාභය තුළ ගිණුම් ගත කෙරේ.

(උ) වෙනත් ආදායම්

වෙනත් ආදායම්, උපචිත පදනමක් මත හඳුනා ගැනේ.

(ඌ) ලාභාංශ ආදායම

අදාළ ගෙවීම් ලැබීමේ අයිතිය තහවුරු වූ කල්හි ලාභාංශ ආදායම හඳුනා ගැනේ.

3.2.2 වියදම් හඳුනා ගැනීම

කාර්යක්ෂමව ව්‍යාපාරය පවත්වාගෙන යාමේ දී සහ දේපළ, පිරියත සහ උපකරණ නඩත්තු කරගෙන යාමේ දී දරන ලද සියලු වියදම්, වර්ෂය සඳහා ලාභ හෝ අලාභ ලැබීම තීරණය කිරීමෙහිලා ආදායමට අයගත කර ඇත.

මූල්‍ය වියදම්

මූල්‍ය පිරිවැය, ප්‍රධාන වශයෙන්, ණය ගැනීම් මත උද්ගත වන පොලී වියදම් සහ ණය ගැනීම් මත සිදුවන විනිමය අලාභවලින් සමන්විත වේ. සුදුසුකම් ලබන වත්කමක් අත්පත් කර ගැනීම, ඉදිකිරීම හෝ නිෂ්පාදනය කිරීම සඳහා සෘජුවම ආරෝපණය කළ නොහැකි ණය ගැනුම් පිරිවැය සහ විනිමය පාඩු, සඵල පොලී අනුපාත ක්‍රමය භාවිතා කරමින් ලාභ හෝ අලාභ ප්‍රකාශය තුළ හඳුනාගෙන ඇත.

3.3 ආදායම් බදු වියදම්

අදාළ කාල පරිච්ඡේදය සඳහා වන බදු වියදම, ප්‍රවර්තන සහ විලම්බිත බදු වලින් සමන්විත වේ. වෙනත් විස්තීර්ණ ආදායමක් ලෙස හඳුනා ගත් ආදායම් හෝ වියදම් අයිතමයකට ආරෝපණය කළ හැකි වෙනසක් හැරුනු විට, ලාභය හෝ අලාභය තුළ හඳුනා ගත් බදු ද, වෙනත් විස්තීරණ ආදායම තුළ සෘජුවම හඳුනා ගැනේ.

(අ) ප්‍රවර්තන ආදායම් බදු

ප්‍රවර්තන ආදායම් බද්ද යනු, වාර්තා කරන දිනයේ දී පනවන ලද හෝ එදිනට සැලකිය යුතු ලෙස බලාත්මක වන බදු අනුපාත සහ පෙර වසරවලට අදාළව ගෙවිය යුතු බදු සඳහා වන යම් ගැළපීමක් වෙතොත් ඒවා ද භාවිතා කරමින් ගණනය කෙරෙන, වර්ෂය සඳහා බදු අය කළ හැකි ආදායම මත ගෙවිය යුතු වන්නා වූ අපේක්ෂිත බද්දයි.

2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ විධිවිධාන සහ ඉන් පසුව එම පනතට සිදු කරන ලද සංශෝධන අනුව, බදු ගෙවීම විෂයයෙහි සමාගම විසින් දරනු ලබන බදු බැඳියා වගකීම ආගණනය කර ඇත.

(ආ) විලම්බිත බදු

මූල්‍ය ප්‍රකාශවල දැක්වෙන වත්කම්වල සහ බැරකම්වල ඉදිරියට ගෙන යනු ලබන වටිනාකමේ ප්‍රමාණය සහ ඒවාට අනුරූප වන බදු පදනම් (තාවකාලික වෙනස්කම් ලෙස හඳුන්වනු ලබන) අතර ඇති වන වෙනස්කම් මත විලම්බිත බද්ද හඳුනා ගැනේ.

අනාගතයේ දී බද්දට යටත් ලාභය වැඩි වෙතැයි අපේක්ෂා කරන සියලු තාවකාලික වෙනස්කම් විෂයයෙහි විලම්බිත බදු බැඳියා හඳුනා ගනු ලැබේ. අනාගතයේ දී බදු අය කළ හැකි ලාභය අඩුවනු ඇතැයි බලාපොරොත්තු වන සියලු තාවකාලික වෙනස්කම් සහ භාවිත නොකළ බදු අලාභ හෝ භාවිත නොකළ බදු බැර විෂයයෙහි විලම්බිත බදු වත්කම් හඳුනා ගනු ලැබේ.

විලම්බිත බදු වත්කම් මනිනු ලබන්නේ,

වර්තමාන හෝ ඇස්තමේන්තුගත අනාගත බදු අය කළ හැකි ලාභය මත පිහිටා, අයකර නොගැනීමට වඩා වැඩි ඉඩක් ඇති ඉහළම මුදල් වටිනාකමෙනි.

ඉදිරියට ගෙන යනු ලබන විලම්බිත බදු ප්‍රමාණය, එක් එක් වාර්තා කරන දිනය වන විට සමාලෝචනයට හසු කෙරෙන අතර අනාගත බදු අය කළ හැකි ලාභයේ වර්තමාන තක්සේරුව පිළිබිඹු කරනු පිණිස ඊට අවැසි ගැළපුම් සිදු කරනු ලැබේ. එසේ ගැළපුම් කිසිවක් සිදු වෙතොත්, ඒවා, ලාභය හෝ අලාභය තුළ හඳුනා ගනු ලැබේ.

විලම්බිත බදු ගණනය කරනු ලබන්නේ, වාර්තා කිරීමේ කාල පරිච්ඡේදය අවසන් දිනය වන විට පනවනු ලැබ ඇති හෝ සැලකිය යුතු ලෙස බලාත්මක වෙතැයි අපේක්ෂිත බදු අනුපාත මත පදනම්ව, අදාළ විලම්බිත බදු වත්කම් උපලබ්ධි කර ගැනීමට හෝ විලම්බිත බදු බැඳියාව පියවීමට අපේක්ෂා කරන කාල පරිච්ඡේද සඳහා වන බද්දට යටත් බදු අය කළ හැකි ලාභයට (බදු පාඩුවට) අදාළ වනු ඇතැයි අපේක්ෂා කරනු ලබන බදු අනුප්‍රමාණ මත පිහිටා ය.

වත්කම් සහ තක්සේරුවේ පදනම

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය තුළ ජංගම වත්කම් ලෙස වර්ගීකරණය කරනු ලැබ ඇති වත්කම් වූ කලී, සමාගම සතු ව්‍යාපාරයේ සාමාන්‍ය මෙහෙයුම් චක්‍රය තුළ පවත්නා වූ මුදල් හෝ එම මෙහෙයුම් චක්‍ර කාලය සහ ගිණුම් වාර්තා කිරීමේ දින සිට වසරක් ඇතුළත කාලය යන කාල සීමා දෙකින් වඩා අඩු කාල සීමාව තුළ මුදල් වශයෙන් උපලබ්ධි වීමට අපේක්ෂිතව පවත්නා වූ මුදල් වන්නේ ය. ජංගම වත්කම් හැර අනෙකුත් වත්කම් යනුවෙන් දැක්වෙනුයේ, මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ දින සිට වසරක කාල සීමාවකට වඩා වැඩි කාලයක් රඳවා තබා ගැනීමට සමාගම අදහස් කරන ඒවා ය.

3.4 දේපළ, පිරියත සහ උපකරණ

(අ) මූලික හඳුනා ගැනීම සහ මානනය කිරීමේ පදනම

දේපළ, පිරියත සහ උපකරණ සඳහන් කරනු ලබනුයේ, මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය තුළ දැක්වෙන ප්‍රත්‍යාගණනය කළ අගය අනුව ඉදිරියට ගෙන යන ලද ඉඩම් හැර, එකී දේපළ, පිරියත සහ උපකරණවල සමුච්චිත ක්ෂයවීම් සහ සමුච්චිත දුබලතා අලාභ අඩු කර ගණනය කරනු ලබන පිරිවැය වටිනාකමට ය. කළමනාකරණය විසින් අපේක්ෂා කරනු ලබන ආකාරයට එම දේපළ, පිරියත සහ උපකරණ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ස්ථානය කරා සහ ඊට අදාළ තත්ත්වයන් යටතට රැගෙන ඒම සඳහා දරන ලද එම වත්කම්වලට සෘජුවම ආරෝපණය කළ හැකි වියදම්, ඒවායේ ඓතිහාසික පිරිවැයට ඇතුළත් වේ. ස්වයං නිර්මිත වත්කම්හි පිරිවැය තුළ, ද්‍රව්‍ය සඳහා වැය වූ පිරිවැය සහ සෘජු ශ්‍රමය සඳහා වැය වූ පිරිවැය අන්තර්ගත වේ.

දේපළ, පිරියත සහ උපකරණ යටතේ ගැනෙන අයිතමයක් විවිධ ප්‍රයෝජ්‍ය ආයු කාල සහිත ප්‍රධාන කොටස් වලින් සමන්විත වන විට, ඒවා දේපළ, පිරියත සහ උපකරණ යටතේ ගැනෙන වෙනම අයිතම ලෙස ගණනය කර ගිණුම්ගත කරනු ලැබේ.

(ආ) ආයතනික වියදම්

දේපළ, පිරියත සහ උපකරණ යටතේ ගැනෙන අයිතම කිසිවක් වෙනුවෙන් යෙදිය හැකි, ඒවා ප්‍රතිස්ථාපනය කිරීමේ කොටස් සඳහා දරනු ලබන පිරිවැය සමාගම විසින් දේපළ, පිරියත සහ උපකරණ යටතේ ගැනෙන අයිතමයක ඉදිරියට රැගෙන යන ධාරක වටිනාකමට එකතු කරන්නේ, ඒවායින් සමාගමට යම් වර්ධනාත්මක ප්‍රතිලාභයක් අත්වන බව අපේක්ෂා කරන විට දී ය. ප්‍රතිස්ථාපනය කරන ලද කොටසෙහි ඉදිරියට රැගෙන යන වටිනාකම, ගිණුම් තුළ හඳුනා ගනු නොලැබේ. අනෙකුත් සියලු අලුත්වැඩියා කිරීම් සහ නඩත්තු කිරීම් සඳහා දැරූ වියදම්, ඒවා දරන කාල සීමාවට අයත් ලාභයට හෝ අලාභයට අයගත කෙරේ.

(ඇ) හඳුනා නොගැනීම

දේපළ, පිරියත සහ උපකරණ යටතේ ගැනෙන අයිතමයක ඉදිරියට රැගෙන යන වටිනාකම, එය නියාදනය කරනු ලබන අවස්ථාවක දී හඳුනා නොගැනේ. නැතහොත්, එය භාවිතා කිරීමෙන් අනාගත ආර්ථික ප්‍රතිලාභ කිසිවක් අපේක්ෂා නොකරන කල්හි, එසේ හඳුනා නොගැනීමෙන් ලැබෙන ලාභ හා අලාභ, ලාභ හෝ අලාභ ගිණුම තුළ හඳුනා ගනු ලබන අතර උද්ගත වන ලාභ කිසිවක් ආදායම ලෙස වර්ගීකරණය නොකෙරේ.

(ඇ) ක්ෂයවීම්

ඉඩම් ක්ෂයවීම් ගණනය කරනු නොලැබේ. දේපළ, පිරියත සහ උපකරණ යටතේ ගැනෙන වෙනත් අයිතමවල ඇස්තමේන්තුගත ප්‍රයෝජ්‍ය ආයු කාලය මුළුල්ලේ පවත්නා අවශේෂ අගය අඩු කළ පසු ගණනය වන එකී වත්කම්වල පිරිවැය අගය වෙන්කර දීමට හැකි වන පරිදි, සරල මාර්ග ක්‍රමය භාවිතා කරමින්, ලාභය හෝ අලාභය වෙත, ඊට අදාළ ක්ෂයවීම් අයගත කෙරේ. අදාළ වත්කම්වල ඇස්තමේන්තුගත ප්‍රයෝජ්‍ය ආයු කාල පහත සඳහන් පරිදි වේ :

වත්කම්	වර්ෂ ගණන
ගොඩනැගිලි	20
නාවික යාත්‍රා	25
මෝටර් වාහන	25
ගෘහ භාණ්ඩ, සවිකිරීම් හා කාර්යාල උපකරණ	10
පරිගණක	05

යාත්‍රා කාලානුරූපීව වරින් වර වියළි තටාකගත කිරීමේ පිරිවැය ප්‍රාග්ධනීකරණය කර ඊළඟ වියළි තටාකගත කිරීමේ දිනය දක්වා කාලය තුළ ක්ෂය කරනු ලැබේ. අදාළ ක්ෂයවීම් කාලය අවසන් වීමට පෙර සැලකිය යුතු වියළි තටාකගත කිරීමේ පිරිවැයක් දැරීමට සිදුවීමේ දී, පෙර වියළි තටාකගත කිරීමේ ඉතිරි වියදම් පසුව වියළි තටාකගත කිරීමේ මාසය තුළ කපා හරිනු ලැබේ.

නෞකා වියළි තටාකගත කිරීම සිදු කෙරෙනුයේ වසර 05 කට වරක් බැගිනි.

යම් වත්කමක ක්ෂයවීම ගණනය කිරීම ආරම්භ වන්නේ, එය භාවිතයට යොදා ගත හැකි කල්හි වන අතර, එම වත්කමෙහි ක්ෂයවීම ගණනය කිරීම නතර වන්නේ, එකී වත්කම විකිණීමට තබා ඇති භාණ්ඩයක් ලෙස වර්ගීකරණය කර ඇති දිනය සහ එකී වත්කම ගිණුම්හි හඳුනා ගනු නොලබන දිනය යන දෙකින් කලින් එළඹෙන දිනයේ දී ය.

(ඉ) දේපළ, පිරියත සහ උපකරණවල ප්‍රයෝජ්‍ය ආයු කාලය

අවසාන වාර්තා කිරීමේ දිනයෙන් පසුව සැලකිය යුතු වෙනසක් ඇති බවට කිසියම් ඇඟවීමක් තිබේ නම්, වත්කම්වල අවශේෂ වටිනාකම්, ප්‍රයෝජ්‍ය ආයු කාල සහ ක්ෂයවීම් ක්‍රම සමාලෝචනය කර, සුදුසු යැයි හැඟෙන්නේ නම්, ඒවා භව්‍යතාත්මකව ගිණුම් තුළ ගළපනු ලැබේ. ශ්‍රී ලංකා ගිණුම් - LKAS 16 ප්‍රමිතියෙහි 51 වන ඡේදයට අනුව එය ගළපනු ලැබ ඇත. මෙම වටිනාකම් සහ අනුපාත ක්‍රම ඇස්තමේන්තු කිරීමෙහිලා කළමනාකරණයේ නිශ්චයමතිය ක්‍රියාත්මක වන බැවින්, ඒවා අවිනිශ්චිතතාවයට පාත්‍රව පවතී.

වත්කම් නියාදනය කිරීමේ දී, එලෙස නියාදනය කිරීමෙන් ලත් ශුද්ධ මුදල් ප්‍රමාණය සහ විකුණන ලද වත්කම් අයිතමයේ ධාරක වටිනාකමේ ප්‍රමාණය අතර වෙනස ලාභ හෝ අලාභ වශයෙන් හඳුනාගෙන, 'වෙනත් ආදායම්' හෝ 'වෙනත් මෙහෙයුම් වියදම්' තුළ ඇතුළත් කෙරේ.

(ඊ) නාවික යාත්‍රා අපවයට පත්වීම

ආයතනය සතු යාත්‍රාවල ධාරක වටිනාකමේ ප්‍රමාණය සෑම වසරකම ඒවායේ අපවය විෂයයෙහි පරීක්ෂා කරනු ලැබේ.

යාත්‍රාව සේවා භාවිතය පිණිස යොදා ගැනීමේ ඇති වටිනාකම තක්සේරු කිරීමේ දී, එහි අනාගත කුලී නැව් ගාස්තු, නැව් මෙහෙයුම් වියදම් හා ඇස්තමේන්තුගත ඉතිරි ප්‍රයෝජ්‍ය ආයු කාලය සහ යාත්‍රාවේ අවශේෂ අගයන් පිළිබඳව ආයතනය විසින් උපකල්පන කරනු ලැබ ඇත. එකී උපකල්පන, ඓතිහාසික හා චක්‍රීය ප්‍රවණතා මත මෙන්ම අනාගත අපේක්ෂාවන් මත ද පදනම් වේ. යම් විභව දුබලතා තක්සේරු කිරීම සඳහාභාවිතා කරන ලද උපකල්පන බුද්ධික වූ ද, යෝග්‍ය වූ ද ඒවා බව කළමනාකරණය විශ්වාස කරයි. කෙසේ වෙතත්, එබඳු උපකල්පන අතිශය පුද්ගල නිශ්‍රිත වන්නේ ය.

යාත්‍රාවල විකුණුම් පිරිවැය ඌණ සාධාරණ අගය තක්සේරු කිරීමෙහිලා, 2023 මාර්තු මස 31 වන දිනට වෙළඳපල වටිනාකම මත පදනම්ව කළ ස්වාධීන තක්සේරුවක්, අදාළ වෘත්තීය තක්සේරුකරුවෙකු වෙතින් කළමනාකරණය විසින් ලබාගෙන ඇත. වාර්තා කිරීමේ දිනට යාත්‍රාවල වටිනාකම විෂයයෙහි සැලකිය යුතු ලෙස වෙනස්කම් සිදු වී නොමැති බව කළමනාකරණයේ මතයයි. ඒ අනුව, ඒවායේ දුබලත්වය හා සම්බන්ධ කිසිඳු අපවයක් සිදු වූ බවට වන ඇඟවීමක් නොමැත.

3.5 අස්පෘශ්‍ය වත්කම්

අත්කර ගන්නා ලද පරිගණක මෘදුකාංග ප්‍රාග්ධනීකරණය කරනු ලබන්නේ, නිශ්චිත මෘදුකාංග සහ ක්‍රමපද්ධති අත්කර ගැනීම සඳහා සහ ඒවා භාවිතයට ගෙන ඒම සඳහා දරන ලද පිරිවැය මත පිහිටා ය. අත්කර ගත් අස්පෘශ්‍ය වත්කම්, සමුච්චිත ක්‍රමක්ෂය සහ සමුච්චිත දුබලතා අලාභ අඩු කළ පිරිවැය අනුව සඳහන් කෙරේ. මෙම පිරිවැය, පහත සඳහන් පරිදි ඒවායේ ඇස්තමේන්තුගත ප්‍රයෝජ්‍ය ආයු කාලය මත ක්‍රමක්ෂය කෙරේ :

පරිගණක මෘදුකාංග	අවුරුදු 05

පරිගණක මෘදුකාංග නඩත්තු කිරීම හා සම්බන්ධ පිරිවැය, දරන ලද වියදමක් ලෙස හඳුනා ගැනේ.

3.6 ණය ගැනුම් පිරිවැය

ණය ගැනුම් පිරිවැය හඳුනා ගැනෙනුයේ, සුදුසුකම් ලබන යම් වත්කමක් අත්කර ගැනීම, ඉදිකිරීම හෝ නිෂ්පාදනය කිරීම විෂයයෙහි සෘජුවම ආරෝපණය කළ හැකි ප්‍රමාණය තෙක් හැර, ඒවා දරන ලද අදාළ කාල සීමාව තුළ වූ වියදමක් ලෙස ය. ඒ සම්බන්ධයෙන් ගත් කළ, ඒවා, එකී වත්කමේ පිරිවැයට අයත් කොටසක් ලෙස ප්‍රාග්ධනීකරණය කරනු ලැබේ.

3.7 මුදල් හා මුදල් සාමානයන්

අතේ ඇති මුදල්, ඉල්ලුම් තැන්පතු සහ මාස තුනකට හෝ ඊට අඩු කල්පිරීම් සහිත කෙටි කාලීන තැන්පතු, මුදල් සහ මුදල් සාමානයන් වන අතර ඒවා, දන්නා මුදල් ප්‍රමාණයන්ට පහසුවෙන් හා සැනෙන් පරිවර්තනය කළ හැකි අතර, වටිනාකමෙහි සිදුවන නොසැලකිය යුතු වෙනස්වීම්වල අවදානමට යටත් වේ.

මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ කාර්යයන් සඳහා, මුදල් සහ මුදල් සාමානයන් සමන්විත වනුයේ, අතේ ඇති මුදල් වලින් සහ හිඟ හිට ඇති බැංකු අයිරා ගෙවීමෙන් පසුව ඉතිරි වන බැංකු තැන්පත් කිරීම් වලිනි. කෙටි කල්පිරීමක් සහිත ආයෝජන, එනම්, අත්කර ගත් දින සිට මාස තුනක් හෝ ඊට අඩු කල්පිරීම් සහිත ආයෝජන ද, මුදල් සාමානයන් ලෙස සලකනු ලැබේ.

3.8 මූල්‍ය නොවන වත්කම් හානියට පත් වීම

සෑම වාර්තාකරණ දිනයක දීම, එම වත්කම් දුබලතා අපවයන්ට ගොදුරු වී ඇති බවට කිසියම් ඇඟවීමක් තිබේ ද යන්න තීරණය කිරීම සඳහා මූල්‍ය නොවන වත්කම් සමාලෝචනයට භාජනය කෙරේ. එසේ සිදුවිය හැකි දුබලතා අපවයන් පිළිබඳ ඇඟවීමක් තිබේ නම්, බලපෑමට ලක් වූ එබඳු යම් වත්කමක (හෝ අදාළ වත්කම් සමූහයක) අයකර ගත හැකි මුදල ඇස්තමේන්තු කර එහි ඉදිරියට රැගෙන යන ධාරක වටිනාකම සමඟ සංසන්දනය කරනු ලැබේ.

ඇස්තමේන්තුගත අයකරගත හැකි මුදල අඩු වන්නේ නම්, ඉදිරියට රැගෙන යා හැකි ධාරක වටිනාකම, එහි ඇස්තමේන්තුගත අයකරගත හැකි මුදලට අඩු කරනු ලබන අතර, ලාභය හෝ අලාභය තුළ ඊට අදාළ දුබලතා හානියක් වහා හඳුනා ගැනේ.

ඒ හා සමානවම, සෑම වාර්තාකරණ දිනයක දීම, වට්ටෝරු භාණ්ඩවල එක් එක් අයිතමයේ (හෝ සමාන අයිතම සමූහයක) ඉදිරියට රැගෙන යන ධාරක වටිනාකම, එහි පිරිවැය අඩු කළ සම්පූර්ණ කර විකිණීමට තැබෙන විකුණුම් මිල සමඟ සංසන්දනය කිරීම මගින් ඒවායේ දුබලතා විෂයයෙහි, තක්සේරු කරනු ලැබේ. ඉන්වෙන්ටරි අයිතමයක් (හෝ ඒ හා සමාන අයිතම සමූහයක්) දුබලතාවයට පත්වී ඇත් නම්, එහි ඉදිරියට රැගෙන යන ධාරක වටිනාකම, එහි පිරිවැය අඩු කළ සම්පූර්ණ කර විකිණීමට තැබෙන විකුණුම් මිලට අඩු කරනු ලබන අතර, ලාභය හෝ අලාභය තුළ ඊට අදාළ දුබලතා හානියක් වහා හඳුනා ගැනේ.

දුබලතා අලාභයක් පසුව ප්‍රතිවර්තනය වේ නම්, වත්කමේ (හෝ අදාළ වත්කම් සමූහයේ) ඉදිරියට රැගෙන යන ධාරක වටිනාකම, එහි ආපසු අයකර ගත හැකි මුදලේ සංශෝධිත ඇස්තමේන්තුවට (වට්ටෝරු භාණ්ඩ සම්බන්ධයෙන් වන විට, පිරිවැය අඩු කළ සම්පූර්ණ කර විකිණීමට තැබෙන විකුණුම් මිලට) වැඩි කරනු ලැබේ. එසේ නමුත්, එම ඉදිරියට රැගෙන යන ධාරක වටිනාකම, පූර්ව වර්ෂවල එකී වත්කම් (හෝ අදාළ වත්කම් සමූහය) විෂයයෙහි කිසිදු දුබලතා අලාභයක් හඳුනා ගනු ලැබ නොතිබුනේ නම්, එහිලා නිශ්චය කළ හැකිව තිබූ වටිනාකම ඉක්මවා නොගිය ප්‍රමාණයක් වනු ඇත. දුබලතා අලාභයක ප්‍රතිවර්තනය වීම, ලාභ හෝ අලාභය තුළ වහා හඳුනා ගැනේ.

3.9 තොගය

යල්පිනූ සහ මන්දගාමීව චලනය වන තොග භාණ්ඩ අයිතමවල අගය විෂයයෙහි ඊට නියමිත ඉඩ හැරීම් ලබා දීමෙන් පසු, ඒවායේ පිරිවැය අගය සහ ශුද්ධ උපලබ්ධි කරගත හැකි අගය යන දෙකින් අඩු අගයට තොග භාණ්ඩවල වටිනාකම අගයනු ලැබේ. තොග භාණ්ඩ, පරිභෝජ්‍ය ද්‍රව්‍ය වලින් සමන්විත වේ. තොග භාණ්ඩ, ඒවායේ වර්තමාන ස්ථානයට රැගෙන ඒම සඳහා සහ ඒවා දැනට පවත්නා තත්වයට ගෙන ඒම සඳහා දරන ලද පිරිවැය, 'පෙරතුලු පෙර පිට' (FIFO) යන පළමුව පැමිණි පළමුව පිටවීමේ පදනම මත ගැනුම් පිරිවැයට ගණනය කෙරේ.

ශුද්ධ උපලබ්ධි කරගත හැකි අගය යනු, සාමාන්‍ය ව්‍යාපාර කර්තව්‍යයේ දී තොග භාණ්ඩ විකිණිය හැකි, ඇස්තමේන්තුගත නිමැවුම් පිරිවැය සහ එම විකුණුම සිදු කිරීමට අවශ්‍ය ඇස්තමේන්තුගත පිරිවැය අඩු කළ වටිනාකමට ගණනය වන මිල යි.

3.10 මූල්‍ය සාධන පත්‍ර

මූල්‍ය සාධන **පත්‍රයක්** යනු, එක් අස්ථිත්වයක මූල්‍ය වත්කමකට සහ වෙනත් අස්ථිත්වයකට මූල්‍ය බැරකමකට හෝ කොටස් සාධන **පත්‍රයකට** හේතු කාරක **වන** කිසියම් ගිවිසුමකි.

3.10.1 මූල්‍ය වත්කම්

මූල්‍ය වත්කම්, මූලික හඳුනා ගැනීමේ දී වර්ගීකරණය කරනු ලබන්නේ, පසුව මානනය කළ ක්‍රමක්ෂගත පිරිවැයට අනුවත්, වෙනත් විස්තීර්ණ ආදායම ඔස්සේ සාධාරණ අගය අනුවත්, ලාභය හෝ අලාභය ඔස්සේ සාධාරණ අගය අනුවත් වශයෙනි.

මූලික හඳුනා ගැනීමේ දී මූල්‍ය වත්කම් වර්ගීකරණය රඳා පවතිනුයේ, මූල්‍ය වත්කම්වල ගිවිසුම්ගත මුදල් ප්‍රවාහයේ ගති ලක්ෂණ සහ ඒවා කළමනාකරණය කිරීම සඳහා වූ ආයතනයේ ව්‍යාපාර ආකෘතිය මත ය. වෙසෙසි ලෙස සැලකිය යුතු මූල්‍යකරණය හා බැඳි අංගයක් සංයුක්ත නොවන වෙළඳ ලැබීම්වල මුදල් නියමිත හෝ ප්‍රායෝගික උපයෝගය පිණිස ආයතනය විසින් යොදවා ඇති වෙළඳ ලැබීම්වල මුදල් නියමිත හැරුණු විට, ආයතනය විසින් මූලික අවස්ථාවේ දී තම මූල්‍ය වත්කමක් එහි සාධාරණ අගයට මනිනු ලබන අතර, ඊට අමතරව, ලාභය හෝ අලාභය ඔස්සේ සාධාරණ අගය අනුව නොවූ මූල්‍ය වත්කම් සම්බන්ධයෙන් වන විට, ඒවා මනිනු ලබන්නේ, ගනුදෙනු පිරිවැය මත ය. වෙසෙසි ලෙස සැලකිය යුතු මූල්‍යකරණය හා බැඳි අංගයක් සංයුක්ත නොවන වෙළඳ ලැබීම්වල මුදල් නියමිත හෝ ප්‍රායෝගික උපයෝගය පිණිස ආයතනය විසින් යොදවා ඇති වෙළඳ ලැබීම්වල මුදල් නියමිත මානනය කරනු ලබන්නේ, ශ්‍රී ලංකා ගිණුම් - LKAS 15 ප්‍රමිතිය යටතේ නිශ්චය කර ඇති ගනුදෙනු මිලට ය.

මූල්‍ය වත්කමක් ක්‍රමක්ෂගත පිරිවැයට හෝ වෙනත් විස්තීර්ණ ආදායම ඔස්සේ සාධාරණ අගයට අනුව මානනය කිරීම සඳහා, මුල් මුදල මත පරිශේෂව පවත්නා 'හුදෙක් මුල් මුදල හා පොලී ගෙවීම' සලසන මුදල් ප්‍රවාහ ඇති කිරීම අවශ්‍ය වේ. මෙම තක්සේරුව SPPI - 'හුදෙක් මුල් මුදල හා පොලී ගෙවීම' - පරීක්ෂණය ලෙස හඳුන්වනු ලබන අතර එය **සාධන පත්‍ර** මට්ටමින් සිදු කෙරේ.

මූල්‍ය වත්කම් කළමනාකරණය සඳහා වන සමාගමේ ව්‍යාපාර ආකෘතිය, සමාගම මුදල් ප්‍රවාහ උත්පාදනය කිරීම විෂයයෙහි තම මූල්‍ය වත්කම් කළමනාකරණය කරන ආකාරය සඳහන් කරයි. ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ එකතු කර ගැනීම, මූල්‍ය වත්කම් විකිණීම හෝ ඒ දෙආකාරයෙන්ම මුදල් ප්‍රවාහයන් සිදුවේ ද යන්න ව්‍යාපාර ආකෘතිය තීරණය කරයි.

වෙළඳපළ තුළ නියාමන රෙගුලාසි හෝ සම්මුති සම්ප්‍රදාය මගින් ස්ථාපිත කාල රාමුවක් තුළ වත්කම් බෙදා හැරීම සඳහා අවශ්‍ය මූල්‍ය වත්කම් මිලදී ගැනීම් හෝ විකිණීම් (සාමාන්‍ය වෙළඳ කටයුතු ඉටු කිරීමේ මාර්ග) වෙළඳ දිනයේ දී, එනම්, වත්කම් මිලදී ගැනීමට හෝ විකිණීමට සමාගම බැඳී සිටින දිනයේ දී හඳුනා ගනු ලැබේ.

3.10.2 මූල්‍ය වත්කම් පසුව මානනය කිරීම

පසු කාලීන මානනය සඳහා, මූල්‍ය වත්කම් කාණ්ඩ හතරකට වර්ග කරනු ලැබ ඇත :

- ක්‍රමක්ෂගත පිරිවැයට අනුව ගණනය කළ මූල්‍ය වත්කම් (**ණය සාධන පත්‍ර**)
- සමුච්චිත ලාභ සහ අලාභ ප්‍රතිචක්‍රීයකරණය කිරීම සහිත වෙනත් විස්තීර්ණ ආදායම ඔස්සේ සාධාරණ අගයට අනුව ගණනය කළ මූල්‍ය වත්කම් (**ණය සාධන පත්‍ර**)
- හඳුනා නොගැනීම මත, සමුච්චිත ලාභ සහ අලාභ ප්‍රතිචක්‍රීයකරණය කිරීමකින් තොරව වෙනත් විස්තීර්ණ ආදායම ඔස්සේ සාධාරණ අගයට අනුව නම් කරන ලද මූල්‍ය වත්කම් (**කොටස් සාධන පත්‍ර**)
- ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගයට අනුව ගණනය කළ මූල්‍ය වත්කම්.

සමාගම සතු මූල්‍ය වත්කම්වලින් බහුතරයක්, ක්‍රමක්ෂගත පිරිවැයට අනුව ගණනය කළ මූල්‍ය වත්කම් (**ණය සාධන පත්‍ර**) නියෝජනය කරයි. ශ්‍රී ලංකා ගිණුම් - LKAS 9 ප්‍රමිතිය සම්මත කර ගැනීමට පෙර, ක්‍රමක්ෂගත පිරිවැයට අනුව ගණනය කළ මූල්‍ය වත්කම්, ණය මුදල් සහ ලැබිය යුතු මුදල් නියමිත ලෙස වර්ගීකරණය කරන ලදී. පහත සඳහන් කොන්දේසි දෙකම/ද්විත්වය සපුරා ඇත්නම්, සමාගම විසින් මූල්‍ය වත්කම් මානනය කරනු ලබන්නේ, ක්‍රමක්ෂගත පිරිවැයට අනුව ය :

- ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ එකතු කර ගැනීම සඳහා මූල්‍ය වත්කම් තබා ගැනීමේ අරමුණ ඇතිව, ව්‍යාපාර ආකෘතියක් තුළ මූල්‍ය වත්කම් තබා ඇත; සහ
- මූල්‍ය වත්කම්වල ගිවිසුම්ගත නියමයන්, මුල් මුදල මත පරිශේෂව පවත්නා හුදෙක් මුල් මුදල හා පොලී ගෙවීම මත වන්නා වූ මුදල් ප්‍රවාහ නිශ්චිත දිනයන්හි දී ඉටු කිරීම සඳහා හේතු කාරක වෙයි.

ක්‍රමක්ෂගත පිරිවැයට අනුව ගණනය කළ මූල්‍ය වත්කම්, පසුව සඵල පොලී අනුපාත ක්‍රමය භාවිතයෙන් මනිනු ලබන අතර ඒවා දුබලත්වයට පත් වීමට යටත් වේ. වත්කම් හඳුනා නොගත් කල හෝ වෙනස් කරන ලද හෝ දුර්වල වූ විට, ලාභ හෝ අලාභ තුළ හඳුනා ගැනේ.

ක්‍රමක්ෂගත පිරිවැයට අනුව ගණනය කළ ආයතනයේ මූල්‍ය වත්කම්වලට මුදල් සහ මුදල් සමාන දෑ, වෙළඳ හා වෙනත් ලැබීම් නියමිත සහ වෙනත් මූල්‍ය වත්කම් ඇතුළත් වේ. ලාභය හෝ අලාභය ඔස්සේ සාධාරණ අගය අනුව ගණනය කළ මූල්‍ය වත්කම්, ලාභ හෝ අලාභ ප්‍රකාශයෙහි හඳුනා ගත් සාධාරණ අගයේ ශුද්ධ වෙනස්වීම් සහිතව මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය වෙත ගෙන යනු ලැබේ.

වෙනත් විස්තීර්ණ ආදායම් ඔස්සේ සාධාරණ අගයට අනුව වර්ගීකරණය කිරීම සඳහා ආයතනය විසින් ආපසු හැරවිය නොහැකි ලෙස තෝරා නොගත් ලැයිස්තුගත කොටස් ආයෝජන මෙම ප්‍රවර්ගයට ඇතුළත් වේ. ලැයිස්තුගත කොටස් ආයෝජන මත ලාභාංශ ගෙවීමේ අයිතිය තහවුරු කර ඇති විට, ඒවා ලාභ හෝ අලාභ ප්‍රකාශය තුළ වෙනත් ආදායමක් ලෙස ද හඳුනා ගැනේ.

3.10.3 හඳුනා නොගැනීම

පහත සඳහන් අවස්ථාවල දී මූල්‍ය වත්කමක් (හෝ, අදාළ වන විට, මූල්‍ය වත්කමක කොටසක් හෝ සමාන මූල්‍ය වත්කම් සමූහයක කොටසක්) මූලික වශයෙන් හඳුනා ගනු නොලැබේ. (එනම්, ආයතනයේ මූල්‍ය තත්ත්වයෙන් ඉවත් කරනු ලැබේ).

අදාළ වත්කමෙන් මුදල් ප්‍රවාහ ලබා ගැනීමේ අයිතිය, කල් ඉකුත්ව ගොස් ඇති විට හෝ අදාළ වත්කමෙන් මුදල් ප්‍රවාහ ලබා ගැනීමට ඇති තම අයිතිවාසිකම් සමාගම විසින් පවරා දෙනු ලැබ ඇති කල්හි හෝ ලැබුණු මුදල් ප්‍රවාහයන් සැලකිය යුතු ප්‍රමාදයකින් තොරව යම් 'ඉඩ අවසර දීමේ' වැඩපිළිවෙළක් යටතේ තෙවන පාර්ශවයක් වෙත සම්පූර්ණයෙන් ගෙවීමේ වගකීමක් සමාගම විසින් දරනු ලබන කල්හි; සහ, එසේ නැතහොත්,

(අ) සමාගම විසින් අදාළ වත්කම්වල සියලුම අවදානම් සහ ත්‍යාග සැලකිය යුතු ලෙස පවරා දෙනු ලැබ ඇති විට, හෝ

(ආ) අදාළ වත්කම්වල සියලු අවදානම් සහ ත්‍යාග සැලකිය යුතු ලෙස සමාගම විසින් පවරා දෙනු ලැබ හෝ රඳවා තබා ගනු ලැබ නොමැති නමුත්, අදාළ වත්කම්හි පාලනය පවරා දෙනු ලැබ ඇති විට.

යම් වත්කමකින් මුදල් ප්‍රවාහ ලබා ගැනීම සඳහා සමාගම විසින් එහි අයිතිය පවරා දෙනු ලැබ ඇති විට හෝ ඒ සඳහා වූ යම් 'ඉඩ අවසර දීමේ' වැඩපිළිවෙළකට සමාගම එළඹ ඇති විට, සමාගම විසින් එහි හිමිකාරිත්වයේ අවදානම් සහ ත්‍යාග රඳවාගෙන තිබේ නම්, ඒ මොනවා ද යන්නත්, ඒ කෙතෙක් දුරට ද යන්නත් තක්සේරු කරයි. වත්කමේ සියලුම අවදානම් සහ ප්‍රතිලාභ සැලකිය යුතු ලෙස සමාගම විසින් පවරා ගනු ලැබ හෝ රඳවා තබා ගනු ලැබ හෝ වත්කමේ පාලනය පවරා දෙනු ලැබ නොමැති විට, සමාගම එහිලා සිදු කරන අඛණ්ඩ මැදිහත්වීමේ ප්‍රමාණය තෙක් වූ දුරකට එකී පැවරූ වත්කම දිගටම හඳුනා ගනී. එවැනි අවස්ථාවක් සම්බන්ධයෙන් වන විට, ඊට අදාළ බැරකම් ද සමාගම හඳුනා ගනී. පැවරූ වත්කම සහ ඒ ආශ්‍රිත බැරකම මානනය කරනු ලබනුයේ, සමාගම විසින් රඳවාගෙන ඇති අයිතිවාසිකම් සහ බැඳීම් පිළිබිඹු කරන පදනමක් මත ය.

පවරන ලද වත්කම එල්ලේ ඇපකරයක ස්වරූපය ගන්නා අඛණ්ඩ මැදිහත්වීම මානනය කරනු ලබනුයේ, වත්කමෙහි ඉදිරියට රැගෙන යන ප්‍රාරම්භක ධාරක වටිනාකම සහ සමාගමට ආපසු ගෙවීමට නියම විය හැකි වන්නා වූ උපරිම ප්‍රතිෂ්ඨා මුදලේ ප්‍රමාණය යන දෙකින් අඩු අගයට ය.

3.10.4 මූල්‍ය වත්කම් දුබලත්වයට පත් වීම

ලාභය හෝ අලාභය ඔස්සේ සාධාරණ අගය මත නොතැබෙන සියලුම ණය සාධන පත්‍ර සඳහා අපේක්ෂිත ණය අලාභ විෂයයෙහි යම් ඉඩ හැරීමක් අස්ථිත්වය හඳුනා ගනී. අපේක්ෂිත ණය අලාභ පදනම් වී ඇත්තේ, ගිවිසුමට අනුකූලව ආයතනයට ලැබීමට නියමිත ගිවිස ගත් මුදල් ප්‍රවාහ සහ ආයතනය විසින් ලැබීමට අපේක්ෂා කරන සියලු මුදල් ප්‍රවාහ අතර මුල් සඵල පොලී අනුපාතයේ ආසන්න වශයෙන් වන අගයකට වට්ටම් කරන ලද වෙනස මත ය. අපේක්ෂිත මුදල් ප්‍රවාහයන් තුළ, ආයතනය විසින් පවත්වා ගනු ලැබූ සමපාර්ශවික ඇප විකිණීමෙන් ලැබෙන මුදල් ප්‍රවාහ හෝ ගිවිසුම්ගත කොන්දේසිවලට ආබද්ධ වෙනත් ණය වැඩි දියුණු කිරීම් ඇතුළත් වේ.

අපේක්ෂිත ණය අලාභ අදියර දෙකකින් හඳුනා ගැනේ. මූලික හඳුනා ගැනීමේ සිට ණය අවදානමේ සැලකිය යුතු වැඩි වීමක් සිදු නොවූ ණය නිරාවරණයන් සඳහා, ඉදිරි මාස 12 තුළ (දොළොස් මස් අපේක්ෂිත ණය අලාභ) සිදු විය හැකි ණය පැහැර හැරීමේ සිදුවීම් නිසා උද්ගත වන ණය පාඩු වෙනුවෙන් අපේක්ෂිත ණය අලාභ ප්‍රතිපාදනය කරනු ලැබේ. මූලික හඳුනා ගැනීමේ සිට ණය අවදානමේ සැලකිය යුතු වැඩි වීමක් ඇති ණය නිරාවරණයන් සඳහා, ණය පැහැර හැරීමේ කාල වකවානුව (යාවජීව අපේක්ෂිත ණය අලාභ) කෙතෙක් ද යන්න නොතකා, එකී නිරාවරණයේ ඉතිරි ජීව කාලය තුළ අපේක්ෂා කරන ණය පාඩු වෙනුවෙන් යම් අලාභ දීමනාවක් අවැසි වේ.

වෙළඳ ලැබීම් නියමිත මුදල් සඳහා, දුබලතා වෙනුවෙන් වන අවශ්‍යතාවය සියලුම ගනුදෙනුකරුවන් විෂයයෙහි තනි තනි පදනමක් මත එක් එක් වාර්තාකරණ දිනයන්හි දී විශ්ලේෂණය කෙරේ. සියලු තනි වශයෙන් පුද්ගලික මට්ටමෙන් වැදගත් ගනුදෙනුකරුවන් නිශ්චිත දුබලතා සඳහා තක්සේරු කරනු ලැබේ. ඉන් අනතුරුව, නිශ්චිත වශයෙන් දුබලතාවට පත් වී නොමැති බව දැන ගැනීමට ලැබෙන ගනුදෙනුකරුවන්, යම් දුබලතාවක් සිදුව ඇතත්, මේ දක්වා හඳුනා ගෙන නොමැති දුබලතා කිසිවක් විෂයයෙහි සාමූහික වශයෙන් තක්සේරු කරනු ලැබේ. තනි තනිව වැදගත් නොවන වත්කම්, සමාන අවදානම් ගති ලක්ෂණ සහිත වත්කම් සමඟ එකට කාණ්ඩගත කිරීම මගින් දුබලතා විෂයයෙහි සාමූහික වශයෙන් තක්සේරු කරනු ලැබේ.

3.10.5 මූල්‍ය බැරකම්

(අ) මූලික හඳුනා ගැනීම සහ මානනය කිරීම

මූල්‍ය වගකීම්, ඒවායේ ආරම්භක හඳුනා ගැනීමේ දී, ලාභය හෝ අලාභය ඔස්සේ ගණනය කළ මූල්‍ය බැරකම් ලෙසත්, ණය මුදල් සහ ණය ගැනීම් ලෙසත්, ගෙවිය යුතු මුදල් හෝ ඵලදායි ප්‍රාචීරණයක ප්‍රාචීරණ සාධන පත්‍රයක් වශයෙන් නම් කර ඇති ව්‍යුත්පන්නයක් ලෙසත් යන සුදුසු ආකාරයකින් වර්ගීකරණය කරනු ලැබේ.

සියලු මූල්‍ය බැරකම් ආරම්භක වශයෙන් සාධාරණ අගයට අනුව හඳුනා ගනු ලබන අතර, ණය මුදල් සහ ණය ගැනීම් සහ ගෙවිය යුතු මුදල් සම්බන්ධයෙන් වන විට, ඒවා සෘජුව ආරෝපණය කළ හැකි ගනුදෙනු පිරිවැය අඩු කළ පසුව හඳුනා ගැනේ. සමාගමේ මූල්‍ය වගකීම්වලට වෙළඳ සහ අනෙකුත් ගෙවිය යුතු දෑ, පොලී දරන ණය සහ බැංකු අයිරා ඇතුළු ණය ගැනීම් ඇතුළත් වේ.

ලාභය හෝ අලාභය ඔස්සේ ගණනය කළ මූල්‍ය බැරකම් සහ ව්‍යුත්පන්න මූල්‍ය සාධන පත්‍ර කිසිවක් සමාගම සතුව නොමැත.

(ආ) ණය මුදල් සහ ණය ගැනීම්

සමාගමට වඩාත්ම අදාළ කාණ්ඩමය බලපෑම මෙයයි. ප්‍රාරම්භක හඳුනා ගැනීමෙන් පසුව, පොලී සහිත ණය මුදල් සහ ණය ගැනීම්, සඵල පොලී අනුපාත ක්‍රමය භාවිතා කරමින් ක්‍රමක්ෂගත පිරිවැය අනුව පසු කාලීනව මනිනු ලැබේ. බැරකම් හඳුනා නොගත් විට මෙන්ම, සඵල පොලී අනුපාත ක්‍රමය හා බැඳි ක්‍රමක්ෂගත ක්‍රියාවලිය හරහා ද, ඒවා, ලාභය හෝ අලාභය තුළ හඳුනා ගැනේ.

සඵල පොලී අනුපාත ක්‍රමයෙහි ප්‍රමුඛ අංගයක් වන අත්කර ගැනීම් සහ ගාස්තු හෝ පිරිවැය මත වන්නා වූ වට්ටම් හෝ අධිමිල කිසිවක් සැලකිල්ලට යොමු කරමින් ක්‍රමක්ෂගත පිරිවැය ගණනය කෙරේ.
සඵල පොලී අනුපාතය හා බැඳි ක්‍රමක්ෂය කිරීම, විස්තීරණ ආදායම් ප්‍රකාශය තුළ මූල්‍ය පිරිවැය ලෙස ඇතුළත් වේ. මෙම කාණ්ඩය සාමාන්‍යයෙන් පොලී දරන ණය මුදල් සහ ණය ගැනීම් සඳහා අදාළ වේ.

(ඇ) හඳුනා නොගැනීම

මූල්‍ය බැරකමක්, එම බැරකම යටතේ ඇති බැඳීම හඳුනා නොගන්නා කල්හි හෝ අවලංගු කළ විට හෝ කල් ඉකුත් වූ කල්හි හෝ හඳුනා ගනු නොලැබේ. පවතින මූල්‍ය වගකීමක් වෙනුවට, එකම ණය දෙන්නා විසින් සැලකිය යුතු ලෙස වෙනස් කොන්දේසි මත එය ප්‍රතිස්ථාපනය කළ විට හෝ දැනට ඇති වගකීමක පවත්නා නියමයන් සැලකිය යුතු ලෙස වෙනස් කළ කල්හි, එවැනි හුවමාරුවක් හෝ වෙනස් කිරීමක්, මුල් වගකීම හඳුනා නොගැනීම සහ නව වගකීමක් හඳුනා ගැනීම ලෙස සලකනු ලැබේ. අදාළ ඉදිරියට රැගෙන යන ධාරක මුදල් වටිනාකම් ප්‍රමාණයන්හි වෙනස, ලාභ හෝ අලාභ ප්‍රකාශය තුළ හඳුනා ගැනේ.

3.10.6 මූල්‍ය සාධන පත්‍ර හිලව් කිරීම

මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය තුළ මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් පියවා, අදාළ ශුද්ධ මුදල සටහන් කරනු ලබනුයේ :

- හඳුනා ගත් මුදල් ප්‍රමාණයන් හිලව් කිරීම සඳහා දැනට බලාත්මක කළ හැකි නෛතික අයිතියක් ඇති අවස්ථාවක දී, සහ
- වත්කම් ශුද්ධ පදනමක් මත පියවීම සඳහා හෝ උපලබ්ධි කර එකවර වගකීම් පියවීම සඳහා අදහස් කරන අවස්ථාවක දී ය.

3.10.7 සාධාරණ අගය මානනය කිරීම

සාධාරණ අගය අනුව මනිනු ලබන මූල්‍ය සාධන පත් සහ මූල්‍ය නොවන වත්කම් විෂයයෙහි අදාළ වන්නා වූ සාධාරණ වටිනාකම් හා සම්බන්ධ හෙළිදරව් කිරීම්.

සාධාරණ අගය යනු, මිනුම් දිනයේ දී වෙළඳපළ සහභාගිවන්නන් අතර සිදු වන ක්‍රමවත් ගනුදෙනුවක දී වත්කමක් විකිණීමට ලැබෙන හෝ බැරකමක් පැවරීම සඳහා ගෙවනු ලබන මිලයි. සාධාරණ අගය මැනීම පදනම් කර ගැනෙනුයේ, වත්කම විකිණීමේ හෝ බැරකම පැවරීමේ ගනුදෙනුව, පහත සඳහන් කවර හෝ අයුරකින් සිදු වන්නේ ය යන උපකල්පනය මතය.

- වත්කම හෝ බැරකම සඳහා ප්‍රධාන වෙළෙඳපොළ තුළ :

හෝ

- ප්‍රධාන වෙළෙඳපොළක් නොමැති විට, වත්කම හෝ බැරකම සඳහා වඩාත්ම වාසිදායක වෙළෙඳපොළ තුළ.

අස්ථිත්වය ප්‍රධාන හෝ වඩාත්ම වාසිදායක වෙළඳපොළ වෙත ප්‍රවේශ විය යුතු ය. වත්කමක හෝ වගකීමක සාධාරණ අගය මනිනු ලබන්නේ, අදාළ වත්කමේ හෝ බැරකමේ මිල නියම කිරීමේ දී වෙළඳපළ සහභාගිවන්නන් තම ඉහළම ආර්ථික අභිමතාර්ථ වෙනුවෙන් ක්‍රියා කරන බවට වූ වැටහීමකින් යුතු උපකල්පන මත පිහිටා ය.

මූල්‍ය නොවන වත්කමක සාධාරණ අගය මානනය කිරීමේ දී, වෙළඳපළ සහභාගිවන්නෙකු විසින් අදාළ වත්කම එහි ඉහළම සහ හොඳම පරිහරණය වෙනුවෙන් භාවිතා කිරීමෙන් හෝ වත්කම එහි ඉහළම සහ හොඳම පරිහරණය වෙනුවෙන් භාවිතා කරන වෙනත් වෙළඳපළ සහභාගිවන්නෙකුට විකිණීම මගින් ආර්ථික ප්‍රතිලාභ උත්පාදනය කිරීමට එකී වෙළඳපළ සහභාගිවන්නා හට ඇති හැකියාව සැලකිල්ලට ගනී.

අදාළ නිරීක්ෂණ යෙදවුම් භාවිතය උපරිම කරමින් සහ නිරීක්‍ෂණය කළ නොහැකි යෙදවුම් භාවිතය අවම කරමින් සාධාරණ අගය මැනීමට ප්‍රමාණවත් දත්ත පවතින අවස්ථානුගත තත්වයන් තුළ සුදුසු වන සහ ඒ සඳහා වන අදාළ තක්සේරු ශිල්ප ක්‍රම අස්ථිත්වය භාවිත කරයි.

පුනරාවර්තන පදනමක් මත මූල්‍ය ප්‍රකාශවල හඳුනා ගෙන ඇති වත්කම් සහ බැරකම් සඳහා, ධූරාවලියේ මට්ටම් අතර අදාළ පැවරුම් සිදුවී ඇත්ද යන්න අස්ථිත්වය නිශ්චය කරනු ලබන්නේ, එහි වර්ගීකරණය (සමස්තයක් ලෙස සාධාරණ අගය මැනීමට වැදගත් වන අවම මට්ටමේ යෙදවුම මත පදනම්ව), එක් එක් වාර්තාකරණ කාල පරිච්ඡේදය අවසානයේ දී නැවත තක්සේරු කිරීමෙනි.

සාධාරණ අගය හෙළිදරව් කිරීමේ කාර්යය සඳහා, වත්කම්වල හෝ බැරකම්වල ස්වභාවය, ඒවායේ ගති ලක්ෂණ සහ අවදානම් මෙන්ම මෙහි පහත පැහැදිලි කර ඇති 3.10.8 යටතේ ගැනෙන විකිණීම සඳහා තබන ලද ජංගම නොවන වත්කම්වල සාධාරණ අගය හා බැඳි ධූරාවලියේ මට්ටම ද මත පදනම්ව, අස්ථිත්වය විසින් වත්කම් සහ බැරකම් පන්ති නිශ්චය කරනු ලැබ ඇත.

3.10.8 විකිණීම සඳහා තබන ලද ජංගම නොවන වත්කම්

සමාගම විසින්, ජංගම නොවන වත්කම් සහ බැහැර/නියාදනය කිරීමේ වත්කම් සමූහය, ඒවායේ අඛණ්ඩ පරිහරණය කිරීම හරහා ලැබෙන වටිනාකමට වඩා, ඒවායේ ඉදිරියට ගෙනයන ධාරක වටිනාකම යම් විකුණුම් ගනුදෙනුවක් හරහා මූලික වශයෙන් අයකර ගත හැකි වන්නේ නම්, ඒවා විකිණීම සඳහා තබන ලද වත්කම් ලෙස වර්ගීකරණය කරනු ලබනවා ඇත. විකිණීම සඳහා තබන ලද වත්කම් ලෙස වර්ගීකරණය කර ඇති ජංගම නොවන වත්කම් සහ නියාදනය කිරීමේ වත්කම් සමූහය මානනය කරනු ලබන්නේ, ඒවායේ ඉදිරියට ගෙනයන ධාරක වටිනාකම සහ විකිණීම සඳහා වන පිරිවැය අඩු කළ ඒවායේ සාධාරණ අගය යන දෙකින් අඩු ප්‍රමාණයට ය. විකිණීම සඳහා වන පිරිවැය යනු, මූල්‍ය පිරිවැය සහ ආදායම් බදු වියදම් හැර ගණනය කළ, වත්කමක (බැහැර කිරීමේ වත්කම් සමූහයක) බැහැර පිණිස සෘජුවම ආරෝපණය කළ හැකි වර්ධක පිරිවැයයි.

එකී විකිණීම සඳහා තැබීමේ නිර්ණායක සපුරාලනු ලැබ ඇතැයි සලකනු ලබන්නේ, අදාළ විකිණීම සඳහා ඉහළ සම්භාවිතාවක් ඇති විට සහ අදාළ ජංගම නොවන වත්කම් සහ නියාදනය කිරීමේ වත්කම් සමූහය, ඒවායේ වර්තමාන තත්ත්වය තුළ වහා විකිණීමට ඇති කල්හි පමණි. විකිණීම හා බැඳි කටයුතු සම්පූර්ණ කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග තුළින්, අදාළ විකුණුමෙහි සැලකිය යුතු වෙනස්කම් සිදු වීමට හෝ විකිණීමේ තීරණය ඉවත් කර ගැනීමට ඉඩ කඩක් ඇති නොවනු ඇතැයි විද්‍යාමාන විය යුතු ය. වත්කම් විකුණුමෙහි සැලැස්ම අරබයා කළමනාකරණය කැපවීමකින් යුතුව ක්‍රියා කළ යුතු අතර, අදාළ වර්ගීකරණය කරන ලද දින සිට වසරක් ඇතුළත එකී විකිණීම අවසන් කිරීමට අපේක්ෂිත වන්නේ ය.

දේපළ, පිරියත හා උපකරණ සහ අස්පෘශ්‍ය වත්කම්, විකිණීම සඳහා තබන ලද බවට වර්ගීකරණය කළ පසු, ඒවා එල්ලේ ක්ෂය කිරීම් හෝ ක්‍රමක්ෂය කිරීම් සිදු නොකෙරේ. විකිණීම සඳහා තබන ලදැයි යනුවෙන් වර්ගීකරණය කර ඇති වත්කම් සහ බැරකම්, මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය තුළ ප්‍රවර්තන විෂයාංග ලෙස වෙන් වශයෙන් ඉදිරිපත් කෙරේ.

විකිණීම සඳහා තබන ලද බවට වර්ගීකරණය කිරීමට පෙර ඊට තදාසන්නවම, වත්කම් හෝ නියාදනය කිරීමේ වත්කම් සමූහයකට අයත් අංග, සමාගමේ ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුකූලව නැවත මානනය කරනු ලැබේ. ඉන් අනතුරුව, සාමාන්‍යයෙන් වත්කම් හෝ නියාදනය කිරීමේ වත්කම් සමූහය මනිනු ලබන්නේ, ඒවායේ රැගෙන යන ධාරක වටිනාකම සහ විකිණීම සඳහා වන පිරිවැය අඩු කළ ඒවායේ සාධාරණ අගය යන දෙකින් අඩු ප්‍රමාණයට ය. විකිණීම සඳහා තබන ලද බවට කළ ආරම්භක වර්ගීකරණය මත පවත්නා දුබලතා අලාභ සහ පසුව නැවත මැනීම මත ගණනය වන ලාභ හෝ අලාභ, ලාභ හෝ අලාභ ගිණුම තුළ හඳුනා ගැනේ. කිසියම් සමුච්චිත දුබලතා අලාභයක් ඉක්මවන අයුරින් වන්නා වූ ප්‍රතිලාභ එහිලා හඳුනා ගනු නොලැබේ.

3.11 රජයේ ප්‍රදාන

ප්‍රදාන ලැබෙනු ඇති බවට යුක්ති සහගත සහතිකයක් තිබේ නම් සහ සමාගම විසින් අදාළ සියලු කොන්දේසිවලට අනුව කටයුතු කරන්නේ නම්, මුදල් නොවන ප්‍රදාන ඇතුළුව රජයෙන් ලැබෙන ප්‍රදාන සාධාරණ අගයට අනුව හඳුනා ගැනේ.

දේපළ, පිරියත හා උපකරණ සම්බන්ධයෙන් රජයෙන් ලැබෙන ප්‍රදාන, විලම්බිත ප්‍රදාන ලෙසින් ජංගම නොවන බැරකම්වල ඇතුලත් කෙරෙන අතර අදාළ වත්කම්වල අපේක්ෂිත ආයු කාලය මත සරල මාර්ග පදනමින් යුතුව විස්තීරණ ආදායම් ප්‍රකාශය තුළ හඳුනා ගනු ලැබේ.

මුදල් නොවන ප්‍රදාන, ඒවායේ ඉදිරියට ගෙනයන ධාරක වටිනාකම අනුව මානනය කරනු ලබන අතර, ඉදිරියට ගෙනයන ධාරක වටිනාකමට අනුව ප්‍රදාන හා වත්කම් යන දෙආකාරයටම ගණනය කරනු ලැබේ.

බැරකම් සහ ප්‍රතිපාදන

මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය තුළ “ජංගම බැරකම්” ලෙස වර්ගීකරණය කරනු ලැබ ඇති වගකීම් වූ කලී, වාර්තා කිරීමේ දින සිට වර්ෂයක් ඇතුලත ගෙවීමට නියමිත වන්නා වූ හෝ ඉල්ලූ විටක ගෙවීමට තිබෙන්නා වූ ශේෂයන්
වන්නේ ය. “ජංගම නොවන ජංගම බැරකම්” යනු, වාර්තා කිරීමේ දින සිට වසරකට පසුව ගෙවීමට නියමිත වන්නා වූ ශේෂයන් ය.

මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කිරීමේ දී, දන්නා සියලු වගකීම් ගිණුම්ගත කරනු ලැබ ඇත. අතීත සිදුවීම්වල ප්‍රතිඵලයක් ලෙස සමාගම විෂයයෙහි නෛතික හෝ සම්ප්‍රයුක්ත වගකීමක් ඇති කල්හි සහ අදාළ බැඳියාවන් ඉටු කිරීම වෙනුවෙන් ආර්ථික ප්‍රතිලාභ පිටතට ගලනය වීමක් සිදු වෙතැයි අනුමාන කරන අවස්ථාවල දී, අදාළ ප්‍රතිපාදන සහ වගකීම් හඳුනා ගනු ලැබේ.

3.12 විශ්‍රාම ප්‍රතිලාභ පිරිවැය

සමාගම සතුව නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම මෙන්ම නිශ්චිත දායකත්ව සැලැස්ම යනුවෙන් දෙආකාර විශ්‍රාම සැලසුම් තිබේ. නිශ්චිත දායකත්ව සැලැස්මක් යනු, වෙනත් බාහිර ආයතනයක අරමුදලක් වෙත සමාගම විසින් ස්ථිර දායකත්ව මුදලක් ගෙවනු ලබන්නාවූ ද, තම සේවකයින්ගේ ප්‍රවර්තන හා පූර්ව සේවා කාල සීමා වෙනුවෙන් ඊට අදාළව ඔවුන් වෙත වැඩිමනත් ප්‍රතිලාභ ගෙවීම පිණිස ප්‍රමාණවත් වත්කම් එකී සැලැස්ම යටතේ සමාගම නොදරන්නේ නම්, එවිට, ඒ සඳහා නෛතික හෝ සම්ප්‍රයුක්ත වශයෙන් වගකීම් කිසිවකින් සමාගම බැඳී නොමැති වූ ද විශ්‍රාම සැලසුමක් වන්නේ ය. නිශ්චිත ප්‍රතිලාභ සැලසුමක් වූ කලී, නිශ්චිත දායකත්ව සැලැස්මක් නොවන විශ්‍රාම සැලසුමකි. ආකෘතික වශයෙන්, යම් සේවකයෙකු තම සේවා කාලය නිමවා විශ්‍රාම යාමේ දී තමා වෙත ලැබෙන විශ්‍රාම ප්‍රතිලාභ මුදල කුමක්දැයි එකී නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් මගින් නිශ්චය කර දක්වන අතර, සාමාන්‍යයෙන්, ඊට අදාළ ප්‍රතිලාභය, එම සේවකයාගේ වයස, සේවා කාලය හා වන්දි මුදල වැනි එක් සාධකයක් හෝ සාධක කීපයක් මත රඳා පවතී.

(අ) නිශ්චිත දායකත්ව සැලසුම් - **සේවක අර්ථසාධක අරමුදල, සහ**
- **සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල.**

සේවක අර්ථසාධක අරමුදලට සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට සුදුසුකම් ලබන සියලු සේවකයින්, ඒ ඒ ව්‍යවස්ථා සහ රෙගුලාසි සමඟ අනුගත වූ අදාළ දායකත්ව අරමුදල්වලින් ආවරණය වන්නේ ය.

(ආ) නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් - විශ්‍රාම පාරිතෝෂික

විශ්‍රාම පාරිතෝෂික හා සම්බන්ධයෙන් මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය තුළ හඳුනා ගෙන ගෙන ඇති වගකීම් වනාහි, වාර්තා කිරීමේ දිනය වන විට පවතින ප්‍රවර්තන පාරිතෝෂික බැඳියාවන්හි වටිනාකමයි. ශ්‍රී ලංකා ගිණුම් - SLFRS 19 “සේවක ප්‍රතිලාභ” ප්‍රමිතිය මගින් නිර්දිෂ්ට පරිදි, පාරිතෝෂික ගණනය කිරීමේ සූත්‍රයට අනුව, ප්‍රක්ෂේපිත ඒකක බැර ක්‍රමය භාවිතා කරමින් පාරිතෝෂික බැඳියා මානනය කරනු ලැබේ.

1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනතට අනුව අවුරුදු 05 ක අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කොට විශ්‍රාම යන සේවකයින්ට පමණක් පාරිතෝෂික ගෙවීම සඳහා සමාගම බැඳී සිටී.

ආයු ගණක ලැබීම් / පාඩු, ඒවා සිදු වූ කාල සීමාව අනුව, වෙනත් විස්තීර්ණ ආදායම් තුළ හඳුනා ගැනේ.

පාරිතෝෂික වගකීම විෂයයෙහි බාහිර වශයෙන් අරමුදල් සම්පාදනය නොකෙරේ.

.

3.13 අවිනිශ්චිතතා සහ ප්‍රාග්ධන බැඳියා

වාර්තා කරන දිනය වන විට පවත්නා සියලු සැලකිය යුතු ප්‍රාග්ධන බැඳියා හා අවිනිශ්චිතතා මූල්‍ය ප්‍රකාශ තුළ, ඊට අදාළ ඒ ඒ සටහන් වලින් හෙළිදරව් කරනු ලැබේ.

3.14 ආශ්‍රිත පාර්ශව සමග ගනුදෙනු

අයකරනු ලබන ගාස්තු පිළිබඳව සැලකීමක් නොකොට, මූල්‍ය හා මෙහෙයුම් තීරණ / ප්‍රතිපත්ති මත සැලකිය යුතු පාලනයක් හෝ බලපෑමක් ඇති කිරීම සඳහා එක් පාර්ශවයකට හැකියාව ලැබෙන ගනුදෙනු සම්බන්ධයෙන් හෙළිදරව් කිරීම් සිදු කරනු ලැබ තිබේ.

3.15 එක් කොටසක් අනුව ඉපැයීම්

සමාගම, ස්වකීය සාමාන්‍ය කොටස් විෂයයෙහි එක් කොටසක් අනුව වූ මූලික ඉපැයීම් ඉදිරිපත් කරයි. එක් කොටසක් අනුව වූ මූලික ඉපැයීම් ගණනය කරනු ලබන්නේ, සමාගමේ සාමාන්‍ය කොටස් හිමියන්ට ආරෝපණය කළ හැකි ලාභය හෝ අලාභය, අදාළ කාල සීමාව තුළ පරිශේෂව පැවති සාමාන්‍ය කොටස්වල බර තබන ලද සාමාන්‍ය සංඛ්‍යාවෙන් බෙදීම මගිනි.

3.16 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

මුදල් ප්‍රවාහ ප්‍රකාශය, "වක්‍ර ක්‍රමය" භාවිතා කර පිළියෙළ කර ඇත. ගෙවන ලද මූල්‍ය පිරිවැය, මෙහෙයුම් මුදල් ප්‍රවාහයක් ලෙස වර්ග කෙරේ. ණය ආපසු ගෙවීම් සහ ලත් මුදල්, මූල්‍යකරණ ප්‍රවාහ ලෙස වර්ග කර ඇත. මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය තුළ දැක්වෙන මුදල් සහ අතේ ඇති හා බැංකුවේ ඇති මුදල් සහ මාස තුනක හෝ ඊට අඩු කාලයකින් කල් පිරෙන කෙටි කාලීන තැන්පතු සමන්විත වනුයේ, බැංකුවේ ඇති මුදල් හා අතේ ඇති මුදල්වලින් සහ කෙටි කාලීන තැන්පතු වලිනි.

3.17 නව සහ සංශෝධිත ප්‍රමිති හා ඒවායේ අර්ථ නිරූපණය

සමාගමේ මූල්‍ය ප්‍රකාශ නිකුත් කළ දින දක්වා නිකුත් කරන ලද නමුත් මේ දක්වා ක්‍රියාත්මක නොවූ ප්‍රමිති සහ ඒවායේ අර්ථ නිරූපණ පහත සඳහන් පරිදි හෙළිදරව් කර ඇති අතර, මෙකී ප්‍රමිතීන්, අදාළ වන්නේ නම්, ඒවා ක්‍රියාත්මක වන විට යොදා ගැනීමට සමාගම අදහස් කරයි.

ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ SLFRS 17 ප්‍රමිතිය - රක්ෂණ ගිවිසුම්

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය, 2020 ජනවාරි මස 08 වන දින, ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ "SLFRS 17 - රක්ෂණ ගිවිසුම්" පිළිබඳ ප්‍රමිතිය නිකුත් කළේ ය. ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ SLFRS - 17 ප්‍රමිතිය සඳහා කෙරුණු සංශෝධන මගින් ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ SLFRS - 17 ප්‍රමිතිය, 2021 ජූනි මස 28 වන දින ප්‍රතිශෝධනයට භාජනය විය. ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ SLFRS - 17 ප්‍රමිතිය වූ කලී, හඳුනා ගැනීම, මානනය කිරීම, කරුණු ඉදිරිපත් කිරීම හා හෙළිදරව් කිරීම යන විෂයාංග ආවරණය කෙරෙන රක්ෂණ ගිවිසුම් පිළිබඳව වූ සවිස්තරාත්මක නව ගිණුම් ප්‍රමිතියකි. මෙම ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ SLFRS – 17 ප්‍රමිතිය ක්‍රියාත්මක වූ විට, 2005 වසරේ දී නිකුත් කරන ලද ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ SLFRS - 4 ප්‍රමිතිය එමගින් ප්‍රතිස්ථාපනය වෙනු ඇත. සියලු වර්ගවලට අයත් රක්ෂණ ගිවිසුම්, (එනම්, ජීවිත රක්ෂණ, ජීවිත නොවන රක්ෂණ, සෘජු රක්ෂණ හා ප්‍රතිරක්ෂණ) සම්බන්ධයෙන් ද, අභිමතානුසාරී සහභාගිත්වය සහිත ඇතැම් ඇප සහතික සහ මූල්‍ය සාධන පත්‍ර සම්බන්ධයෙන් ද, ඒවා නිකුත් කරනු ලබන අස්ථිත්වයන්හි වර්ගය පිළිබඳව සැලකීමක් නොකොට, මෙකී ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ SLFRS – 17 ප්‍රමිතිය අදාළ වේ.සමහර විෂයපථ ව්‍යතිරේක කීපයක් මෙහි දී අදාළ වේ. රක්ෂණ ගිවිසුම් විෂයයෙහි වඩාත් ප්‍රයෝජනවත් සහ සුසංගත ගිණුම්කරණ ආකෘතියක් රක්ෂණකරුවන් වෙත සපයා දෙනු ලැබීම, ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ SLFRS – 17 ප්‍රමිතියෙහි සමස්ත පරමාර්ථය වේ. ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ SLFRS - 4 ප්‍රමිතිය තුළ පැවති නියමයන්ගෙන් බොහෝ සෙයින් මුක්තව සිට කටයුතු කිරීමේ මීට පෙර පැවති පදනමට වඩා කැපී පෙනෙන වෙනස්කමක් සහිත ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ SLFRS - 17 ප්‍රමිතිය මගින්, ගිණුම්කරණයට අදාළ සියලු අංග ආවරණය කරමින් රක්ෂණ ගිවිසුම් සඳහා වූ සර්වග්‍රාහී ආකෘතියක් සම්පාදනය කර දෙනු ලැබ ඇත. පහත දැක්වෙන කරුණු ද පරිපූරණය කරන ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ SLFRS - 17 ප්‍රමිතියේ හරය වනුයේ, එහි පොදු ආකෘතියමය මොඩලයයි :

- සෘජු සහභාගිත්ව ලක්ෂණ සහිත (අඩු වැඩිවන ගාස්තු ප්‍රවේශයක් සහිත) ගිවිසුම් සඳහා වූ නිශ්චිත උපයුක්තීන්

- ප්‍රධාන වශයෙන්, කෙටි කාලයක් සඳහා වූ සරල බවට පත් කළ ප්‍රවේශයක් (වාරික වෙන්කර දීමේ ප්‍රවේශයක්)

අවශ්‍ය සංසන්දනාත්මක සංඛ්‍යා සහිතව, 2023 ජනවාරි මස 01 වන දිනයෙන් පසුව ආරම්භ වන හෝ ඉන් පසුව එළඹෙන වාර්ෂික වාර්තා කිරීමේ කාල පරිච්ඡේද සඳහා ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ SLFRS - 17 ප්‍රමිතිය බල පැවැත්වේ. මෙම ප්‍රමිතිය කලින් යොදා ගැනීමට අවසර ඇති නමුත්, එසේ කළ හැක්කේ, අස්ථිත්වය විසින්, ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ SLFRS - 17 ප්‍රමිතිය පළමුවෙන්ම යොදා ගනු ලබන දිනට හෝ ඊට පෙර ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ SLFRS - 9 ප්‍රමිතිය සහ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ SLFRS - 15 ප්‍රමිතිය ද අදාළ කර ගතහොත් පමණි. මෙකී ප්‍රමිතිය උපයුක්ත කර ගැනීම සම්බන්ධයෙන් සමූහයේ මූල්‍ය ප්‍රකාශ කෙරෙහි ප්‍රමාණවත් පරිදි සැලකිය යුතු බලපෑමක් ඇති වෙතැයි ආයතනය අපේක්ෂා නොකරයි.

	සටහන	2023 රු.	2022 රු.

4 ආදායම්

		2023	2022
යාත්‍රා ගමන්		878,675,085	1,802,122,355
ස්ව සන්තක යාත්‍රා මගින් නැව් බඩු ප්‍රවාහන ආදායම්			439,788,449
ස්ව සන්තක යාත්‍රා කුලියට දීමේ ආදායම්		5,336,832,861	2,978,237,896
ගල් අඟුරු සඳහා යාත්‍රා කුලියට දීමේ ආදායම්			2,246,567,897
නැව් බඩු නිෂ්කාශණ හා බෙදා හැරීම්		70,529,749	18,165,709
ඒජන්සි හා ඇමතුම් ගාස්තු		363,418,627	391,934,051
		6,649,456,322	7,876,816,356

5 වෙනත් ආදායම්

		2023	2022
ස්ථාවර වත්කම් විකිනීම මත ලාභය			
ලාභාංශ		142,606	
විනිමය ලැබීම්		421,233,863	356,654,971
පොලී ආදායම - ස්ථිර තැන්පතු හා භාණ්ඩාගාර බිල්පත්		172,649,328	45,379.467
පොලී ආදායම - සේවක මණ්ඩල ණය		1,476,204	1,642,484
ප්‍රමාද ගාස්තු අයකර ගැනීම් - ස්ව සන්තක යාත්‍රා			4,064,850
ලේඛන ගාස්තු අයකිරීම්		2,310,470	3,541,235
වෙනත්		237,766,729	60,265,190
		835,579,200	**471,548,197**

6 මෙහෙයුම් වලින් ලාභය / (අලාභය)

පහත දැක්වෙන දෑ ඇතුළු වියදම් අයගත කිරිමෙන් පසුව මෙහෙයුම්වලින් ලද ලාභය / (අලාභය) සඳහන් කෙරේ :

		2023	2022
විගණකවරුන්ගේ පාරිශ්‍රමික		810,000	760,000
ක්ෂය වීම්		438,441,316	420,194,198
වෘත්තිය හා නෛතික ගාස්තු		1,708,246	584,905
කාර්ය මණ්ඩල පිරිවැය (සටහන : 6.1)		162,388,788	153,924,140

6.1 කාර්ය මණ්ඩල පිරිවැය

		2023	2022
අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමික		488,500	596,050
වැටුප් හා වේතන		142,576,803	140,6 10,298
කාර්ය මණ්ඩල පුහුණුව		213,250	175,433
නිශ්චිත දායකත්ව සැලසුම් පිරිවැය - සේවක අර්ථසාධක අරමුදල			
නිශ්චිත දායකත්ව සැලසුම් පිරිවැය - සේවා නියුක්තයන්ගේ භාර අරමුදල		15,277,851	15,134.172
නිශ්චිත දායකත්ව සැලසුම් පිරිවැය - වැ.අ.වි.වැ.		119,631	
නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් පිරිවැය - විශ්‍රාම පාරිතෝෂික		3,712,753	(2,591,813)
		162,388,788	153,924,140

7 මූල්‍ය වියදම්

		2023	2022
මූල්‍ය වියදම්			
පොලී වියදම් - යාත්‍රා ණය		(1,569,949,48)	(727,535,758)
විනිමය අලාභ		(2,811,891,329)	(6,081,305,456)
		(4,381,840,810)	**(6,808,841,215)**

8 ආදායම් බදු ආදායම් / (වියදම්)

	සටහන	2023	2022
සාමාන්‍ය කටයුතු සඳහා බදු	**8.1**	191,305,299	
විලම්බිත බදු වත්කම් ප්‍රතිවර්තනය	**17**	1,232,219,356	1,197,593,218
		1,423,524,655	**1,197,593,218**

	සටහන	2023 රු.	2022 රු.
8.1 බද්දට යටත් ලාභය හා ගිණුම්කරණ ලාභය සැසදීම			
බද්දට පෙර ගිණුම්කරණ ලාභය		(433,605,111)	(4,567,786,074)
අඩු කළා : ආශ්‍රිත සමාගම්වල ලාභයේ කොටස (බද්දෙන් පසු)		(47,553,798)	(40,277,522)
		(481,158,909)	(4,608,063,596)
සමූහස්ථ ඉඩදිය නොහැකි විෂයාංග		4,826,429,966	7,234,195,429
සමූහස්ථ ඉඩදිය නොහැකි විෂයාංග		(88,386,647)	(29,963,768)
ණයගැති අපවය සඳහා අපවය ප්‍රතිපාදන		84,096,715	177,070,299
බද්දට යටත් නොවන ආදායම්		(174,268,138)	(47,021,951)
ව්‍යාපාරය මගින් තක්සේරු කළ හැකි ආදායම		4,166,712,987	2,726,216,413
ආයෝජන මගින් තක්සේරු කළ හැකි ආදායම		174,478,654	47,375,073
එකතු කළා : බද්දට යටත් වෙනත් ආදායම් - (පොලී ආදායම්)			
මුළු ව්‍යවස්ථාපිත ආදායම / තක්සේරු කළ හැකි ආදායම		4,341,191,641	2,773,591,486
බදු අලාභය ඉ/ගෙ		(3,632,522,709)	(6,406,114,195)
බදු වන ආදායම / (අලාභය)		708,668,932	(3,632,522,709)
බදු වන ආදායමට යටත් ලාභාංශ @ 14% (රු. 353,l22 @ 14%)		49,437	
24% බැගින් වූ බදු බැඳියාව		84,955,522	
30% බැගින් වූ බදු බැඳියාව		106,300,340	
වර්ෂය සඳහා සාමාන්‍ය කටයුතු මත ප්‍රවර්තන බදු	**8**	**191,305,299**	

9 එක් කොටසක් අනුව මූලික හා තනුක කළ ඉපැයීම්

මූලික හා තනුක කළ ඉපැයීම්, වාර්තා කිරීමේ කාලය තුළ නිකුත් කොට ඇති බර තැබූ සාමාන්‍ය සංඛ්‍යාවෙන්, සාමාන්‍ය කොටස් හිමිකරුවන් වෙත ආරෝපණය කළ හැකි ලාභය බෙදා ගණනය කිරීම මගින්, එක් කොටසක් අනුව ගණනය කරනු ලැබේ.

	2023	2022
ලවය ලෙස යොදා ගැනුනු මුදල		
කොටස් හිමිකරුවන් විෂයයෙහි ආරෝපිත ශුද්ධ ලාභය (රු.)	(624,910,4 10)	(4,567,786,074)
හරය ලෙස යොදා ගැනුනු මුදල		
නිකුතුවට අදාළ බර තැබූ සාමාන්‍ය කොටස් ගණන	5,000,000	5,000,000
එක් කොටසක් අනුව මූලික හා තනුක කළ ඉපැයීම් (රු.)	(124.98)	**(913.56)**

එක් කොටසක් අනුව මූලික හා තනුක කළ ඉපැයීම්

මූලික හා තනුක කළ ඉපැයීම්, වාර්තා කිරීමේ කාලය තුළ නිකුත් කොට ඇති බර තැබූ සාමාන්‍ය සංඛ්‍යාවෙන්, සාමාන්‍ය කොටස් හිමිකරුවන් වෙත ආරෝපණය කළ හැකි ලාභය බෙදා ගණනය කිරීම මගින්, එක් කොටසක් අනුව ගණනය කරනු ලැබේ.

ලවය ලෙස යොදා ගැනුනු මුදල

කොටස් හිමිකරුවන් විෂයයෙහි ආරෝපිත ශුද්ධ ලාභය / අලාභය (රු.)	(624,910,410)	(4,567,786,074)

1O දේපළ, පිරියත හා උපකරණ

	ඉඩම්	නිවාස ව්‍යාපෘති	ගොඩනැගිලි	යාත්‍රා	වියළි තටාකාංගන වැඩ	මෝට වාහන	ගෘහ භාණ්ඩ සහ සවිකිරීම් හා උපකරණ	පරිගණක	එකතුව
	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.
පිරිවැය තක්සේරුව									
2022 අප්‍රේල් 1 දිනට ශේෂය	4,000,000	1,286,340	43,390	11,235,780,363	41,296,844	37,002,095	21,561,616	25,743,121	11,366,713,769
වර්ෂය තුළ එකතු කිරීම්	10,337,000						11,778,792	1,683,350	23,799,142
වර්ෂය තුළ වියළි තටාකාංගන වැඩවලින් මාරු කිරීම්					319,252,224				319,252,224
වර්ෂය තුළ නියාදනය කිරීම්	(4,000,000)	(1,286,340)					(256,720)		(5,543,060)
ප්‍රත්‍යාගණනය	241,863,000								241,863,000
වර්ෂය තුළ මාරු කිරීම්									
2023 මාර්තු 31 දිනට ශේෂය	252,200,000		43,390	11,235,780,363	360,549,068	37,002,095	33,083,688	27,426,471	11,946,085,075
සමුච්චිත ක්ෂය වීම්									
2022 අප්‍රේල් 1 දිනට ශේෂය		1,269,688	43,390	2,418,267,846	7,082,692	35,215,862	14,934,553	21,647,576	2,498,461,607
පද්ධති දෝෂ නිවැරදි කිරීම							5,737		5,737
ක්ෂය සමාලෝචන ගැළපුම්				(256,884,612)		(23,245,147)			(280,129,760)
වර්ෂය සඳහා ගාස්තු		7,587		364,809,737	68,786,092	1,479,637	1,769,888	1,588,375	438,441,316
ගැළපුම්									
නියාදනය සඳහා		(1,277,275)					(255,868)		(1,533,143)
මාරු කිරීම සඳහා									
2023 මාර්තු 31 දිනට ශේෂය			43,390	2,526,192,971	75,868,784	13,450,351	16,454,3 11	23,235,951	2,655,245,757

ශුද්ධ පොත් අගය	සටහන	2023	2022
		රු.	රු.
ඉඩම්		252,200,000	4,000,000
නිවාස ව්‍යාපෘති			16,652
ගොඩනැගිලි			
යාත්‍රා		8,709,587,392	8,817,512,517
තටාකාංගන වැඩ		284,680,283	34,214,152
මෝටර් වාහන		23,551,743	1,786,233
ගෘහ භාණ්ඩ හා සවිකිරීම්		16,629,377	6,627,063
කාර්යාල උපකරණ හා පරිගණක		4,190,520	4,095,545
		9,290,839,316	8,868,252,162
	10.2	9,290,839,316	8,868,252,1 62

කළමනාකරණය විසින් ගනු ලැබූ තීරණයකට අනුව, අලුත් මාවතට යාබදව 18 වන පටු මගෙහි පිහිටි ඉඩම සහ ගොඩනැගිල්ල, තව දුරටත් සමාගමේ වත්කම් නොවන හෙයින්, පොත්වලින් කපා හැරිණි.

	සටහන	2023 රු.	2022 රු.
10.1 කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ - ගොඩනැගිලි			
වර්ෂය ආරම්භයේ දී ශේෂය			
වර්ෂය අවසානයේ දී ශේෂය		315,610	
වර්ෂය අවසානයේ දී ශේෂය		315,610	
10.2 ස්ථාවර වත්කම්වල ඉදිරියට ගෙනයන ධාරක වටිනාකම			
පිරිවැය අනුව		9,038,639,316	8,864,252,162
තක්සේරු කිරීම් අනුව		252,200,000	4,000,000
	10	9,290,839,316	8,868,252,162

11 කෙරෙමින් පවත්නා ප්‍රාග්ධන වැඩ - යාත්‍රා වියළි තටාකාංගන වැඩ

	සිලෝන් බ්‍රීස් යාත්‍රාව රු.	සිලොන් ප්‍රින්සස් යාත්‍රාව රු.	එකතුව රු.
පිරිවැය			
2022 අප්‍රේල් 1 දිනට ශේෂය	-	119,621,698	119,621,698
වර්ෂය තුළ එකතු කිරීම්	-	199,630,526	199,630,526
ණය ගැනුම් පිරිවැය	-	-	-
දේපළ, පිරියත හා උපකරණවලට මාරු කිරීම්	-	(319,252,224)	(319,252,224)
2023 මාර්තු 31 දිනට ශේෂය	-	-	-

	2023 රු.	2022 රු.
12 අස්පෘෂ්‍ය වත්කම් පරිගණක මෘදුකාංග පිරිවැය		
වර්ෂය ආරම්භයේ දී ශේෂය	6,144,497	6,144,497
වර්ෂය අවසානයේ දී ශේෂය	6,144,497	6,144,497
සමුච්චිත ක්‍රමක්ෂය		
වර්ෂය ආරම්භයේ දී ශේෂය	6,144,497	6,144,497
වර්ෂය අවසානයේ දී ශේෂය	6,144,497	6,144,497
මාර්තු 31 දිනට ලියා අඩු කළ අගය		

මෘදුකාංග පැකේජයේ පිරිවැය, ඒවායේ ප්‍රක්ෂේපිත ප්‍රයෝජ්‍ය ආයු කාලය අනුව ක්‍රමක්ෂය කොට තිබේ. තවද, ගිණුම් මෘදුකාංග පැකේජය, සමාගමේ අවශ්‍යතාවයන්ට අනුව නොගැළපෙන අතර පරිශීලක හිතෛෂී ද නොවේ. එබැවින්, පිරිවැයක් දැරීමට සිදු නොවන හා වගකීමට බැඳී නොසිටින පදනමක් මත, අවශ්‍ය කාර්යය පිරිමසා ගැනීමට හැකිවන පරිදි සමාගමේ එකහතාව මත සැපයුම්කරු විසින් එම පැකේජය ස්ථාපනය කරන ලදී. එමෙන්ම, අලෙවියෙන් පසු අදාළ බලපත් සේවාවන් ද සැපයුම්කරු විසින් සපයා නොදෙන ලදී.

එසේ හෙයින්, ලංකා නැව් සංස්ථාව සඳහා නව පරිශීලක හිතෛෂී මෘදුකාංගයක් මිල දී ගැනීමට අප සැලසුම් කර ඇති අතර, ඒ සඳහා තාක්ෂණ ඇගයීම් කමිටුවක් දැනටමත් පත් කර ඇත. එබැවින්, ආයතනයට වටිනාකමක් නොමැති මෘදුකාංගය මත ප්‍රත්‍යාගණනය කිරීම් කිසිවක් සිදු කිරීම සඳහා ලංකා නැව් සංස්ථා කළමනාකාරිත්වය නිර්දේශ ඉදිරිපත් කර නොමැත.

			2023 රු.	2022 රු.
13 පාලිත සමාගම්වල ආයෝජන				
	කොටස් සංඛ්‍යාව	ධාරිතා ප්‍රතිශතය		
සී/ස සිලෝන් ෂිපිං එජන්සි (පුද්.) සමාගම				
දුබලතා සඳහා ප්‍රතිපාදන	9,999	100%		

සමාගම, ස්වකීය පාලිත සමාගමේ ව්‍යාපාර කටයුතු නතර කර දැමිය යුතුයැයි 2006 මාර්තු මස 20 වන දින පැවති සිය අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී හේතූන් බොහොමයක් මත ගන්නා ලද තීරණය අනුව අදහස් කළ ද, එම පාලිත සමාගමේ මූල්‍ය ප්‍රකාශ සමාගම විසින් ඒකාබද්ධ නොකරන ලදී. පසු කාලීනව, එකී පාලිත සමාගම වසා දැමීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කරන ලද අතර කොළඹ මහාධිකරණයේ අධීක්ෂණය යටතේ (නඩු අංක : HC (Civil) 56/2013/CO යටතේ), එම සමාගම වසා දමන ලදී. ඒ අනුව, සී/ස සිලෝන් ෂිපිං ඒජන්සි (ප්‍රයිවේට්) ලිමිටඩ් නමැති අංක : N (PVS) 6037 යටතේ 2016.07.28 වන දින සිට බලපැවැත්වෙන පරිදි ලියාපදිංචි කර තිබූ එම සමාගම, 2016.09.02 වන දිනැති ගැසට් නිවේදනය මගින් විසුරුවා හරින ලද අතර එම ආයතනය, එය තවදුරටත් ක්‍රියාත්මකව නොපවතී. තවද, සමාගම් රෙජිස්ට්‍රාර්වරයා විසින් එම සමාගමේ නාමය, සමාගම් නාම ලේඛනයෙන් ද කපා හරිනු ලැබ තිබේ.

14 ආශ්‍රිත සමාගම්වල ආයෝජන

	2023	2022
කොටස් ස්කන්ධ ක්‍රමය අනුව ඉදිරියට ගෙන යන වටිනාකම		
සී/ස සිලෝන් ෂිපිං ලයින්ස් (ප්‍රයිවේට්) ලිමිටඩ්	362,388,988	330,963,192
සී/ස සිලෝන් ෂිපිං ඒජන්සි (ප්‍රයිවේට්) ලිමිටඩ් - සිංගප්පූරුව	207,561,357	101,840,108
	569,950,345	432,803,300

14.1 **ආශ්‍රිත සමාගම්වල ආයෝජන**

පිරිවැය	කොටස් සංඛ්‍යාව	ධාරිතා ප්‍රතිශතය	2023	2022
සී/ස සිලෝන් ෂිපිං ලයින්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	156,942	39%	1,569,420	1,569,420
සී/ස සිලෝන් ෂිපිං ඒජන්සි (ප්‍රයිවට්) ලිමිටඩ් - සිංගප්පූරුව	24,500	49%	143,622	143,622
			1,713,042	1,713,042

14.2 කොටස් ස්කන්ධ ක්‍රමය අනුව ආශ්‍රිත සමාගම්හි ආයෝජනවල සංචලනය

	2023	2022
ශුද්ධ වත්කම්වල ආයෝජකගේ කොටස		
වර්ෂය ආරම්භයේ දී ශේෂය	432,803,300	387,476,863
ආශ්‍රිත සමාගම්වල ලාභ කොටස (බදු අඩු කළ) (14.2)	**47,553,798**	**40,277,522**
ආශ්‍රිත සමාගම්වල වෙනත් විස්තීරණ ආදායම් කොටස (බදු අඩු කළ)	89,946,369	5,402,037
ලාභාංශ ආදායම	(353,122)	(353,122)
වර්ෂය අවසානයේ දී ශේෂය	569,950,345	432,803,300

14.3 ආශ්‍රිත සමාගම්වල සංක්ෂිප්ත මූල්‍ය තොරතුරු

	සී/ස සිලෝන් ෂිපිං ඒජන්සි (ප්‍රයිවේට්) ලිමිටඩ් සිංගප්පූරුව		සී/ස සිලෝන් ෂිපිං ලයින්ස් (ප්‍රයිවේට්) ලිමිටඩ්	
දෙසැම්බර් 31 දිනට	**2022**	**2021**	**2022**	**2021**
මුළු වත්කම්	1,076,333,373	453,459,584	1,255,044,353	1,038,018,572
මුළු බැරකම්	645,276,426	238,160,289	279,230,220	142,481,558
ශුද්ධ වත්කම්	431,056,947	215,299,295	975,814,133	895,537,013
ආදායම	2,224,810,359	1,733,064,950	761,106,290	469,278,941
මෙහෙයුම් වියදම්	2,193,896,688	1,705,446,443	739,294,337	447,552,799
වෙනත් ආදායම්	1,046,074	1,585,641	19,654,124	27,588,477
වර්ෂය සඳහා ලාභය	29,755,333	26,287,078	84,547,911	65,777,083
වර්ෂය සඳහා මුළු විස්තීරණ ආදායම	186,002,319	9,708,333	(3,063,504)	1,653,728

	සටහන	2023	2022
		රු.	රු.

15 මූල්‍ය සාධන පත්‍ර

මූල්‍ය වත්කම් සහ මූල්‍ය බැරකම් කාණ්ඩ

මූල්‍ය වත්කම්හි සහ මූල්‍ය බැරකම්හි ඉදිරියට ගෙන යන ධාරක අගය මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුළ වාර්තා කරනු ලැබ ඇති පරිදි පහත සඳහන් වේ :

මූල්‍ය වත්කම්හි සහ මූල්‍ය බැරකම්හි ඉදිරියට ගෙන යන ධාරක අගයන්

15.1 මූල්‍ය වත්කම්

5.1.1 විකිණීම පිණිස ඇති ආයෝජන

	සටහන	2023 රු.	2022 රු.	
ලැයිස්තුගත ආයෝජන		45,316,140	53,306,091	16.1
ලැයිස්තුගත නොකළ ආයෝජන	16.2	2,377,070	2,377,070	
		47,693,210	55,683,161	

ලැයිස්තුගත ආයෝජන මානනය කරනු ලබන්නේ, සක්‍රීය වෙළඳපොළේ ලැයිස්තුගත මිල පදනම් කරගත් සාධාරණ අගය අනුව ය. ලැයිස්තුගත නොකළ ආයෝජන මානනය කරනු ලබන්නේ, ඒවායේ සාධාරණ අගය විශ්වාසදායක ලෙස මනිනු ලැබිය නොහැකි බැවින්, ඒවාට අදාළ දුබලතාවයට පත්වීම සඳහා වූ ප්‍රතිපාදන අඩු කරන ලද ගත් මිලට ය.

15.1.2 කල්පිරීම සඳහා තබා ඇති ආයෝජන

	සටහන	2023 රු.	2022 රු.
භාණ්ඩාගාර බිල්පත්හි ආයෝජන	20	464,999,999	447,289,305

කල්පිරීම සඳහා තබා ඇති ආයෝජන මනිනු ලබන්නේ, පොලී ලැබීම් නියමිත ඇතුළත්ව ය.

15.1.3 ණය සහ ලැබීම් නියමිත

	සටහන	2023 රු.	2022 රු.
වෙළඳ හා වෙනත් ලැබීම් නියමිත	18	951,582,262	1,472,984,001
කෙටි කාලීන ආයෝජන	21	26,268,205	25,533,587
මුදල් හා මුදල් සමාන දෑ	22	1,305,653,577	729,586,947
		2,283,504,043	2,228, 104,535

ණය සහ ලැබීම් නියමිත, ඒවායේ ඉදිරියට ගෙන යන වටිනාකම අනුව සඳහන් කෙරෙනුයේ, ඒවායේ ඉදිරියට ගෙනයන වටිනාකම සාධාරණ අගයට ආසන්න වන හෙයිනි.

		2023 රු.	2022 රු.
මුළු මූල්‍ය වත්කම්		**2,796,197,252**	**2,731,077,001**

15.2 මූල්‍ය බැරකම්

	සටහන	2023 රු.	2022 රු.
වෙළඳ හා වෙනත් ගෙවීම් නියමිත	30	1,792,767,053	1,555,707,720
මුළු මූල්‍ය බැරකම්		**1,792,767,053**	**1,555,707,720**

මූල්‍ය බැරකම්, ඒවායේ ඉදිරියට ගෙනයන වටිනාකම අනුව සඳහන් කෙරෙනුයේ ඒවායේ ඉදිරියට ගෙනයන වටිනාකම සාධාරණ අගයට ආසන්න වන බැවිනි.

	සටහන	2023 රු.	2022 රු..
16 විකිණීම පිණිස ඇති මූල්‍ය වත්කම්			
ලැයිස්තුගත ආයෝජන	**16.1**	45,316,140	53,306,091
ලැයිස්තුගත නොකළ ආයෝජන	**16.2**	2,377,070	2,377,070
		47,693,210	**55,683,161**

16.1 ලැයිස්තුගත ආයෝජන

වර්ෂය ආරම්භයේ දී ශේෂය		53,306,091	17,243,984
සාධාරණ අගයෙහි වෙනස්වීම් මත ලාභ / අලාභ		(7,989,951)	36,062,107
වර්ෂය අවසානයේ දී ශේෂය	16	45,316,140	53,306,091

	කොටස් ගණන	2023 පිරිවැය රු.	2023 වෙළෙඳපළ අගය රු.	2022 පිරිවැය රු.	2022 වෙළෙඳපළ අගය රු.
මර්කන්ටයිල් ෂිපිං කම්පනි පී එල් සී	238,506	2,068,800	45,316,140	2,068,800	53,306,091

16.2 ලැයිස්තුගත නොකළ ආයෝජන

ලැයිස්තුගත නොකළ ආයෝජන මානනය කරනු ලබන්නේ, ඒවායේ සාධාරණ අගය විශ්වාසදායක ලෙස මනිනු ලැබිය නොහැකි බැවින්, ඒවාට අදාළ දුබලතා අලාභ අඩු කරන ලද ගත් මිලට ය.

	සටහන / කොටස් ගණන	2023 රු.	2022 රු.
සී/ස ලංකා එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම	31,206	312,060	312,060
සිලෝන් පෝර්ට් සර්විසස් ලිමිටඩ්	5,000	50,000	50,000
ලංකා පෝර්ට් මැනේජ්මන්ට් ඇන්ඩ් කන්සල්ටන්සි ලිමිටඩ්	1,501	15,010	15,010
සී/ස ලංකා කෝල් කම්පනි (පෞද්.) සමාගම	200,000	2,000,000	2,000,000
	16	2,377,070	2.377,070

17 විලම්බිත බදු වත්කම් / (බැරකම්)

වර්ෂය ආරම්භයේ දී ශේෂය		(1,005,140,668)	192,452,549
වර්ෂය තුළ ප්‍රතිවර්තන			
වර්ෂය තුළ දී		(1,232,219,356)	(1,197,593,218)
වර්ෂය අවසානයේ දී ශේෂය	**17.1**	**(2,237,360,024)**	**(1,005,140,668)**

වත්කම්වල හා බැරකම්වල ඉදිරියට ගෙන යන ධාරක වටිනාකම සහ වත්කම් හා බැරකම්වල බදු පදනමේ ඉදිරියට ගෙන යන ධාරක වටිනාකම අතර තාවකාලික වෙනස්කම් මත විලම්බිත බද්ද හඳුනා ගනු ලබන අතර, 30% ක් වූ සඵල පොලී අනුපාතය අනුව විලම්බිත බද්ද ගණනය කරනු ලැබ ඇත.

	සටහන	2023 රු.	2022 රු.
17.1 බදු වත්කම්වල හා බැරකම්වල විලම්බිත බදු විශ්ලේෂණය			
විලම්බිත බදු බැරකම්			
වැඩිවන ක්ෂය කිරීම් මගින්		(2,623,018,555)	(2,117,506,773)
		(2,623,018,555)	(2,117,506,773)
විලම්බිත බදු වත්කම්			
බදු අලාභ මගින්			822,607,358
දුබලතා සඳහා ප්‍රතිපාදන		376,854,005	281,299,993
විශ්‍රාම ප්‍රතිලාභ බැඳියා මගින්		8,804,526	8,458,754
		385,658,531	1,112,366,105
	17	(2,237,360,024)	(1,005,140,668)

අනාගතයේ දී බද්දට යටත් විය හැකි ලාභ / අලාභ මගින් අදාළ බදු ප්‍රතිලාභ උපලබ්ධි වෙතැයි අනුමාන කෙරෙන තාක් දුරකට, විශ්‍රාම ප්‍රතිලාභ බැඳියා හා බදු අලාභ විෂයයෙහි විලම්බිත බදු වත්කම් හඳුනා ගැනෙන අතර, විලම්බිත බදු බැඳියා හඳුනා ගැනෙනුයේ, වැඩිවන ක්ෂය කිරීම් හා ප්‍රත්‍යාගණන අතිරික්ත කාර්යයන් සඳහා ය.

18 වෙළෙඳ හා වෙනත් ලැබීම් නියමිත

	සටහන	2023 රු.	2022 රු.
වෙළෙඳ ලැබීම් නියමිත	**18.1**	823,789,516	1,288,730,656
තැන්පතු සහ අත්තිකාරම්	**18.2**	16,099,543	15,388,654
කාර්ය මණ්ඩල ලැබීම් නියමිත	**18.3**	47,665,131	45,351,301
වෙනත් ලැබීම් නියමිත	**18.4**	64,028,070	123,513,390
		951,582,262	**1,472,984,001**

18.1 වෙළෙඳ ලැබීම් නියමිත

	2023 රු.	2022 රු.
වෙළෙඳ ලැබීම් නියමිත	2,070,76 1,878	2,460,530,760
වෙළඳ පාලන ගිණුම (දේශීය)	8,924,457	-
ගල් අඟුරු ගනුදෙනු පාලන ගිණුම	283,199	283,199
දුබලතා සඳහා ප්‍රතිපාදන	(1,256,180,018)	(1,172,083,303)
	823,789,516	1,288,730,656

වෙළඳ ලැබීම් නියමිත තුළ සම්බන්ධිත පාර්ශව වලින් ලැබෙන පහත දැක්වෙන ලැබීම් නියමිත අඩංගු ය :

සම්බන්ධිත පාර්ශව වලින් ලැබීම් නියමිත

	2023 රු.	2022 රු.
රාජ්‍ය ආයතන	328,159,860	492,899,641

වෙළඳ ලැබීම් නියමිතවල ආයු කාල සීමා පහත දැක්වේ :

	2023 රු.	2022 රු.
එක් අවුරුද්දක් දක්වා	779,186,765	1,259,424,908
අවුරුදු 1 සිට 4 දක්වා	257,530,960	228,907,326
අවුරුදු 4 ට වැඩි	1,034,044,153	972,198,525
	2,070,761,878	2,460,530,760

වෙළඳ ලැබීම් නියමිත, දුබලතාවයට පත් වීම් විෂයයෙහි සමාලෝචනය කිරීම් සිදු කර ඇත. ඇතැම් වෙළඳ ලැබීම් නියමිත දුබලත්වයට පත් වී ඇති බව සොයා ගැනුණි. එවැනි දුබලතාවයට පත් වීම් සඳහා, 3.10.1 වන සටහනෙහි සඳහන් පදනම මත පිහිටා ප්‍රතිපාදන සලසා ඇත.

වෙළඳ ලැබීම් විෂයයෙහි සලසන ලද ප්‍රතිපාදන පිළිබඳ විස්තර :

	2023 රු.	2022 රු.
නිශ්චිත දුබලතා		
රාජ්‍ය ආයතන	36,206,870	36,206,870
විදේශීය නියෝජිතයන්	64,024,592	64,024,592
පෞද්ගලික ආයතන	44,083,601	44,083,601
වෙනත්	16,931,052	16,931,052
සාමූහික දුබලතා	1,094,933,903	1,010,837,188
	1,256,180,018	1,172,083,303

	සටහන	2023 රු.	2022 රු.
18.2 තැන්පතු හා අත්තිකාරම්			
බහාලුම් තැන්පතු		11,674,692	13,243,865
වෙනත් ආපසු ගෙවිය යුතු තැන්පතු		6,653,732	6,124,052
අත්තිකාරම්		6,100,028	4,349,646
		24,428,453	23,717,563
දුබලතා සඳහා ප්‍රතිපාදන		(8,328,910)	(8,328,910)
	18	16,099,543	15,388,654
18.3 කාර්ය මණ්ඩල ලැබීම් නියමිත			
කාර්යමණ්ඩල සඳහා ණය		45,242,842	41,145,250
අත්තිකාරම් සහ වෙනත්		2,422,289	4,206,051
	18	47,665,131	45,351,301
18.4 වෙනත් ලැබීම් නියමිත			
ඇප අලුත්වැඩියා ලැබීම් නියමිත		19,839,635	19,839,635
වෙනත්		67,490,246	126,975,566
		87,329,881	146,815,201
දුබලතා සඳහා ප්‍රතිපාදන		(23,301,810)	(23,301,810)
	18	64,028,070	123,513,390
19 ව්‍යවස්ථාපිත ලැබීම් නියමිත			
රඳවා ගැනීමේ බද්ද		8,486,749	8,481,465
භාණ්ඩ හා සේවා බද්ද		18,936,777	18,936,777
දුබලතා සඳහා ප්‍රතිපාදන		(18,936,777)	(18,936,777)
ජාතික ආරක්ෂක බද්ද		2,612,349	2,612,349
දුබලතා සඳහා ප්‍රතිපාදන		(2,612,349)	(2,612,349)
ද්විත්ව බදු			
		8,486,749	**8,481,465**
20 කල් පිරීම අපේක්ෂිතව තබා ඇති ආයෝජන			
භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජන		**464,999,999**	**447,289,305**
21 කෙටි කාලීන ආයෝජන			
ස්ථිර තැන්පතුවල ආයෝජන	**21.1**	2,009,601	1,981,012
රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව - කාර්යමණ්ඩල ණය		24,258,604	23,552,575
		26,268,205	25,533,587
21.1 ස්ථාවර තැන්පතුවල ආයෝජන			
ලංකා බැංකුව		1,310,700	1,310,700
කොමර්ෂල් බැංකුව (පි.එල්.සී)		35,000	35,000
කොමර්ෂල් බැංකුව (පි.එල්.සී) ආරක්ෂණ හා නිවාස ණය		663,901	635,312
	21	2,009,601	1,981,012

	සටහන	2023 රු.	2022 රු.
22 මුදල් හා මුදල් සමාන දෑ			
අතැති මුදල්		132,173	49,766
යාත්‍රාපති සතු මුදල්		9,119,140	1,781,797
බැංකුවේ ඇති මුදල්		1,296,402,265	727,755,385
මුදල් ප්‍රවාහ ප්‍රකාශය සඳහා ශේෂය		1,305,653,577	729,586,947
23 ප්‍රකාශිත ප්‍රාග්ධනය			
නිකුත් කළ හා සම්පූර්ණයෙන් ගෙවූ එකක් රු.10 බැගින් වූ කොටස් 5,000,000		**50,000,000**	**50,000,000**

24 කොටස් ප්‍රාග්ධනය සඳහා දායකත්වය

ප්‍රාග්ධන දායකත්වය වෙනුවෙන් ද, කාරක ප්‍රාග්ධනය සඳහා වූ අත්තිකාරම් වෙනුවෙන් ද, නැව් තොටු සේවා උදෙසා නව මඟී පර්යන්තයක් සඳහා වූ ආයෝජනය කිරීම වෙනුවෙන් ද භාණ්ඩාගාරයෙන් ලැබුණු මුදල් මෙයින් නියෝජනය වේ.

25 ප්‍රාග්ධන සංචිතය

මෙයින් නියෝජනය වන්නේ, "ඇස්ටාසා" (ASTARSA) ණය සහ මහජන බැංකුවෙන් ලබා ගන්නා ලද භාණ්ඩාගාර ඇප සහතික ලත් ණය ඇතුළුව සමාගම වෙනුවෙන් මහ භාණ්ඩාගාරය විසින් එම ණය පියවීම සඳහා කරන ලද නිරවුල් කිරීම ය.

26 ප්‍රත්‍යාගණන සංචිතය

2023.02.27 වන දින දී ශ්‍රී ලංකා වරාය අධිකාරිය වෙතින් ලංකා නැව් සංස්ථාව වෙත පවරා ගැනුනු කොළඹ 2, කොම්පඤ්ඤ වීදියේ, කිව් පාරේ පිහිටි ඉඩම ප්‍රත්‍යාතගණනය කිරීම විෂයයෙහි මෙම ප්‍රත්‍යායගණන සංචිතය අදාළ වේ.

	සටහන	2023 රු.	2022 රු.
28 දිගු කාලීන ණය ගැනීම්			
මහජන බැංකුව - යාත්‍රා ණය	**28.1**	15,330,225,172	15,046,963,632
මහජන බැංකුව - පොලී ප්‍රාග්ධනීකරණ ණය	**28.2**	781,720,627	985,927,982
		16,111,945,799	**16,032,891,614**
28.1 මහජන බැංකුව - යාත්‍රා ණය			
වර්ෂය ආරම්භයේ දී ශේෂය		16,422,344,312	12,208,266,998
වර්ෂය තුළ ගෙවීම්		(1,732,589,251)	(1,118,243,078)
විනිමය ලැබීම්			(36,000)
විනිමය අලාභ		2,186,126,691	5,332,356,392
		16,875,881,752	16,422,344,312
වසරක් තුළ ආපසු ගෙවිය යුතු	**31**	1,545,656,580	1,375,380,680
එක් වසරකින් පසු ආපසු ගෙවිය යුතු	**28**	15,330,225,172	15,046,963,632

මුළු මුදල සහ කාල සීමාව ආවරණය වන පරිදි ඇප සහතිකයක් මහ භාණ්ඩාගාරයෙන් ලබා දී ඇත.

	සටහන	2023 රු.	2022 රු.
28.2 මහජන බැංකුව - පොලී ප්‍රාග්ධනීකරණ ණය			
වර්ෂය ආරම්භයේ දී ශේෂය		1,267,582,026	951,702,211
වර්ෂය තුළ ගෙවූ වාරික		(359,485,510)	(95,612,623)
විනිමය අලාභ		190,147,698	411,492,438
වර්ෂය අවසානයේ දී ශේෂය		1,098,244,214	1,267,582,026
වසරක් තුළ ආපසු ගෙවිය යුතු	**31**	316,523,587	281,654,044
එක් වසරකින් පසු ආපසු ගෙවිය යුතු	**28**	781,720,627	985,927,982

මුළු මුදල සහ කාල සීමාව ආවරණය වන පරිදි ඇප සහතිකයක් මහ භාණ්ඩාගාරයෙන් ලබා දී ඇත.

	සටහන	2023 රු.	2022 රු.
29 විශ්‍රාම ප්‍රතිලාභ බැඳියා - පාරිතෝෂික			
වර්ෂය ආරම්භයේ දී ශේෂය		35,244,807	40,406,325
වර්ෂය සඳහා ප්‍රතිපාදන	**29.1**	3,712,753	(2,591,813)
		38,957,560	37,814,512
ගෙවිය යුතු පාරිතෝෂික			
වර්ෂය තුළ දී කරන ලද ගෙවීම්		(9,609,140)	(2,569,705)
වර්ෂය අවසානයේ දී ශේෂය		**29,348,420**	**35,244,807**
29.1 වර්ෂය සඳහා ප්‍රතිපාදන			
ප්‍රවර්තන සේවා පිරිවැය		1,643,803	2,096,625
වර්ෂය සඳහා පොලී අය කිරීම		4,248,212	2,893,554
ජීවගණක උපකල්පන වෙනස්වීම් නිසා උද්ගත වූ පාඩු		(2,179,262)	(7,581,992)
	29	3,712,753	(2,591,813)

භාවිතා කරන ලද ප්‍රධාන උපකල්පන පහත දැක්වේ :

	2023	2022
වට්ටම් සාධකය	15.00%	7.50%
අපේක්ෂිත අනාගත වැටුප් වැඩිවීම්	1.04%	1.17%
කාර්යමණ්ඩල පිරිවැටුම් සාධකය	12.73%	6.78%
විශ්‍රාම ගැනීමේ වයස	60 years	62 years

විශ්‍රාම ප්‍රතිලාභ බැඳියාව කෙතෙක්දැයි යන්න නිශ්චය කර ගනු සඳහා, කළමණාකාරිත්වය විසින් යොදා ගත් විචල්‍යතාවයන්යන්ගේ ප්‍රශස්ත ඇස්තමේන්තු පදනම් කර ගෙන මෙම උපකල්පන ගොඩනගන ලදී. දිගු කාලීන රජයේ බැඳුම්කර වල වෙළඳපළ අනුපාත පදනම් කර ගෙන වට්ටම් සාධකය නිශ්චය කරන ලදී.

	2023 රු.	2022 රු.
30 වෙළෙඳ සහ වෙනත් ගෙවීම් නියමිත		
වෙළඳ ගෙවීම් නියමිත	681,119,958	1,279,225,6!0
තැන්පතු	4,898,310	3,557,414
යත්‍රා ණය සහ ගෙවිය යුතු පොලිය	983,259,229	149,421,266
වෙනත්	123,489,555	123,503,429
	1,792,767,053	**1,555,707,720**
31 කෙටි කාලීන ණය ගැණුම්		
මහජන බැංකුව - යාත්‍රා ණය	**1,862,180,167**	1,657,034,724
32 ව්‍යවස්ථාපිත ගෙවීම් නියමිත		
ආදායම් බද්ද	200,086,629	9,665,215
ගෙවිය යුතු රඳවා ගැනීමේ බදු	172,571	
මුද්දර බද්ද	30,424	28,374
එකතු කළ අගය මත වැට් බද්ද	66,286,396	61,006,162
	266,576,020	70,699,752
33 උපචිත වියදම්		
	46,610,045	28,588,636

34 අසම්භාව්‍ය වගකීම්

සමාගමේ සාමාන්‍ය ව්‍යාපාරික කටයුතු කරගෙන යාමේ දී උද්ගත වන නෛතික හිමිකම් පෑම් සලකා බැලීම සඳහා හැරුනු විට, එම හිමිකම් පෑම් සාධාරණීකරණය කළ හැකි හා ඒවා නිරවුල් කිරීමේදී ඇති විය හැකි දුරස්ථභාවය හේතුවෙන් යම් මුදල් විගලනය වීමේ සම්භාවිතාවක් පැවතියේ වුව ද, මූල්‍ය ප්‍රකාශයන්හි ඊට අදාළ ගැළපුම් හා හෙළිදරව් කිරීම් සිදු කිරීම අවශ්‍ය වූ උපලබ්ධිගත අසම්භාව්‍ය වගකීම් කිසිවක්, වාර්තා කිරීමේ කාල පරිච්ඡේදයේ අවසාන දිනය වන විට නොවී ය. මෙම අගැයුම, සමාගමේ නීති අංශයීය නෛතික මතය හා එකඟ වේ. ඒ අනුව, පහත දැක්වෙන කාරණා සම්බන්ධයන් ප්‍රතිපාදන සැලසීමක් සිදු කර නොමැත.

1. 2011 වර්ෂයේ දී ලංකා මහපොළ නෞකාව 'ට්‍රිපල් "එස්" ෂිපිං ලිමිටඩ්' (M/S Triple "S" Shipping Ltd.) ආයතනයට කුලියට දෙන ලදී. මේ සඳහා කුලිය කිපවතාවක්ම ගෙවූ නමුත්, පසුව එම ආයතනය ගෙවීම් පැහැර හැරියේ ය. ඉන්පසු එම නැව නිසි පරිදි භාරදීමක්වක්, නැවේ කාර්යය මණ්ඩලයට වැටුප් වශයෙන් ගෙවීමට ඇති අති විශාල මුදලක් සහ මෙහෙයුම් වියදම් ද නොගෙවා කෙන්යාවේ මොම්බාසා වාරායේ අතහැර දමා ගොස් තිබුණු අතර මෙම නැව, නාවික අධිකාරින් විසින් අත් අඩංගුවට ගෙන තිබේ. 'ට්‍රිපල් "එස්" ෂිපිං ලිමිටඩ්' (M/S Triple "S" Shipping Ltd.) ආයතනයෙන් අයවිය යුතු සියලු මුදල් අයකර ගැනීම පිණිස ඔවුන් සමග අත්සන් කළ කුලී ගිවිසුම අනුව, බේරුම් කිරීමේ තීරක නඩු තීන්දුවකට යොමුවීම සඳහා කටයුතු ආරම්භ කොට තිබෙන අතර එහි කටයුතු ඉටු කෙරෙමින් පවතී.
අදාළ නඩු විභාගය, 2021.01.25 වන දින ශ්‍රී ලංකා බේරුම්කරණ මධ්‍යස්ථානයේ දී දෙපාර්ශවයම ඉදිරිපිට දී ආරම්භ විය. කලින් සිටි තනි තීරකවරයා අදාළ පාර්ශවයන්ට එහි දී පැවසුවේ, හෙතෙම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සභාපතිවරයා ලෙස පත් කරනු ලැබ තිබෙන බවත්, හිමිකම් ඉල්ලුම්කරු රජය සතු සමාගමක් වන හෙයින් එකී හිමිකම් ඉල්ලුම්කරුට අදාළ කාරණයක් රාජ්‍ය සේවා කොමිෂන් සභාවට යොමු කළහොත්, ඒ පිළිබඳ අසම්මතකාරී තත්වයක් ඇති වන බවත් ය. ඒ අනුව, ඉහත කී තීරකවරයා, එකී තීරකකරණයේ කටයුතුවලින් ඉල්ලා අස්වී ඉවත් විය. ඉන් ඉක්බිතිව, අප විසින් තීරකවරු දෙදෙනෙකු නම් කරන ලද අතර ඒ පිළිබඳව ලියා පදිංචි තැපැල මගින් අදාළ පාර්ශව වෙත දැනුම් දෙන ලදී. එනමුත්, 'ට්‍රිපල් "එස්" ෂිපිං ලිමිටඩ්' (M/S Triple "S" Shipping Ltd.) ආයතනයෙන් ප්‍රතිචාර කිසිවක් ඊට ලැබී නොමැත. මේ සම්බන්ධයෙන් ඉදිරි පියවර වන්නේ, ඉහත කී නිවේදනයෙහි පරිදි ඉදිරියට කටයුතු කරගෙන ගොස් තීරක නඩු විභාග පනතේ විධිවිධාන අනුව වන තීරකවරයෙකු පත් කිරීම ය. ඒ සඳහා, වාණිජ මහාධිකරණයේ ආදේශක තීරකවරයෙකු පත් කිරීමට ලංකා නැව් සංස්ථාවේ නීති අංශය විසින් කටයුතු කරනු ලැබ තිබේ. ඒ අනුව, තීරක පනතේ 7 සහ 9 යන වගන්තිවල සලසා ඇති විධිවිධාන පරිදි, පෙත්සමක් හා දිවුරුම් ප්‍රකාශයක් හරහා තීරකවරයෙකු පත් කරන ලෙස වාණිජ මහාධිකරණයට අයදුම්පතක් ඉදිරිපත් කොට තිබේ. ඒ අනුව, නව තීරකවරයෙකු පත් කිරීම සඳහා වූ අයදුම් පත සලකා බැලීම පිණිස වාණිජ මහාධිකරණය විසින් 2023 ඔක්තෝබර් මස 25 වන දින පිස්කල් වාර්තවක් කැඳවනු ලැබීමට කටයුතු කරනු ලබනවා ඇත.

2. ලංකා විදුලිබල මණ්ඩලයට අයත් පුත්තලම පිහිටි විදුලි බලාගාරය සඳහා ගල් අඟුරු මිල දී ගැනීමේ ආයතනය වන ලංකා ගල් අඟුරු සමාගමට ගල් අඟුරු සැපයීම පිණිස ඉන්දියාවේ 'ටෝරියන් අයන් ස්ටීල් කම්පැනි' (Taurian Iron Steel Co) ආයතනය සමග නැව් සංස්ථාව ගිවිසුමකට එළඹියේ ය. එහෙත්, ගල් අඟුරුවල තත්ත්වය පිළිබඳව ඇති වූ ප්‍රශ්ණයක් හේතුකොට ගෙන ඉහත කී ගිවිසුම යටතේ ගල් අඟුරු සැපයීම නතර කිරීමට සිදු විය. මෙම කරුණු සුහදශීලීව විසඳා ගැනීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුව විසින් දෙන ලද උපදේශය අනුව, අමාත්‍ය මණ්ඩලය ඒ සඳහා කමිටුවක් ලත් කරන ලදී. එම කමිටුව මගින් ඒ සම්බන්ධයෙන් වාර්තාවක් පිළියෙළ කොට ඇති අතර වැඩිදුර කටයුතු සඳහා රේඛීය අමාත්‍යාංශය වෙත එම වාර්තාව ඉදිරිපත් කොට තිබේ. අමාත්‍ය මණ්ඩලයට එකී වාර්තාව ඉදිරිපත් කිරීමට පෙරාතුව, එම වාර්තාව, රේඛීය අමාත්‍යාංශය විසින් විදුලි බල මණ්ඩලයේ හා ලංකා ගල් අඟුරු සමාගමේ සමාලෝචනය හා අදහස් දැක්වීම පිණිස ඉදිරිපත් කරනු ලැබ තිබේ. එම ආයතන, මේ වන තෙක් ඊට අදාළ සමාලෝචන හා අදහස් දැක්වීම් ඉදිරිපත් කර නොමැති අතර, ඒවා ඉදිරියේ දී ලැබීමට නියමිත ය.

3. බොරතෙල් ප්‍රවාහනය පිණිස ලංකා නැව් සංස්ථාව විසින් කුලියට ගත් නැවේ හිමිකරු හා විදේශීය නැව් හිමියා අතර ඇති වූ ආරවුලක් නිසා ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවට බොරතෙල් ප්‍රවාහනය කිරීම නතර විය. එම කරුණ නිසා, අවසානයේ දී ලංකා නැව් සංස්ථාව සහ විදේශීය නැව් හිමියා වන 'ලූනා ෂිපිං සමාගම' (Luna Shipping) සහ ලංකා ඛනිජතෙල් සංස්ථාව අතර මූල්‍ය අර්බුදයක් ඇති විය. මෙම මූල්‍ය අර්බුදය නීතිපති දෙපාර්තමේන්තුවේ අවධානය යොමු කරන ලද අතර නීතිපතිවරයාගේ මතය වූයේ, දෙපාර්ශවයම විසින් අත්සන් කර ඇති බොරතෙල් ප්‍රවාහන ගිවිසුමට අනුව අදාළ අයකර ගැනීමේ විකල්පයක් සඳහා ලන්ඩනයේ දී තීරක ක්‍රියාවලියක් ආරම්භ කළ හැකි බවයි. මේ අතරතුර, ලංකා ඛනිජතෙල් සංස්ථාව සමග ඇතිව තිබෙන මෙම ගැටලුව විසඳීම සඳහා ලංකා නැව් සංස්ථාව, ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව හා මහ භාණ්ඩාගාරය නියෝජනය වන ලෙස එහි ඉහළ නිලධාරින්ගෙන් සමන්විත කමිටුවක් පත් කෙරිණි. මෙම කරුණට අදාළ යම් යම් නෛතික ගැටලු පිළිබඳව නීතිපති දෙපාර්තමේන්තුව වෙත ලංකා නැව් සංස්ථාව සහ ඛනිජතෙල් නීතිගත සංස්ථාව ඒකාබද්ධව කරුණු සැල කිරීමක් සිදු කරන ලෙස කමිටුව දැනුම් දී ඇත. ඒ අනුව, එම කටයුතු දැන් ඉටු කෙරෙමින් පවතී. මෙම තත්ත්වය යටතේ, ලංකා ඛනිජතෙල් සංස්ථාව සමග පවතින මෙකී ගැටලුව විසඳෙන තෙක් තීරක තීන්දුවක් 'ලූනා ෂිපිං' (Luna Shipping) ආයතනයට එරෙහිව ලබා ගැනීම පසෙක තැබීමට නැව් සංස්ථාවේ අධ්‍යක්ෂක මණ්ඩලය තීරණය කොට තිබේ. තම අතුරු වාර්තාව ඉදිරිපත් කරමින් ඉහත කී කමිටුව නිර්දේශ කොට ඇත්තේ, ඒකාබද්ධ ඉල්ලීමක් හරහා ඇතැම් නෛතික කරුණු සඳහා නීතිපති දෙපාර්තමේන්තුවේ පැහැදිලි කිරීම් ලබා ගන්නා ලෙස ය. කෙටුම්පත් ලිපියට ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවේ එකඟතාවය ලැබීමට නියමිත ය. ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව වෙත ලංකා නැව් සංස්ථාවෙන් යවන ලද අවසන් ලිපියට අනුව ඉල්ලා ඇත්තේ, 2020.05.27 වන දින ලංකා නැව් සංස්ථාව විසින් ලිඛිතව ඉදිරිපත් කොට ඇති පරිදි සහතික කළ ලිපි ලේඛන ඉදිරිපත් කරන ලෙස ය. ඒ සම්බන්ධයෙන් නැව් සංස්ථාව වෙත මෙතෙක් පිළිතුරක් ලැබී නොමැති හෙයින්, 2022.11.09 වන දින වැඩිමනත් සිහි කැඳවීමක් යවනු ලැබ ඇත.

4. 2020 අප්‍රේල් මස 28 හෝ ඒ ආසන්න කාල සමයේ දී සිලෝන් බ්‍රීස් නෞකාව සහ ධීවර යාත්‍රාවක් චීන මුහුදේ දී එකිනෙක ගැටීමක් ඇති වූ බවට වාර්තා විය. මෙම කාරණය, ගැටුම් බැඳියාවන් යටතේ සලකා බලන ලද අතර, හිමිකම් ඉල්ලීමට අදාළ සම්පූර්ණ සහ අවසන් නිරවුල් කිරීම වෙනුවෙන් ඇ.එ.ජ. ඩොලර් 20,149/- ක මුදලක් අදාළ ධීවර යාත්‍රා පාර්ශවයට ගෙවීම සඳහා ගිවිසුමක් අත්සන් කරනු ලැබ ලංකා නැව් සංස්ථාව හා අදාළ ධීවර යාත්‍රා පාර්ශවය අතර ගැටලුව නිරාකරණය කර ගැනුණි. මෙහි දී, මේ සම්බන්ධයෙන් චීනයේ දී අදාළ නඩු කටයුතු කරතොත් ,ඒ සඳහා දැරීමට සිදු වන විශාල වියදම ද සැලකිල්ලට ගැනිණි. තවද, මීට සමගාමීව, අදාළ ධීවර යාත්‍රා පාර්ශවය, මෙම කාරණයට අදාළ සියලු හිමිකම් වලින් ලංකා නැව් සංස්ථාව නිදහස් කරමින් ආරක්ෂණ හා රක්ෂණ වන්දි සමාජයේ (P & I Club) වගකීම්වලින් ද මුදා හැරීම් සිදු කරන ලදි. ඊට අමතර වශයෙන්, හුවායි ඉන්ෂුවරන්ස් ඒජන්සි ඇන්ඩ් කන්සල්ටන්ට් සර්විසස් ලිමිටඩ් (Huatai Insurance Agency & Consultant Services Ltd) නමැති ආයතනයේ ෂැංහයි ශාඛාවේ රක්ෂණ නියෝජිතවරයා විසින් මෙම ගැටලුව නිරාකරණය කර ගනු පිණිස වූ ඔවුන්ගේ මැදිහත්වීම වෙනුවෙන් ඇ.එ.ජ. ඩොලර් 4,304/- ක මුදල් වියදම් පියවා ගැනීම සඳහා ඉන්වොයිස් පතක් එවා තිබුණි. එම මුදල ගෙවා අදාළ ආරවුල සමථයකට පත්කර ගැනීමට ලංකා නැව් සංස්ථාව කටයුතු කරන ලදී.

5. සිලෝන් බ්‍රීස් නෞකාව, ලියෝපෝල්ඩ් නෞකාව (MV. Leopold) සහ ස්යික්ලේඩ්ස් නෞකාව (MV. Cyclades) සමඟ ඇති කර ගත් මතභේදාත්මක සිද්ධි සිලෝන් බ්‍රීස් නෞකාව, ඉන්දියාවේ පරදීප් වරායේ සිට චීනයේ ලියැන්යුන්ගැන්ග් වරාය කරා යපස් ගුළි තොග වශයෙන් මෙට්‍රික් ටොන් 60,100 ක් වූ ප්‍රමාණයක් ප්‍රවාහනය කරමින් කුලී නැව් සේවා මුහුදු ගමනක නිරතව සිටියේ ය. නෞකා ඉන්ධන සපයා ගැනීම සඳහා 2021.06.11 වන දින නැව සිංගප්පූර් වරායේ නවතා තබා තිබුණි.

<u>පළමුවන මතභේදය - ලියෝපෝල්ඩ් නෞකාව (MV. Leopold)</u>

ලියෝපෝල්ඩ් නෞකාවට අදාළ වියදම එඩොලර් .ජ. 230,000/- ලෙස ඇස්තමේන්තු කර ඇති බව ආරක්ෂණ හා රක්ෂණ වන්දි සමාජය (P & I Club) දන්වා ඇති අතර ලංකා නැව් සංස්ථාවේ වගකීම් කොටස 85% - 90% ලෙස දන්වමින් අදාළ කාරණය සමථයකට පත් කිරීම සඳහා ඉල්ලා සිටියේ ය. ආරක්ෂණ හා රක්ෂණ වන්දි සමාජය (P & I Club), ටයිසර්ස් (TYSERS) (රක්ෂණ තැරැව්කරු) සහ ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විසින් ලංකා නැව් සංස්ථාව වෙත දැඩි ලෙස අවවාද කරන ලද්දේ, රක්ෂන වන්දි සමාජය විසින් සඳහන් කර ඇති පරිදි ගැටුමක් වළක්වා ගැනීමේ දී ලියෝපෝල්ඩ් නෞකාවට අදාළ දුර්වලතා සඳහා ද වට්ටමක් නියමිතව ඇතැයි යන කරුණ මත පිහිටා අදාළ මතභේදය විසඳා ගන්නා ලෙසයි. ටයිසර්ස් (TYSERS) (රක්ෂණ තැරැව්කරු) විසින් උපදෙස් දී ඇති පරිදි, සිංගප්පූරුවේ දින දෙකක නීතිමය වියදම, එ.ජ.ඩොලර 250,000/- පමණ වේ. වන්දි සමාජය සහ ලියෝපෝල්ඩ් නෞකාවේ පාර්ශවයන් අතර වගකීම් බෙදාගැනීමේ ප්‍රතිශතය ලංකා නැව් සංස්ථාවේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය, වන්දි සමාජ නියෝජිතයන් සහ ලියෝපෝල්ඩ් නෞකාවේ පාර්ශවයන් සමඟ සාකච්ඡා කර ඇති අතර, අවසානයේ දී, සියලු පාර්ශ්වයන් බේරුම්කරණ ගිවිසුමක් අත්සන් කිරීමෙන් පසු සම්පූර්ණ පියවීම් මුදල වන ඇ. එ.ජ. ඩොලර් 220,000 සඳහා වූ විෂය කරුණට අදාළ හිමිකම් පෑම සම්බන්ධයෙන් එකඟ වී ඇත. ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ් (ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව) දන්වා සිටියේ, ඔවුන් පහත ගණනය කිරීම් වලට අනුව, ටයිසර්ස් (IQ TYSERS) (රක්ෂණ තැරැව්කරු) වෙත පහත සඳහන් දෑ ඇතුළත් කොටස සඳහා මුදල් ප්‍රේෂණය කරන බවයි. දෙපාර්ශවයේම රක්ෂණ සමාජයන් විසින් සාකච්ඡා කරන ලද පරිදි, ලියෝපෝල්ඩ් LD සමාගම විසින් ඇ.එ.ජ. ඩොලර් 220,000/- ක් වූ මුදලට අදාළ තම මුදල් කොටස (එකඟ වූ මුදල) ගෙවා ආරවුල සමථයකට පත් කිරීමට ටයිසර්ස් IQ සමඟ එකඟ වී ඇති අතර, නිසි මුරකාවලක් IQ විසින් තැබීමට අසමත් වීමේ දුර්වලතා සඳහා අත් වන වට්ටමක් ද ඊට අයත් ය.

මුදල් පියවීම සඳහා වූ ගිවිසුම අත්සන් කළ දින සිට දින 21 ක් ඇතුළත රක්ෂණ ඔප්පු දෙකටම (Pl සහ HM) අනුව අඩු කළ හැකි වන ඇ.එ.ජ. ඩොලර් 115,000/- ක් ගෙවීමට ලංකා නැව් සංස්ථාව බැඳී සිටියේ ය. කෙසේ වෙතත්, ලංකා නැව් සංස්ථාව ඊට එරෙහිව නඩු පැවරීමට යන්නේ නම්, අදාළ මුළු පිරිවැය වන ඇ.එ.ජ. ඩොලර් 220,000/- ක් වූ මුදල (ලියෝපෝල්ඩ් නෞකා හානි හිමිකම් සහ නීතිමය ක්‍රියාමාර්ග සඳහා වන පිරිවැය) ඉක්මවා යනු ඇත.

"ආරක්ෂණ හා රක්ෂණ වන්දි සමාජය (P & I Club) විසින් යෝජනා කර ඇති පරිදි, “අදාළ මුදල් පියවීම් අර්පණයට අනුව ඉදිරි කටයුතු කිරීම” යන කරුණ, එනම්, ලියෝපෝල්ඩ් LD නෞකා සමාගම සමඟ ඇ.එ.ජ. ඩොලර් 220,000/- යන සියල්ල ඇතුලත් වියදම පියවීම", මෙම අවස්ථාවෙහි දී දෙපාර්ශවය විසින් සිංගප්පූරුවේ දී නඩු පවරා ආරවුල සම්බන්ධයෙන් කටයුතු කළහොත්, ලංකා නැව් සංස්ථාවට දැරීමට සිදුවන අනාගත අධික වියදම් සලකා බලමින්, අධ්‍යක්ෂ මණ්ඩලය, 2023.06.01 දින පැවති සිය විශේෂ මණ්ඩල රැස්වීමේ දී, ලංකා නැව් සංස්ථාවේ සහ ලියෝපෝල්ඩ් LD නෞකා සමාගමේ අභිලාෂයන් අතර මැදිහත්කරුවකු වූ ආරක්ෂණ හා රක්ෂණ වන්දි සමාජයේ යෝජනාව වන ඇ.එ.ජ. ඩොලර් 220,000/- ක් වූ බේරුම්කරණය පිළිගැනීම සඳහා අනුමැතිය ලබා දී ඇත. ඉහත බේරුම්කරණයට අදාළ පියවීම් මුදලින්, ලංකා නැව් සංස්ථාව විසින් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව වෙත ගෙවිය යුතු වන්නේ, HM සහ Pl රක්ෂණ ඔප්පුවල අඩු කළ හැකි කොටස ලෙස ගැනෙන ඇ.එ.ජ. ඩොලර් 115,000/- ක් වූ මුදල් ප්‍රමාණය ය. 2021 ජුනි මස 12 වන දින සිලෝන් බ්‍රීස් යාත්‍රාවේ රාජකාරියේ යෙදී සිටි කාර්ය මණ්ඩල සාමාජිකයින් නිසා ලංකා නැව් සංස්ථාව වෙත සිදු වූ මූල්‍ය අලාභය සැලකිල්ලට ගනිමින්, එම නෞකාවෙහි එදින සේවයේ නිරතව සිට ලියෝපෝල්ඩ් නෞකාවේ ගැටුමට වගකිව යුතු බවට හඳුනා ගෙන ඇති සියලුම කාර්ය මණ්ඩල සාමාජිකයින් වෙත අදාළ එන්තරවාසි ලිපි යවා ඇත.

HM සහ PI රක්ෂණ ඔප්පුවල අඩු කළ හැකි කොටස ලෙස ගැනෙන ඇ.එ.ජ. ඩොලර් 115,000/- ක් වූ මුදල් ප්‍රමාණය, ලංකා නැව් සංස්ථාව විසින් මේ වන විටත් ගෙවනු ලැබ ඉහත ආරවුල විසඳා ඇති අතර, මේ කාරණයට අදාළ තම පිරිවැය හිමිකම් වෙනුවෙන් වන ඉල්ලීම්, H&M රක්ෂණකරුවන් වෙත ලංකා නැව් සංස්ථාව විසින් ඉදිරිපත් කරනු ලැබ ඇත. එය, දැනට ඒ සඳහා පත් කළ තීරකවරයෙකුගේ සමාලෝචනය යටතේ පවතී.

දෙවන මතභේදය - සයික්ලේඩ් නෞකාව (Mv.Cyclade)

සිලෝන් බ්‍රීස් යාත්‍රාව, 2021 ජුනි මස 12 වන දින නැංගුරම් පොළේ නවතා තිබූ අතර, අපගේ යාත්‍රාව, පිටත වරාය ප්‍රදේශයේ නවතා තිබූ තවත් යාත්‍රාවක් වන, සයික්ලේඩ් නෞකාව (Mv.Cyclade) දෙසට ඇදී ගොස් ගැටී, එම **සයික්ලේඩ්** (Mv.Cyclade) **නෞකාවට** මෙන්ම අපගේ සිලෝන් බ්‍රීස් **නෞකාවට** ද හානි සිදු වී තිබේ. මෙම ගැටුමට විෂය වීම හේතුවෙන්, ලංකා නැව් සංස්ථාව විසින් දරන ලද හානියේ පිරිවැය, ඊට අදාළ වලංගු සාක්ෂි ලේඛන සමඟ පිරිවැය සත්‍යාපනය කිරීමට යටත්ව, ආසන්න වශයෙන් ඇ.එ.ජ. ඩොලර් 1,065,130.65 ක් පමණ වේ. සයික්ලේඩ් නෞකාවෙහි ඇස්තමේන්තුගත පිරිවැය හිමිකම් පෑම, අදාළ හානි අලුත්වැඩියාව සම්පූර්ණ කිරීමෙන් අනතුරුව, ඇ.එ.ජ. ඩොලර් මිලියන 1.98 ක් පමණ වුව ද, ඔවුන් සයික්ලේඩ් නෞකාවෙහි සත්‍ය වියදම් හිමිකම් පෑම, ඇ.එ.ජ. ඩොලර් 285,037.59 (පොලී සහ පිරිවැය සහිතව) ලෙස ඉදිරිපත් කර ඇති අතර එය වලංගු ලියකියවිලි මගින් ඔප්පු කිරීමට යටත් වේ. මෙම කාරණය, ගැටීමේ වගකීම් යටතේ සලකා බැලූ අතර එහි දී, H&M රක්ෂණ ආවරණය බලාත්මක කිරීමට සිදු වූයේ, අපගේ නෞකාවට සිදුව ඇති ඇස්තමේන්තුගත හානිය, අදාළ අඩු කළ හැකි මට්ටම වන ඇ.එ.ජ. ඩොලර් 100,000/- ක් වූ ප්‍රමාණයට වඩා වැඩි නිසා ය. ලංකා නැව් සංස්ථාවේ එකඟත්වය ඇතිව, P&I සමාජය විසින් නීති උපදේශක සොලිසිටර්වරුන් පත් කර ඇති අතර, දෙපාර්ශවය අතර ඇප සහතික හුවමාරු කර ගැනීම සඳහා, මෙම කාරණය, දැනට සාකච්ඡා වෙමින් පවතී. ලංකා නැව් සංස්ථාව, සයික්ලේඩ් පාර්ශවය වෙතින් සැබෑ පිරිවැය ඉල්ලා ලිපි යවා ඇත. ඒ අනුව, සීමාසහිත CJC සමාගම (Campbell Johnston Clark Limited), සයික්ලේඩ් නෞකාවේ අභිලාෂයන් වෙනුවෙන් පත් කරනු ලැබ පෙනී සිටින Wikborg Rein LLP නමැති සමාගම හරහා කරුණු ඉදිරිපත් කරමින්, අදාළ වගකීම් බැඳියාව පිළිගන්නා ලෙසටත්, අදාළ හිමිකම් සම්බන්ධයෙන් කටයුතු කිරීමට කාලය දීර්ඝයක් ලබා දෙන ලෙසටත් ලංකා නැව් සංස්ථාව වෙතින් ඉල්ලා ඇත. ඒ අනුව, සයික්ලේඩ් නෞකා පාර්ශවයේ හිමිකම් පෑම වනුයේ, (පොලී සහ වියදම් එකතුව) ඇ.එ.ජ. ඩොලර් 285,037.59 කි. වේ. තමන් විසින් දැනට සයික්ලේඩ් නෞකාවෙහි හිමිකම් සමාලෝචනය කරමින් සිටින බැවින් තම සාක්ෂි සමාලෝචනය අවසන් කළ පසු, අදාළ හිමිකම් පෑම, ඇ.එ.ජ. ඩොලර් 285,037.59 ට වඩා අඩු වන්නේ නම්, ඒ පිළිබඳව දන්වා එවන බව සීමාසහිත CJC සමාගම (Campbell Johnston Clark Limited) දැනුම් දී ඇත. සයික්ලේඩ් නෞකාවෙහි හිමිකම් පෑම, 2023 ජුනි මස 12 වැනි දින කල් ඉකුත් වීමට නියමිතව තිබූ බැවින්, ආරක්ෂණ හා රක්ෂණ වන්දි සමාජය (P & I Club) විසින් උපදෙස් දෙන ලද පරිදි, මෙම නැව් ගැටුමේ කුසලතා ලංකා නැව් සංස්ථාව සඳහා සම්පූර්ණයෙන්ම අවාසිදායක බව පෙනෙන බැවින්, ඒ සම්බන්ධයෙන් ලංකා නැව් සංස්ථාව සමඟ සාකච්ඡා කිරීමට පැමිණෙන ලෙස ඉල්ලා සයික්ලේඩ් නෞකා පාර්ශවය සඳහා කාලය දීර්ඝ කිරීම සඳහා ලංකා නැව් සංස්ථාව විසින් ඉඩ ලබා දී ඇත. 2021 ජුනි මස 12 වන දින සිලෝන් බ්‍රීස් යාත්‍රාවේ රාජකාරියේ යෙදී සිටි කාර්ය මණ්ඩල සාමාජිකයින් නිසා ලංකා නැව් සංස්ථාව වෙත සිදු වූ මූල්‍ය අලාභය සැලකිල්ලට ගනිමින්, එම නෞකාවෙහි එදින සේවයේ නිරතව සිට සයික්ලේඩ් නෞකාවේ ගැටුමට වගකිව යුතු බවට හඳුනා ගෙන ඇති සියලුම කාර්ය මණ්ඩල සාමාජිකයින් වෙත අදාළ එන්තරවාසි ලිපි යවා ඇත.

6. **මියගිය කැඩෙට් නිලධාරියා - ලංකා ප්‍රින්සස් නෞකාව**

ලංකා ප්‍රින්සස් නෞකාව, 2022.11.27 වන දින අයිවරි කෝස්ට් හි අබිජාන් වරායේ සිට බ්‍රසීලයේ පැරනාගුවා වරාය වෙත යාත්‍රා කරන ලදී. එම මුහුදු ගමනේ දී, ලංකා ප්‍රින්සස් නෞකාවෙහි එන්ජින් කාමර කැඩෙට් නිලධාරියෙකු ලෙස, 2022.09.01 දිනැති නාවිකයන්ගේ රැකියා ගිවිසුම (SEA) අනුව සේවයේ නිරතව සිටි, ඩබ්ලිව්.එම්.එස්.කේ.පී.කුමාර මහතා, 2022.12.02 වන දින අසනීපයට පත් වී මිය ගියේ ය.

මියගිය කැඩෙට් නිලධාරියාට ඇ.එ.ජ. ඩොලර් 10,000.00 ක මරණ වන්දි ගෙවීමක් ආරක්ෂණ හා රක්ෂණ වන්දි සමාජය (P & I Club) විසින් නිර්දේශ කර ඇති අතර එය ඔහුගේ නීත්‍යානුකූල උරුමක්කාරයන් විසින් පිළිගැනීමට එකඟ වී ඇත.

P& I සමාජය, අන්‍යෝන්‍යාධාර දුම් නැව් සම්මුති (Steamship Mutual) රීතිවලට අනුකූලව ගෙවිය යුතු වැටුප් පදනම මත, එම වන්දි ප්‍රතිපූරණය කරනු ඇත. ඒ අනුව, මියගිය කැඩෙට් නිලධාරියාගේ නම් කරන ලද නීත්‍යානුකූල උරුමක්කාරයාට එකී මුදල ගෙවීමට සහ එම මුදල, ආරක්ෂණ හා රක්ෂණ වන්දි සමාජයෙන් (P & I Club) ප්‍රතිපූරණය කර ගැනීමට අවශ්‍ය නීතිමය ලියකියවිලි සැකසීමට ලංකා නැව් සංස්ථාව කටයුතු කරමින් සිටී.

7. සීමාසහිත ලංකා නැව් සංස්ථාව, M.I. ඉන්ටර්නැෂනල් (ප්‍රයිවේට්) ලිමිටඩ් ආයතනයටත්, තවත් දෙදෙනෙකුටත් එරෙහිව කොළඹ දිසා අධිකරණය හමුවේ, නඩු අංක DMR 2493/22 යටතේ පවරන ලද නඩුව අංක WP KY -7714 දරන වාහනය සීමාසහිත ලංකා නැව් සංස්ථාවට අයත් වාහනයක් වන අතර, එය අනතුරට ලක්ව ඇත්තේ, මොහොමඩ් ඉම්රාන් මොහොමඩ් ඉන්ෆාස් මහතාට (ලිපිනය: අංක 05, 1 වන වැපල් වීදිය, කොළඹ 06.) අයත් අංක WP CAY 7862 දරන වාහනය සමඟ ය. එම අනතුර සිදුව ඇත්තේ, කුරුඳුවත්ත පොලිස් බල ප්‍රදේශයේ රාජකීය මාවතේ දී 2020 සැප්තැම්බර් මස 18 වන සිකුරාදා පෙ.ව.19.05 ට පමණ ය.

එම හානියට පත් වාහන අංක WP KY 7714 අලුත්වැඩියා කිරීම සඳහා ලංකා නැව් සංස්ථාව, යුනයිටඩ් මෝටර්ස් ලංකා පීඑල්සී වෙතින් ඇස්තමේන්තුවක් ලබා ගත් අතර, ඒ අනුව, එම හානියට පත් වාහනය අලුත්වැඩියා කිරීමට වැය වූ මුළු මුදල රු. 1,000,012.06 ක් වූයේ ය. ඉන් අනතුරුව, අංක WP CAV 7862 දරන වාහනයේ හිමිකරු වන මොහොමඩ් ඉම්රාන් මොහොමඩ් ඉන්ෆාස් මහතා වෙතින් ලංකා නැව් සංස්ථාවේ වාහනයට සිදු වූ හානියේ අලාභය ඔහුගෙන් අය කර ගැනීම සඳහා ඔහුට එරෙහිව නීතිමය පියවර ගැනීම සඳහා ලංකා නැව් සංස්ථාව නීතිපති දෙපාර්තමේන්තුවෙන් නීති උපදෙස් ලබා ගත්තේ ය.

ඒ අනුව, නීතිපති දෙපාර්තමේන්තුවේ උපදේශය පරිදි, සීමාසහිත සීමාසහිත ලංකා නැව් සංස්ථාව විසින්, M.I. ඉන්ටර්නැෂනල් (ප්‍රයිවේට්) ලිමිටඩ් ආයතනයටත්, අමානා තකාෆුල් පීඑල්සී සමාගමෙහි රක්ෂණ ඔප්පු අංක HOVPTDP00360/20 යටතේ රක්ෂණය කරන ලද අංක CAV 7862 දරන වාහනයේ හිමිකරුටත්, අදාළ අනතුර සිදු කළ වාහනයේ රියදුරු, මොහොමඩ් ඉම්රාන් මොහොමඩ් ඉන්ෆාස් මහතාටත් එරෙහිව සීමාසහිත ලංකා නැව් සංස්ථාවට අයත් අංක KY 7714 දරන වාහනයට සිදු වූ අලාභය සම්බන්ධයෙන් ගෙවිය යුතු රුපියල් 1,000,012.06 ක මුදලක් අයකර ගැනීම සඳහා කොළඹ දිසා අධිකරණය හමුවේ, නඩු අංක DMR 2493/22 යටතේ නඩු පවරන ලදි.

ඉහත සඳහන් නඩුව, එය කැඳවීමේ පළමු දිනය වන 2022.11.18 වැනි දින, කොළඹ අංක 08 දිසා අධිකරණයේ දී විභාගයට ගැනිණි. 2022.11.18 වන නිකුත් කරන ලද සිතාසි නැවත ලබා දීම සඳහා එකී විෂය නඩුව 2023.09.01 වන දින කැඳවීමට අධිකරණය තීරණය කළේ ය.

35 සම්බන්ධිත පාර්ශව හෙළිදරව් කිරීම්

සමාගමේ සම්බන්ධිත පාර්ශව යන්නට, ශ්‍රී ලංකා රජය, රජය සතු සමාගම්, සෙසු ආශ්‍රිත ආයතන හා ප්‍රධාන කළමනාකරණ නිලධාරින් ඇතුලත් වන්නේ ය.

35.1 ප්‍රධාන කළමනාකරණ නිලධාරි පිරිස් සමග ගනුදෙනු

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති - LKAS 24 ප්‍රකාරව, "සම්බන්ධිත පාර්ශව පිළිබඳ හෙළිදරව් කිරීම්" යටතේ දැක්වෙන ප්‍රධාන කළමනාකරණ පිරිස් යනු, සෘජුව හෝ වක්‍රව ආයතනයේ ක්‍රම සම්පාදනය, මෙහෙයවීම හා පාලනය කිරීම විෂයයෙහි බලය හා වගකීම පැවරී ඇති කණ්ඩායම් ය. ඒ අනුව, අධ්‍යක්ෂ මණ්ඩලය, සාමාන්‍යාධිකාරි හා මෙහෙයුම් කළමනාකරුවන් සමාගමට අයත් ප්‍රධාන කළමනාකරණ පිරිස් ලෙස වර්ග කරනු ලැබ තිබේ.

ප්‍රධාන කළමනාකරණ නිලධාරි පිරිස් සමග ගනුදෙනු	2023	2022
	රු.	**රු.**
පඩිනඩි හා අනෙකුත් කෙටි කාලීන සේවක ප්‍රතිලාභ	37,120,418	32,898,309
හිඟහිට ඇති ශේෂය - ණය හා අත්තිකාරම්	5,345,916	4,038,672
හිඟහිට ඇති ශේෂය - පශ්චාත් සේවා නියුක්ති ප්‍රතිලාභ	11,239,068	10,546,800

35.2 ආශ්‍රිත පාර්ශව සමග ගනුදෙනු

ආශ්‍රිත පාර්ශ්ව සමග සමාගම විසින් සිදු කළ සැලකිය යුතු ගනුදෙනුවල විස්තර පහත දැක්වේ :

ශ්‍රී ලංකා රජය, රජය සතු ව්‍යවසාය සහ රජයට සම්බන්ධ අනෙකුත් ආයතන සමග ගනුදෙනු

ශ්‍රී ලංකා රජය සමාගමේ එකම ප්‍රාග්ධන හිමියා වන අතර, එහෙයින්, සමාගමේ මෙහෙයුම් කටයුතු පාලනය කිරීම් අයිතිය රජය සතු වේ. ඒ අනුව, ලංකා නැව් සංස්ථාව, ශ්‍රී ලංකා රජය විසින් පාලනය කරනු ලබන හෝ ශ්‍රී ලංකා රජය විසින් ඒකාබද්ධව පාලනය කරනු ලබන ආයතනවල (රජය හා ආශ්‍රිත ආයතන) බලපෑමෙන් එහි කටයුතු පාලනය කරනු ලබන ආශ්‍රිත පාර්ශව සමාගමක් ලෙස සලකනු ලැබ ඇත.

සම්බන්ධිත පාර්ශව	ගණුදෙනුවල ස්වභාවය	**01/04/2022** දිනට (නියමිත} / ලැබිය යුතු ශේෂය	ගනුදෙනුවේ වටිනාකම	**31/03/2023** දිනට (නියමිත} / ලැබිය යුතු / ශේෂය
		රු.		රු.
ශ්‍රී ලංකා රජය	නැව් කුලී ගාස්තු, නැව් කුලියට දීමේ ගාස්තු, බහාලුම් කුලියට දීම, නිෂ්කාශනය හා නැව් බඩු බෙදා හැරීම සහ වෙනත් ගාස්තු	378,208,191	398,654,813	
	නිරවුල් කිරීම		(625,256,772.43)	**151,606,232**
රජය සතු ව්‍යවසාය	නැව් කුලී ගාස්තු, නිෂ්කාශනය හා නැව් බඩු බෙදා හැරීම සහ වෙනත් ගාස්තු	119,902,944	213,850,065	
	නිරවුල් කිරීම		(223,307,961)	I **10,445,048**
ලංකා ගල් අඟුරු සමාගම	නැව් කුලී ගාස්තු, සැහැල්ලු යාත්‍රා ගාස්තු සහ නෞකා ඉන්ධන මිල ඉහළ යාම ගාස්තු	1,281,722,990	I56,053,321.030	
	නිරවුල් කිරීම		(140,301,904.07)	**1,297,474,407**
වෙනත් රජයට සම්බන්ධ ආයතන	නැව් බඩු බෙදා හැරීම සහ වෙනත් ගාස්තු	2,432,428	1,598,040	
	නිරවුල් කිරීම		**(1,996,198.24)**	**2,034,269**

36 වාර්තා කිරීමේ දිනට පසුව උද්ගත වූ සිදුවීම්

මූල්‍ය ප්‍රකාශ දිනයේ සිට යම් ගැළපුම් හෝ හෙළිදරව් කිරීම් සිදු කිරීම අවශ්‍ය වන වැදගත් සිදුවීම් කිසිවක් උද්ගතව නොමැත.

37 ප්‍රාග්ධන බැඳියා

2014 පෙබරවාරි මස 18 වන දින චීනයේ සී/ස Avic International Beiging සමාගමෙන් එ.ජ. ඩොලර් මිලියන 70 ක වටිනාකමකින් යුතු පුහුණු පහසුකම් සහිත නව 63600 DVST Ultramax Bulkers යාත්‍රා දෙකක්, නැව් සංස්ථාව විසින් මිල දී ගන්නට යෙදුණි. 2013 දෙසැම්බර් මස 23 වන දින අමාත්‍ය මණ්ඩලය විසින් ඒවා මිලදී ගැනීම සඳහා අසම්ප්‍රයාචනිත යෝජනාවක් යටතේ අනුමැතිය ලබා දී තිබුණි.

ගැනුම්කරු ණය කොන්දේසි යටතේ (Buyer Credit Terms) සමාගම විසින් සැපයුම්කරු සමඟ අදාළ ගිවිසුමට එළඹ තිබූ අතර, එබැවින් සමාගමට අවශ්‍ය අරමුදල් සපයා ගැනීම සඳහා මහජන බැංකුවෙන් මාස 06ක කාලයක් සඳහා වන LIBOR + 5.25% වාර්ෂික පොලී අනුපාතයක් යටතේ එ.ජ.ඩොලර් මිලියන 70 ක ණය පහසුකමක් ලබා ගත් අතර ඊට අදාළ පොලිය ගෙවනු පිණිස මහජන බැංකුව විසින් එ.ජ.ඩොලර් මිලියන 10 ක ණයක් මාස 06 ක කාලයක් සඳහා LIBOR + වසරකට 3% පොලී අනුපාතය යටතේ සමාගමට දෙන ලදුව එයින් සමාගම විසින් ප්‍රයෝජනයට යොදා ගන්නා ලද්දේ එ.ජ. ඩොලර් මිලියන 5.5 ක් පමණි.

මූල්‍ය තත්වය පිළිබඳ වාර්තාවේ දිනට බැංකුවට ගෙවිය යුතු මුදල එ.ජ. ඩොලර් 56,223,842.97 ක් විය.

38 මූල්‍ය අවදානම කළමනාකරණය කිරීම

මූල්‍ය සාධන පත් භාවිතා කිරීමේ දී සමාගමට පහත දැක්වෙන මූල්‍ය අවදානම්වලට මුහුණ දීමට සිදු වූ අතර, මෙකී අවදානම් සමනය කර ගැනීම පිණිස සමාගම විසින් කලින් කල විවිධ අවදානම කළමනාකරණ ක්‍රමෝපාය භාවිතා කරන ලදී.

38.1 ණය අවදානම
38.2 ද්‍රවශීලතා අවදානම
38.3 වෙළඳපළ අවදානම (ව්‍යවහාර මුදල් අවදානම හා පොලී අනුපාත අවදානම)
38.4 ප්‍රාග්ධන කළමනාකරණය

සමාගමේ මූල්‍ය සාධන පත් ලැයිස්තුගත සහ ලැයිස්තුගත නොවූ කොටස් ආයෝජන වලින් ද, කාලීන තැන්පතුවල හා භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජන කිරීම් වලින් ද, මුදල් හා මුදල් සාම්‍යයන්ගෙන් ද සමන්විත වේ. තම ප්‍රධාන ව්‍යාපාරක කටයුතු වලින් සමාගමට වෙළඳ ලැබීම් නියමිත හා ගෙවීම් නියමිත ද තිබේ. කෙටි කාලීන තැන්පතුවල ආයෝජනය කිරීමේ පරමාර්ථය වූ කලී, මෙහෙයුම් කටයුතු වෙනුවෙන් ද්‍රවශීලිතාවක් පවත්වා ගැනීම ය. ලැයිස්තුගත හා ලැයිස්තුගත නොවූ කොටස්වල ආයෝජන කිරීම් ක්‍රමෝපායීය ආයෝජනයන් වේ.

38.1 ණය අවදානම

ණය අවදානම වූ කලී, පාර්ශවකු විසින් ගිවිසුමකට අදාළ බැඳියාවන් ඉටු කිරීමට අපොහොසත් වන අවස්ථා වල දී, සමාගමට දැරීමට සිදුවන මූල්‍ය පාඩු ය. ණය අවදානම් උද්ගත වන්නේ, ප්‍රධාන වශයෙන්ම බැංකුවල ඇති තැන්පතු මුදල් හා මුදල් සාම්‍යයන් වලින් (අත ඇති මුදල් හැර) සහ ගණුදෙනුකරුවන් වෙතින් වූ ලැබීම් නියමිත වලිනි. ණය අවදානමට යටත් මූල්‍ය වත්කම් උපරිම ණය අවදානම්වලට නිරාවරණය වීම, ඒවායේ ඉදිරියට ගෙනයන ධාරක වටිනාකම්වලට සමාන වේ.

මාර්තු මස 31 වන දිනට වාර්තා කරන ලද මූල්‍ය සාධන පත් උපරිම අවදානම් විෂයයෙහි නිරාවරණය වීම පහත වගුවෙන් ගෙන හැර දැක්වේ :

	සටහන	2023 රු.	2022 රු.
මුදල් හා මුදල් සාම්‍යයන්	**38.1.1**	1,296,402,265	727,755,386
බැංකුවෙහි ඇති කාලීන තැන්පතු		26,268,205	25,533,587
වෙළඳ ලැබීම් නියමිත	**38.1.2**	2,070,761,878	2,460,530,760
වෙනත් ලැබීම් නියමිත		127,792,745	184,253,346
		3,521,225,092	3,398,073,078

38.1.1 **මුදල් හා මුදල් සාම්‍යයන්**

මුදල් හා මුදල් සාම්‍යයන්හි ඇතුලත් වන්නේ, බැංකුවේ ඇති මුදල් (අතැති මුදල් හැර) ඉල්ලුම් තැන්පතු සහ මාස තුනකට හෝ ඊට අඩු මුලික කල්පිරිම් සහිත කෙටි කාලීන අධි **ද්‍රවශීලතා**වයෙන් යුතු පහත දැක්වෙන ආයෝජනයන් ය.

	සටහන	2023 රු.	2022 රු.
බැංකුවෙහි ඇති මුදල්		1,296,402,265	727,755,386
	38.1	1,296,402,265	727,755,386

38.1.2 වෙළඳ ලැබීම් නියමිත

සමාගම, ප්‍රධාන වශයෙන් නාවික නියෝජිතයන් සහ රාජ්‍ය ආයතන සමග කටයුතු කරයි. සමාගමේ කළමනාකාරිත්වය අතීත අත්දැකීම් පදනම් කරගෙන නාවික එජන්තවරුන්ගේ ණය තත්ත්වය තක්සේරු කරයි. මීට අමතරව, කළමනාකරණ කමිටුව සහ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ගෙවීමට ඇති ශේෂයන් අඛණ්ඩව සිදු වන පදනමක් යටතේ අධීක්ෂණය කරයි.

සමාගමේ වෙළඳ ලැබීම් නියමිත සම්බන්ධයෙන් කාල විශ්ලේෂණය පහත දැක්වේ :

	සටහන	2023 රු.	2022 රු.
වෙළඳ ලැබීම් නියමිතවල කාල සීමා			
එක් අවුරුද්දක් දක්වා		779,186,765	1,259,424,908
අවුරුදු 1 – 4 දක්වා		257,530,960	228,907,326
අවුරුදු 4 ට වැඩි		**1,03**4,044,153	972,198,525
	38.1	2,070,761,878	2,460,530,760

වෙළඳ ලැබීම් නියමිත සම්බන්ධයෙන් දරන ලද පාඩු පිළිබඳ ඇස්තමේන්තුවක් මගින් දැක්වෙන දුබලතා (මූල්‍ය සටහන් සම්බන්ධයෙන් වන 3.9.1 වන සටහන බලන්න). සඳහා ප්‍රතිපාදන සැලසීම පිණිස සමාගම ප්‍රතිපත්තියක් ස්ථාපනය කරයි. ස්ථාපනය කරන ලද දුබලතා ප්‍රතිපත්ති අනුව හානිකරණ පාඩු මැන ගැනීම සඳහා සේවා දායකයන් වෙන් වශයෙන් සමාලෝචනය කරනු ලැබේ. මේ පිළිබඳව වෙළඳ ලැබීම් නියමිත හා දුබලතා සඳහා වූ ප්‍රතිපාදන සම්බන්ධයෙන් වන මූල්‍ය සටහන් 18.1 කරුණාකර බලන්න.

38.1.3 වෙනත් මූල්‍ය වත්කම්

සමාගමේ සෙසු මූල්‍ය වත්කම් වලින් උද්ගතවන ණය අවදානම්වලට අයත් වන්නේ, අදාළ බැංකු වෙත ඇති තැන්පතු ය. ණය අවදානමක් සමාගමට ඇතිවන එකී මූල්‍ය සාධන පත්‍රවල ඉදිරියට ගෙන යන වටිනාකමට සමානවන මෙකී මූල්‍ය මෙවලමවලින් ඇති විය හැකි ණය අවදානම සමාගම විසින් කළමනාකරණය කර ගනු ලබන්නේ, රජය සතු බැංකු හා පිළිගත් ණය ශ්‍රේණිගත බැංකු වෙත තම අරමුදල්තැන්පත්කිරීමෙනි.

38.2 ද්‍රවශීලතා අවදානම

ද්‍රවශීලී අවදානම යනුවෙන් හඳුන්වන්නේ, තම මූල්‍ය බැඳියා නියමිත කාලයට ඉටු කිරීමට සමාගම අපොහොසත් වීමයි. ද්‍රවශීලතාව කළමනාකරණය කිරීම සඳහා සමාගමේ ප්‍රවේශය වූ කලී, සාමාන්‍ය සහ අනපේක්ෂිත තත්ත්වයන් යටතේ පිළිගත නොහැකි පාඩු නොදරමින් නියමිත වේලාවට බැඳියාවන් ඉටු කිරීම පිණිස, හැකිතාක් දුරට නිරතුරුවම, ප්‍රමාණවත් මුදල් තිබෙන බව සහතික කිරීම ය.

සමාගම විසින් මූල්‍ය වත්කම් හා බැඳියාවන් අන්වේෂණය කරනු ලබන අතර මාසික පදනමක් මත පුරෝකථනය කළ මෙහෙයුම් මුදල් ප්‍රවාහ පිළියෙළ කරයි. අංශමය කාර්ය සාධනය අන්වේෂණය කිරීම සඳහා වාර්ෂික අයවැය එක් එක් අංශ තුළ දී පිළියෙළ කෙරේ. මෙහෙයුම් කටයුතු ඉටු කිරීමේ දී සමාගම සතුව ප්‍රමාණවත් මුදල් තිබෙන බව සහතික කිරීම පිණිස, මාසිකව පුරෝකථනය කළ මෙහෙයුම් මුදල් ප්‍රවාහ මෙන්ම වාර්ෂික අයවැය සහ ද්‍රවශීලතා අවශ්‍යතා ද කළමනාකාරිත්වය විසින් සුපරීක්ෂාවට හසු කෙරේ.

වාර්තා කිරීමේ අවසාන දිනයට ඉතිරිව ඇති කාල පරිච්ඡේදය පදනම් කර ගෙන 2023 මාර්තු මස 31 වන දිනට සමාගමේ මූල්‍ය වත්කම් හා බැඳියාවන්හි කල්පිරීම් විග්‍රහයන් පහත දක්වා ඇත. එහි හෙළිදරව් කරනු ලැබ ඇති මුදල් ප්‍රමාණයන් ගිවිසුම්වලට අදාළ වට්ටම් නොකළ මුදල් ප්‍රවාහයන් ය.

මූල්‍ය වත්කම් හා බැඳියා	ඉදිරියට ගෙනයන වටිනාකම රු.	මාස 6 හෝ ඊට අඩු රු.	මාස 6 – 12 රු.	වසරකට වැඩි රු.
මූල්‍ය වත්කම්				
AFS මූල්‍ය වත්කම්	47,693,210			47,693,210
කල් පිරීමට ඇති ආයෝජන	464,999,999	464,999,999		
කෙටි කාලීන ආයෝජන	26,268,205		2,009,601	24,258,604
වෙළඳ ලැබීම් නියමිත	2,070,761,878		779,186,765	1,291,575,113
වෙනත් ලැබීම් නියමිත	127,792,745		127,792,745	
මුදල් හා මුදල් සමාන දෑ	1,296,402,265	1,296,402,265		
	4,033,918,301	1,761,402,264	908,989,111	1,363,526,927
මූල්‍ය බැරකම්				
වෙළඳ ගෙවීම් නියමිත	681,119,958	681,119,958		
වෙනත් ගෙවීම් නියමිත	1,111,647,094	1,111,647,094		
	1,792,767,053	1,792,767,052		

38.3 වෙළඳපළ අවදානම (ව්‍යවහාර මුදල් අවදානම හා පොලී අනුපාත අවදානම)

වෙළඳපළ අවදානම යනු, සමාගමේ ආදායම් හෝ මූල්‍ය සාධන පත්වල ඉදිරියට ගෙන යනු ලබන ධාරක වටිනාකමට බලපෑම් ඇතිවිය හැකි විදේශ විනිමය අනුපාතික හා පොලී අනුපාතික වැනි වෙළෙඳපළ මිල ගණන්හි ඇති වන වෙනස්වීම් ය.

38.3.1 ව්‍යවහාර මුදල් අවදානම

එ.ජ ඩොලරයට සාපේක්ෂව, ශ්‍රී ලංකා රුපියල එ.ජ. ඩොලරයේ හා අනෙකුත් විදේශ ව්‍යවහාර මුදල්වල වටිනාකමට අනුව අගය උච්චාවචනය වීමෙන් උද්ගත විය හැකි අවදානම මෙනමින් දැක්වේ. එ.ජ. ඩොලරයට අනුව හා වෙනත් ව්‍යවහාර මුදල් අනුව, සමාගම විසින් සපයන ලද සේවාවන්හි කාර්යීය ව්‍යවහාර මුදල් සහ ඇතැම් වෙළඳ ලැබීම් නියමිත හා ගෙවීම් නියමිත විදේශ ව්‍යවහාර මුදල් අනුව දක්වා ඇත

වාර්තා කිරීමේ කාල සීමාව වන 2022 / 2023 වර්ෂය සඳහා සමාගම විසින් වාර්තා කොට ඇති හා මෙහෙයුම් ප්‍රතිඵල තුළ දක්වා ඇති ශුද්ධ විදේශ විනිමය පාඩුව, රු.2,390,657,465 ක් වේ.

38.3.2 පොලී අනුපාත අවදානම

සමාගම විසින් මුහුණදෙනු ලබන පොලී අවදානම වූ කලී, කෙටි කාලීන තැන්පතු, භාණ්ඩාගාර බිල්පත් හා කාලීන තැන්පතු සම්බන්ධයෙන් වෙළඳපළ පොලී අනුප්‍රමාණ වෙනස්වීම් තුලින් උද්ගතවන අවදානමයි.

රාජ්‍ය බැංකු හා ණය ශ්‍රේණිගත බැංකුවල පවතින කාලීන තැන්පතු ඇතුළු බැංකු ශේෂ සමාගම සතුව ඇත. පොලී අනුපාතිකවල සංචලනය සක්‍රිය ලෙස අන්වේෂණය කිරීම මගින් සමාගම පොලී අනුපාතිකය කළමනාකරණය කරයි.

38.4 ප්‍රාග්ධන කළමනාකරණය

තම කොටස් හිමිකරුවන්ට උපරිම ප්‍රතිලාභ සැලසීම සඳහා ද, ප්‍රධාන පිරිවැය අඩු කිරීම වෙනුවෙන් උපරිම ප්‍රාග්ධන ව්‍යුහයක් පවත්වා ගැනීම පවත්වා ගැනීම සඳහා ද ක්‍රියාත්මක ආයතනයක් වශයෙන් තවදුරටත් සමාගම පවත්වා ගැනීමේ හැකියාවට උරදෙමින් සමාගම විසින් ස්වකීය ප්‍රාග්ධනය කළමනාකරණය කරනු ලබයි. තෝලන අනුපාතය අනුව තම ප්‍රාග්ධන ව්‍යුහය සමාගම විසින් අන්වේෂණය කරයි. මුළු කොටස් ස්කන්ධය අනුව සමස්ත ණයට ගැනුම් වශයෙන් තෝලන අනුපාතය ගණනය කරනු ලැබේ. මුළු ණයට ගැනුම්වලට ඇතුලත් වන්නේ, ජංගම නොවන හා ජංගම ණයට ගැනුම් වන අතර ඒවා මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි දක්වා ඇත. 2023 මාර්තු මස 31 වන දිනට සමාගමේ මුළු ණයට ගැනුම් හා කොටස් ස්කන්ධය අනුපාතය පහත දැක්වෙන වගුවේ සඳහන් කොට ඇත.

	2022/23	2021/22
	රු.	රු.
ප්‍රාග්ධන පංතිය		
මුළු ණයට ගැනුම්	17,974,125,965	17,689,926,338
මුළු කොටස් ස්කන්ධය	(9,210,094,328)	(7,914,226,189)
තෝලන අනුපාතය (x)	-195%	-224%

39 **නැව් භාණ්ඩ රක්ෂණ පිරිවැය** අන්තර් ග්‍රහණය කර ගැනීම

2019.06.17 දිනැතිව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද අංක 17/1791/129/023 දරන අමාත්‍ය මණ්ඩල සංදේශය හා 19.07.29 දිනැතිව ලංකා නැව් සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ගනු ලැබූ තීරණය අනුව, ලංකා ගල් අඟුරු සමාගමට අදාළ නැව් භාණ්ඩ රක්ෂණ පිරිවැය, ලංකා නැව් සංස්ථාවට විසින් අන්තර් ග්‍රහණය කර ගන්නා ලෙස උපදෙස් ලබා දී තිබේ. එහි විස්තර පහත දක්වා ඇත.

මූල්‍ය වර්ෂය	මුදල (රු.)
2015/16	12,512,559.00
2016/17	21,447,333.00
2017/18	21,502,890.00
2018/19	22,571,307.28

රක්ෂකයන් විසින් නිකුත් කරන ලද මුල් ලේඛන, එනම්, අගය එකතු කළ වැට් බදු ඉන්වොයිස් හා ලදුපත් ආදිය මුදල් ප්‍රතිපූරණය සඳහා ඉදිරිපත් කිරීම අවශ්‍ය වන්නේ ය. ඒ අනුව, රු. 22,571,307.28 මුදල් ප්‍රමාණයක් 2019.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ගිණුම්වලට මේ වන විටත් අයගත කරනු ලැබ තිබේ. තවද, 2019/20 සහ 2020/21 මූල්‍ය වර්ෂ වෙනුවෙන් රඳවා ගත් ඉපැයීම් සඳහා රු. 54,190,609.70 ක මුදල් ප්‍රමාණයක් ගැළපුම් කොට තිබේ. අවශ්‍ය ලිපිලේඛන ලබා ගැනීමට නොමැති හෙයින්, නැව් භාණ්ඩ රක්ෂණයට අදාළ රු. 1,271,172.30 ක මුදලක ප්‍රතිපූරණය ගිණුම්ගත නොවී පවතී.

40 **පරිපාලන වියදම්**

විස්තරය	**2023**	**2022**
කාර්ය මණ්ඩල පුහුණුව	213,250	175,433
කාර්ය මණ්ඩල බඳවා ගැනීම්	-	57,000
වැ. අ. වි. වැ. අරමුදලට දායකත්වය 25%	119,631	-
අර්ථසාධක අරමුදලට දායකත්වය	12,731,543	12,614,362
විධායක නිලධාරි මණ්ඩල වැටුප්	68,093,388	63,952,391
ලිපිකරු හා ආශ්‍රිත සේවා වැටුප්	44,476, 187	48,401,842
තාවකාලික හා අනියම් සේවක වැටුප්	1,140,567	841,189
අතිකාල දීමනා	12,162,623	11,550,489
ප්‍රසාද දීමනා ගෙවීම්	3,967,877	3,911,129
වෛද්‍ය ආධාර අරමුදලට දායකත්වය	48,000	48,000
සේවා නියුක්තයන්ගේ භාර අරමුදලට දායකත්වය	2,546,309	2,519,810
වෛද්‍ය නිවාඩු සඳහා ගෙවීම්	3,457,476	4,646,607
පාරිතෝෂික	3,712,753	(2,591,813)
වන්දි මුදල්		3,730,080
දුෂ්කර දීමනා - නොරොච්චෝලේ	1,404,200	1,506,988
කාර්යාල කුලී	20,373,750	19,558,800
මුද්‍රණය හා ලිපි ද්‍රව්‍ය	3,190,463	2,365,230
සාමාජිකත්ව දායකවීම්	2,610,962	1,303,510
රක්ෂණ	13,021,381	7,271,538
කාර්යාල පරිශ්‍රය හා උපකරණ නඩත්තුව	3,759,659	5,691,657
විදුලි බිල්පත් ගාස්තු - ප්‍රධාන කාර්යාලය	1,860,852	1,475,657
විදුලි බිල්පත් ගාස්තු - නිල නිවාස	106,449	71,734
කාර්ය මණ්ඩල ශුභ සාධන	7,661,234	5,624,230
ආරක්ෂක ගාස්තු	2,269,400	2,107,140
පරිගණක වියදම්	4,423,379	1,877,867
බංගලා නඩත්තුව - මෝදර		3,026
පරිවර්තන ගාස්තු	251,078	185,914
ජල පරිභෝජන බිල්පත් - ප්‍රධාන කාර්යාලය	180,000	180,000
ජල පරිභෝජන බිල්පත් - නිල නිවාස	157,567	69,234
දඩ මුදල් ගෙවීම්		7,080
පරිපාලන කටයුතු සඳහා SSCL වියදම්	142,616	
දුරකථන ගාස්තු බිල්පත්	2,191,353	2,686,601
තැපැල් හා විදුලි පණිවුඩ ගාස්තු	125,155	27,655
අන්තර්ජාල / විද්‍යුත් තැපැල් ගාස්තු	2,691,555	3,058,649
විදේශ ගමන් හා වියදම්		38,117
දේශීය ගමන්	357,182	3,946,217
මෝටර් වාහන නඩත්තු කිරීම	8,531,351	5,727,485
ගමන් බිමන් හා යැපීම් දිමනා	7,250	14,250
ඉන්ධන වියදම්	41,800	
සංග්‍රහ වියදම්	255,824	100,257
වාර්ෂික ලියාපදිංචි ගාස්තුව	35,000	41,000
අධ්‍යක්ෂකවරුන්ගේ ගාස්තු	488,500	596,050

	2023	**2022**
විගණන ගාස්තු	810,000	760,000
වෘත්තියවේදී හා නෛතික ගාස්තු	1,708,246	584,905
ටෙන්ඩර් කමිටු දීමනා හා වියදම්		1,332,200
විවිධ වියදම්	137,785	515,604
පරිත්‍යාග		62,500
සංවත්සර වියදම්		707,409
ක්ෂය වීම්	4,845,487	4,932,749
බැංකු ගාස්තු	6,253,749	27,775,207
අයිරා පොලී		1
මුද්දර බදු වියදම් ගිණුම	34,900	37,125
ජීවගණක උපකල්පන වෙනස්වීම මත ලාභය / (අලාභය)	2,179,262	7,581,992
එකතුව	246,344,628	263,944,537